# අ.පො.ස.(උ.පෙළ)විභාගය

## වර්ෂ 2019 සහ ඉන් පසුව පැවැත්වෙන විභාග සඳහා
## ප්‍රශ්න පත්‍ර ව්‍යූහය හා මූලාකෘති ප්‍රශ්න

## 4 වෙළුම

41 - බුද්ධ ධර්මය
43 - ක්‍රිස්තියානි ධර්මය
44 - ඉස්ලාම්
45 - බෞද්ධ ශිෂ්ටාචාරය
47 - ඉස්ලාම් ශිෂ්ටාචාරය
48 - ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය
49 - ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

Curriculum
Assessment & Evaluation
Teaching
Learning
NETS

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# අ.පො.ස.(උ.පෙළ) විභාගය

## වර්ෂ 2019 සහ ඉන් පසුව පැවැත්වෙන විභාග සඳහා
## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා මූලාකෘති ප්‍රශ්න

# 4 වෙළුම

41 - බුද්ධ ධර්මය
43 - ක්‍රිස්තියානි ධර්මය
44 - ඉස්ලාම්
45 - බෞද්ධ ශිෂ්ටාචාරය
47 - ඉස්ලාම් ශිෂ්ටාචාරය
48 - ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය
49 - ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

සියලු ම හිමිකම් ඇවිරිණි.

අ.පො.ස.(උ.පෙළ) විභාගය - වර්ෂ 2019 සහ ඉන් පසුව පැවැත්වෙන විභාග සඳහා
ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා මූලාකෘති ප්‍රශ්න
4 වෙළුම

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ප්‍රථම මුද්‍රණය - 2018

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**මූල්‍ය අනුග්‍රහය**

අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (ESDP) මගිනි.

# විභාග කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය

කිසියම් පාඨමාලාවකින් ලබාගත් දැනුම හා අවබෝධය මැනීමට විවිධ ක්‍රමවේද උපයෝගී කර ගැනෙයි. ඒ අතුරින් ලිඛිත විභාග වර්තමානයේ භාවිත වන වඩාත් ප්‍රචලිත ක්‍රමයයි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ සම්පිණ්ඩිත ඇගයීම් ක්‍රමවේදය අතර සම්බන්ධතාවක් එමගින් ගොඩනැගෙන බවත්, සාධන මට්ටම් තීරණය වන බවත් සැලකිල්ලට ගැනෙයි.

වසර 2017 දී 12 ශ්‍රේණිය සඳහා නව විෂය නිර්දේශ හඳුන්වා දෙනු ලැබී ය. එම සිසුන් අ.පො.ස.(උ.පෙළ) විභාගය සඳහා ප්‍රථම වතාවට පෙනී සිටිනුයේ 2019 වසරේ දී ය. එම සංශෝධිත විෂය නිර්දේශවලට අනුකූල ව 2019 සහ ඉන් පසුව පැවැත්වෙන අ.පො.ස.(උ.පෙළ) විභාග සඳහා පෙනී සිටින සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රශ්න පත්‍ර ව්‍යුහය සහ මූලාකෘති ප්‍රශ්න මෙහි ඇතුළත් කර ඇත.

අ.පො.ස.(උ.පෙළ) විෂය නිර්දේශ සංශෝධනය වීමත් සමග ඊට උචිත පරිදි ප්‍රශ්න පත්‍රවල ව්‍යුහයේ ද වෙනස්කම් සිදු කිරීමට ද අවශ්‍ය විය. ඒ අනුව විෂය කාණ්ඩ ගොනු කර, එක් එක් කාණ්ඩ තුළ ප්‍රශ්න පත්‍ර ව්‍යුහයේ අනන්‍යතාව රැක ගැනීමට උත්සාහ දරා ඇත. ඒ ඒ විෂයන්ට අදාළ විද්වත් කමිටු මගින් මෙම ව්‍යුහ තීරණය කරන ලද අතර, ඒ අනුව මූලාකෘති ප්‍රශ්න ද සකස් කෙරිණි.

අධ්‍යාපන මිනුම් සහ ඇගයුම් පිළිබඳ විශ්වාසය සහ අවධානය වැඩි වෙමින් පවතින යුගයක අ.පො.ස.(උ.පෙළ) මට්ටමේ දී එම ඇගයුම් කාර්යය කෙරෙන්නේ කෙසේ දැයි සියලු පාර්ශ්ව දැනුවත් කිරීම වැදගත් ය. අ.පො.ස.(උ.පෙළ) විභාගය ප්‍රධාන වශයෙන් සහතිකකරණය අරමුණු කරගත් සාධන පරීක්ෂණයකි. එහෙත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ වෙනත් ජාතික මෙන්ම ජාත්‍යන්තර උසස් අධ්‍යාපන ආයතන විසින් මෙම විභාගයේ ප්‍රතිඵල මත විශ්වවිද්‍යාලවලට සිසුන් තෝරා ගැනෙන නිසා මෙහි තේරීම් පරීක්ෂණයක ලක්ෂණ ද ගැබ්ව ඇත. එබැවින් මෙම කෘතියෙහි දැක්වෙන ප්‍රශ්න පත්‍ර ව්‍යුහ සහ මූලාකෘති, ප්‍රශ්න පරිශීලනය කිරීම මගින් සිසුන්ට මෙම විභාගයේ දී මුහුණ දීමට සිදුවන්නේ කුමන ආකාරයේ ඇගයීමකට ද යන්න පිළිබඳ ව මනා අවබෝධයක් ලබාගත හැකි ය. එම නිසා සිසුන් විභාගයට සූදානම් කිරීමේ දී පාසල්වල විදුහල්පතිවරුන්ට හා ගුරුවරුන්ටත් ඒ හා සම්බන්ධ මගපෙන්වන්නන්ටත් පාසල් ප්‍රජාවටත් මෙය මහෝපකාරී වනු ඇත.

මෙම උපදෙස් සංග්‍රහයෙහි I කොටසෙහි විභාගය සම්බන්ධ පොදු තොරතුරු ද, II කොටසෙහි ප්‍රශ්න පත්‍රවල ව්‍යුහ සහ ස්වභාවය ද ඇතුළත් වන අතර III කොටසෙහි එක් එක් විෂයය සඳහා මූලාකෘති ප්‍රශ්න ඇතුළත් වේ.

මෙහි ඇතුළත් ප්‍රශ්න පත්‍ර ව්‍යුහ හා මූලාකෘති ප්‍රශ්න සකස් කිරීමේ දී සහයෝගය දුන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු නිලධාරී මණ්ඩලයටත්, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු කාර්ය මණ්ඩලයටත්, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් ඇතුළු කාර්ය මණ්ඩලයටත්, සියලු ම විෂයන්හි පාලක පරීක්ෂකවරුන්ටත්, සම්පත් පුද්ගල මහත්ම මහත්මීන්ටත්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ, පර්යේෂණ හා සංවර්ධන ශාඛාවේ නිලධාරීන් හා කාර්ය මණ්ඩලයටත් මෙම කාර්ය සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වූ අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහනටත් (ESDP) මෙය මැනවින් මුද්‍රණය කර දුන් විශ්ව ග්‍රැෆික්ස් ආයතනයේ කාර්ය මණ්ඩලයටත් මාගේ හෘදයාංගම ස්තුතිය පුදකරමි.

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

2018.10.10
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | බී. සනත් පූජිත<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස් (පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය** | : | ජේ.ඒ.ජේ.ආර්. ජයකොඩි<br>නියෝජ්‍ය විභාග කොමසාරිස් |
| **සහය සම්බන්ධීකරණය** | : | කේ.ඒ.එච්. එච්. කුරුප්පු<br>සහකාර විභාග කොමසාරිස් |
| | | එල්.ජී.එස්. සමරකෝන්<br>සහකාර විභාග කොමසාරිස් |
| | | එන්.එන්. සූරියආරච්චි<br>සහකාර විභාග කොමසාරිස් |
| | | ඒ. ක්‍රිෂ්ණගෝපි<br>සහකාර විභාග කොමසාරිස් |
| | | පී. රුක්මල් මහේෂ් පෙරේරා<br>සහකාර විභාග කොමසාරිස් |
| | | එච්.ආර්. චන්දන කුමාර හේනායක<br>සහකාර විභාග කොමසාරිස් |
| | | කේ.එම්. ජයන්ත කුමාර<br>සහකාර විභාග කොමසාරිස් |
| **පරිගණක පිටු සැකසුම** | : | කේ.පී.ඩී.ඒ. මදුවන්ති දිසානායක<br>තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සහකාර |
| | | ඕ.එම්. දර්ශනී සෙව්වන්දි<br>දත්ත සටහන් ක්‍රියාකරු |
| | | ආර්.ඩී. ඉෂානි කෞෂල්‍යා<br>දත්ත සටහන් සහකාර |
| | | පී.එච්. ඉමාෂා රාජපක්‍ෂ<br>දත්ත සටහන් සහකාර |
| | | ඩී.ජී. චමේෂි වීරසිරි<br>දත්ත සටහන් සහකාර |
| **පිටකවරය නිර්මාණය** | : | එස්.එච්. සමන් කුමාර<br>කළමනාකරණ සහකාර |

# ඇතුළත පිටු

**පිටු අංකය**

I කොටස

විභාගය හා සම්බන්ධ පොදු තොරතුරු .................................................................... 1

II කොටස

ප්‍රශ්න පත්‍රවල ව්‍යුහය හා ස්වභාවය ...................................................................... 6

III කොටස

මූලාකෘති ප්‍රශ්න ..................................................................................................... 7

(41) බුද්ධ ධර්මය ........................................................................................ 9

(43) ක්‍රිස්තියානි ධර්මය ........................................................................................ 19

(44) ඉස්ලාම් ........................................................................................ 27

(45) බෞද්ධ ශිෂ්ටාචාරය ........................................................................................ 38

(47) ඉස්ලාම් ශිෂ්ටාචාරය ........................................................................................ 49

(48) ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය........................................................................................ 61

(49) ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය ........................................................................................ 64

ඇමුණුම 01 ........................................................................................ 75

ඇමුණුම 02 ........................................................................................ 98

ඇමුණුම 03 ........................................................................................ 102

# I කොටස
# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

## විභාගය හා සම්බන්ධ පොදු තොරතුරු

## 1. හැඳින්වීම

අ.පො.ස.(උ.පෙළ) විභාගය ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගයයි. මෙය ප්‍රධාන වශයෙන් සහතිකකරණ විභාගයක් වශයෙන් පැවැත්වුව ද විශ්වවිද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන ආයතනවලට සහ අධ්‍යාපන විද්‍යාපීඨවලට සුදුස්සන් තෝරා ගැනීමත් මෙම විභාගයේ ප්‍රතිඵල මත පදනම් ව සිදු කරන බැවින් මෙය තේරීමේ විභාගයක් වශයෙන් ද භාවිත වේ.

එසේම මධ්‍යම මට්ටමේ රැකියා ලබාගැනීම සඳහා ද මෙම විභාගයේ ප්‍රතිඵල මූලික සුදුසුකමක් වශයෙන් සැලකේ. වර්ෂ 2014 දක්වා අ.පො.ස.(උ.පෙළ) විභාගය 12 සහ 13 ශ්‍රේණිවල විෂය නිර්දේශ පදනම් කොටගෙන ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා, වාණිජ්‍යය හා කලා යන විෂය ධාරා හතර යටතේ පැවති අතර 2015 වසරේ සිට ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා, වාණිජ්‍යය, කලා, ඉංජිනේරු තාක්ෂණවේදය සහ ජෛවපද්ධති තාක්ෂණවේදය යන විෂය ධාරා යටතේ විභාගය පැවැත්වේ.

## 2 විභාගය සඳහා ඉල්ලුම් කිරීම

### 2.1 පාසල් අයදුම්කරුවෝ

විභාගයට අයදුම් කිරීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ පාසල් අයදුම්කරුවන්ගේ නම්, ඉල්ලුම් කරනු ලබන විෂය හා මාධ්‍යය යන තොරතුරු ද සමග විදුහල්පති විසින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. එහිදී අයදුම්කරුවන්ගේ නම උප්පැන්න සහතිකයේ තිබෙන ආකාරයට නිවැරදි ව සම්පූර්ණ කිරීමත් විෂයය, විෂය අංක හා මාධ්‍යය නිවැරදි ව සටහන් කිරීමත් පිළිබඳ ව දැඩි අවධානයක් යොමු කළ යුතු ය.

### 2.2 පෞද්ගලික අයදුම්කරුවෝ

පාසල පදනම් කරගත් නව තක්සේරුකරණ වැඩපිළිවෙළ යටතේ පන්ති කාමරය තුළ තක්සේරුකරණය සිදු කිරීම බාහිර අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ. අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/01/12/12/05/08/i හා 2017.10.31 දිනැති ලිපිය මගින් පෞද්ගලික අයදුම්කරුවන් එම අවශ්‍යතාවෙන් නිදහස් කර ඇත. (ඇමුණුම 03)

විභාග දෙපාර්තමේන්තුව විසින් පළකරනු ලබන පුවත්පත් දැන්වීමක් මගින් පෞද්ගලික අයදුම්කරුවන් සඳහා අයදුම්පත් කැඳවන අවස්ථාවේ දී එසේ ඉදිරිපත් වීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් නිසි පරිදි සම්පූර්ණ කළ අයදුම්පත්‍රයක් නියමිත විභාග ගාස්තු ගෙවා ලබාගත් රිසිට් පත්‍රය ද සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත පුවත්පත් දැන්වීමෙහි සඳහන් පරිදි නියමිත දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

## 3. විෂය තෝරා ගැනීම

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කොට ඇති අංක 2016/13 හා 2016.04.26 දිනැති **"අ.පො.ස.(උ.පෙළ) විෂය සංයෝජන හා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වූ විෂය සංයෝජන"** යන චක්‍රලේඛය (ඇමුණුම 01) අනුව මෙම විභාගයේ දී විෂයන් තෝරාගත යුතුය.

අ.පො.ස.(උ.පෙළ) සඳහා නව විෂය නිර්දේශ 2017 වසරේ 12 ශ්‍රේණිය සඳහා හඳුන්වා දුන් අතර, එම විෂය නිර්දේශ පදනම් කොටගෙන ප්‍රථම වතාවට අ.පො.ස. (උ.පෙළ) විභාගය පැවැත්වෙන්නේ 2019 වසරේ දී ය. ඉහත සඳහන් 2016/13 චක්‍රලේඛයේ අඩංගු විධිවිධාන අනුව ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා, වාණිජ්‍යය, කලා, ඉංජිනේරු තාක්ෂණවේදය හා ජෛව පද්ධති තාක්ෂණවේදය යන විෂය ධාරා සඳහා අදාළ විෂයයන් තෝරාගත යුතු ය.

අ.පො.ස.(උ.පෙළ) විභාගය සඳහා ප්‍රධාන විෂයයන් තුනකට පෙනී සිටිය යුතු අතර ඊට අමතරව විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කිරීමට බලාපොරොත්තු වන සිසුන් **"සාමාන්‍ය පොදු පරීක්ෂණය"** ප්‍රශ්න පත්‍රයෙන් ද සමත් විය යුතු ය. විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සළකා නොබැලුව ද **"සාමාන්‍ය ඉංග්‍රීසි"** ප්‍රශ්න පත්‍රයට ද සිසුන්ගේ අභිමතය පරිදි පෙනී සිටිය හැකිය.

**3.1 අ.පො.ස.(උ.පෙළ) විභාගය සඳහා අනුමත විෂය**

සියලුම විෂය ධාරා සඳහා ශිෂ්‍යයන් විසින් තෝරාගත යුතු විෂය සංයෝජන පිළිබඳ කොන්දේසි ඇමුණුම 01 හි ඇතුළත් අංක 2016/13 චක්‍රලේඛයෙහි සඳහන් වේ.

අ.පො.ස.(උ.පෙළ) විභාගය සඳහා අනුමත විෂය සහ විෂය අංක පහත දැක්වේ. විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ දී අදාළ විෂය අංක භාවිත කළ යුතු ය.

| | විෂයය | විෂයය අංකය | |
|---|---|---|---|
| (01) | භෞතික විද්‍යාව | 01 | |
| (02) | රසායන විද්‍යාව | 02 | |
| (03) | ගණිතය | 07 | |
| (04) | කෘෂි විද්‍යාව | 08 | |
| (05) | ජීව විද්‍යාව | 09 | |
| (06) | සංයුක්ත ගණිතය | 10 | |
| (07) | උසස් ගණිතය | 11 | |
| (08) | සාමාන්‍ය පොදු පරීක්ෂණය | 12 | |
| (09) | සාමාන්‍ය ඉංග්‍රීසි | 13 | |
| (10) | සිවිල් තාක්ෂණවේදය | 14 | |
| (11) | යාන්ත්‍රික තාක්ෂණවේදය | 15 | |
| (12) | විදුලිය, ඉලෙක්ට්‍රොනික සහ තොරතුරු තාක්ෂණවේදය | 16 | |
| (13) | ආහාර තාක්ෂණවේදය | 17 | |
| (14) | කෘෂි තාක්ෂණවේදය | 18 | |
| (15) | ජෛව සම්පත් තාක්ෂණවේදය | 19 | |
| (16) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 20 | |
| (17) | ආර්ථික විද්‍යාව | 21 | |
| (18) | භූගෝල විද්‍යාව | 22 | |
| (19) | දේශපාලන විද්‍යාව | 23 | |
| (20) | තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය | 24 | |
| (21) | ශ්‍රී ලංකා ඉතිහාසය | 25 | I පත්‍රය |
| (22) | ඉන්දීය ඉතිහාසය | 25A | II පත්‍රය |
| (23) | යුරෝපා ඉතිහාසය | 25B | |
| (24) | නූතන ලෝක ඉතිහාසය | 25C | |
| (25) | ගෘහ ආර්ථික විද්‍යාව | 28 | |
| (26) | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | 29 | |

| | | |
|---|---|---|
| (27) | ව්‍යාපාර සංඛ්‍යානය | 31 |
| (28) | ව්‍යාපාර අධ්‍යයනය | 32 |
| (29) | ගිණුම්කරණය | 33 |
| (30) | බුද්ධ ධර්මය | 41 |
| (31) | හින්දු ධර්මය | 42 |
| (32) | ක්‍රිස්තියානි ධර්මය | 43 |
| (33) | ඉස්ලාම් | 44 |
| (34) | බෞද්ධ ශිෂ්ටාචාරය | 45 |
| (35) | හින්දු ශිෂ්ටාචාරය | 46 |
| (36) | ඉස්ලාම් ශිෂ්ටාචාරය | 47 |
| (37) | ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | 48 |
| (38) | ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | 49 |
| (39) | චිත්‍ර කලාව | 51 |
| (40) | නර්තනය (දේශීය) | 52 |
| (41) | නර්තනය (භරත) | 53 |
| (42) | සංගීතය (පෙරදිග) | 54 |
| (43) | සංගීතය (කර්ණාටක) | 55 |
| (44) | සංගීතය (බටහිර) | 56 |
| (45) | නාට්‍ය හා රංග කලාව (සිංහල) | 57 |
| (46) | නාට්‍ය හා රංග කලාව (දෙමළ) | 58 |
| (47) | නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි) | 59 |
| (48) | ඉංජිනේරු තාක්ෂණවේදය | 65 |
| (49) | ජෛවපද්ධති තාක්ෂණවේදය | 66 |
| (50) | තාක්ෂණවේදය සඳහා විද්‍යාව | 67 |
| (51) | සිංහල | 71 |
| (52) | දෙමළ | 72 |
| (53) | ඉංග්‍රීසි | 73 |
| (54) | පාලි | 74 |
| (55) | සංස්කෘත | 75 |
| (56) | අරාබි | 78 |
| (57) | මැලේ | 79 |
| (58) | ප්‍රංශ | 81 |
| (59) | ජර්මන් | 82 |
| (60) | රුසියන් | 83 |
| (61) | හින්දි | 84 |
| (62) | චීන | 86 |
| (63) | ජපන් | 87 |

අ.පො.ස.(උ.පෙළ) විභාගය සඳහා උක්ත විෂයයන් අතුරෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති 2016/13 චක්‍රලේඛයට අනුව ප්‍රධාන විෂයයන් තුනක් තෝරාගත හැකිය. එම ප්‍රධාන විෂයයන්ට අමතරව මෙම විභාගයේ දී සාමාන්‍ය පොදු පරීක්ෂණය සහ සාමාන්‍ය ඉංග්‍රීසි යන විෂයයන් දෙක සඳහා ද ඉදිරිපත් විය යුතු ය.

*       **සාමාන්‍ය පොදු පරීක්ෂණය (12)**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයකට අභ්‍යන්තර ශිෂ්‍යයකු වශයෙන් ඇතුළත් වීම සඳහා මෙම විෂය සඳහා තීරණය කරනු ලබන අවම ලකුණු මට්ටමක් ලබා තිබීම අත්‍යවශ්‍ය වේ. එක් අවස්ථාවක දී මෙම් සුදුසුකම සපුරා තිබීම පසු අවස්ථාවක විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අදාළ කර ගත හැකිය. මෙම විෂය සඳහා ලබාගන්නා ලකුණු, Z ලකුණ ගණනය කිරීම සඳහා අදාළ කරගනු නොලැබේ.

*       **සාමාන්‍ය ඉංග්‍රීසි (13)**

මෙම විෂයය අ.පො.ස.(උ.පෙළ) ප්‍රධාන විෂයයක් නොවේ. සාමාන්‍ය ඉංග්‍රීසි සඳහා ලබා ගන්නා ලකුණු හෝ සාමාර්ථය හෝ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා උපයෝගී කරගනු නොලැබේ. එහෙත් මෙම විෂයය සඳහා ලබාගන්නා ප්‍රතිඵලය අ.පො.ස.(උ.පෙළ) විභාග සහතිකයේ වෙනම සටහන් කෙරේ.

## 4. ශ්‍රේණි තීරණය කිරීම

එක් එක් විෂයය සඳහා ලබාගන්නා දළ ලකුණු අනුව පහත සඳහන් ආකාරයට ශ්‍රේණි තීරණය කෙරේ.

| ලකුණු පරාසය | ශ්‍රේණිය |
|---|---|
| 75 - 100 | A - විශිෂ්ට සාමාර්ථය - (Distinction Pass) |
| 65 - 74 | B - අධිසම්මාන සාමාර්ථය - (Very Good Pass) |
| 50 - 64 | C - සම්මාන සාමාර්ථය - (Credit Pass) |
| 35 - 49 | S - සාමාන්‍ය සාමාර්ථය - (Ordinary Pass) |
| 00 - 34 | F - අසමත් - (Fail) |

## 5. පාසල පදනම් කරගත් තක්සේරුකරණය

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කොට ඇති අංක 23/2017 හා 2017.06.01 දිනැති "පාසල පදනම් කරගත් තක්සේරුකරණය 6 - 13 ශ්‍රේණි සඳහා වර්ෂ 2017 සහ ඉන් ඉදිරියට ක්‍රියාත්මක කිරීම" යන චක්‍රලේඛය (ඇමුණුම 02) අනුව මෙම වැඩපිළිවෙළ 2017 සිට පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වෙමින් පවතී.

### 5.1 අරමුණු

12 හා 13 ශ්‍රේණිවල ඉගෙනුම ලබන සිසුන්ගේ අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී මැනිය නොහැකි හැකියා, නිපුණතා ආදිය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදුකෙරෙන අතරතුර මැන බැලීමත් දුබලතා හා ප්‍රබලතා හඳුනාගෙන දුබලතා ඇති සිසුන් සිටිත් නම් ඒ සඳහා ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් මෙහි අරමුණ වේ. මෙම වැඩපිළිවෙළ යටතේ පන්ති කාමරයේදී ඉගෙනුම ලබන විෂයයන් සඳහා තක්සේරුකරණය සිදුකරනු ලබන අතර සිසුන් විසින් සිදු කරනු ලබන කණ්ඩායම් ව්‍යාපෘතිය ද තක්සේරුකරණයට භාජනය කෙරේ.

### 5.2 තක්සේරුකරණය සිදු කෙරෙන ආකාරය

5.2.1 පන්ති කාමරයේ ඉගෙනුම ලබන විෂයයන් සඳහා තක්සේරුකරණය

(අ) පන්ති කාමරයේ ඉගෙනුම ලබන සෑම විෂයයක් සඳහා ම වාරයකට එක් අවස්ථාවක් මගින් තක්සේරුකරණය සිදු කෙරේ.

(ආ) මෙහිදී පාසල පදනම් කරගත් තක්සේරුකරණය සඳහා හඳුන්වා දී ඇති ඉගෙනුම් - ඉගැන්වීම් තක්සේරුකරණ ප්‍රභේද භාවිත කළ යුතුය.

(ඇ) පන්ති කාමරයේ ඉගෙනුම ලබන සෑම විෂයයක් සඳහා ම වාරයකට තක්සේරුකරණ අවස්ථා එක බැගින් 12 ශ්‍රේණියේ වාර තුන සඳහා තක්සේරුකරණ අවස්ථා 03ක් ද, 13 ශ්‍රේණියේ 1 හා 2 වාර සඳහා තක්සේරුකරණ අවස්ථා 02ක් ද වශයෙන් අවුරුදු දෙක සඳහා තක්සේරුකරණ අවස්ථා 05 ක් සිදු කෙරේ.

(ඈ) මෙම තක්සේරුකරණ අවස්ථා 05 හි ලකුණු, 13 වන ශ්‍රේණියේ දෙවන වාරය අවසානයේ දී ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ගෙන්වා ගනු ලැබේ. මෙම ලකුණු අනුව තීරණය කරනු ලබන නිපුණතා මට්ටම් අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල ලේඛනයේ වෙනම තීරයක පහත සඳහන් ආකාරයට ඇතුළත් කෙරේ.

| පාසල පදනම් කරගත් තක්සේරුකරණ ලකුණු | නිපුණතා මට්ටම | |
|---|---|---|
| 9, 10 | විශිෂ්ට මට්ටමේ නිපුණතාව | - (Excellent Level Competency) |
| 8 | ඉහළ මට්ටමේ නිපුණතාව | - (High Level Competency) |
| 6, 7 | සම්මාන මට්ටමේ නිපුණතාව | - (Credit Level Competency) |
| 4, 5 | ආසන්න නිපුණතාව | - (Near Competency) |
| 1, 2, 3 | නිපුණතා මට්ටමට ළඟා නොවූ | - (Not reached the Competency Level) |

5.2.2 කණ්ඩායම් ව්‍යාපෘතිය මගින් තක්සේරුකරණය

පළමුවතාවට අ.පො.ස.(උ.පෙළ) හදාරණ සෑම සිසුවකුම කණ්ඩායම් ව්‍යාපෘතිය නිම කළ යුතු ය.

5.2.2.1 කණ්ඩායම් ව්‍යාපෘතිය

(අ) කණ්ඩායම් ව්‍යාපෘතිය සඳහා සිසුන් 6 සිට 10 දෙනකුගෙන් යුක්ත කණ්ඩායමක් පාසලේ අදාළ ගුරුභවතුන් විසින් නම් කළ යුතු ය.

(ආ) කණ්ඩායම් ව්‍යාපෘතිය සඳහා ද කණ්ඩායම මගින් සුදුසු මාතෘකාවක් ඉදිරිපත් කොට අනුමැතිය ලබාගත යුතු ය.

(ඇ) 12 ශ්‍රේණිය 3 වන වාරය සහ 13 ශ්‍රේණිය I වන වාරය ඇතුළත දී මෙම ව්‍යාපෘතියේ කටයුතු නිම කළ යුතු ය.

(ඈ) කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, විවිධ ආයතන හා පුද්ගලයින් සමග කටයුතු කිරීම සහ ක්ෂේත්‍රයේ කටයුතු පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීමට අවස්ථාව ලබාදීම මෙම ව්‍යාපෘතිය මගින් බලාපොරොත්තු වේ.

5.2.2.2 ව්‍යාපෘතිය තක්සේරුකරණය

(අ) නිර්ණායක 5ක් යටතේ ව්‍යාපෘතිය තක්සේරු කෙරෙන අතර ගුරුභවතුන් විසින් එක් එක් නිර්ණායකය අනුව සිසුන් කටයුතු කර ඇති ආකාරය අධ්‍යයනය කොට ලකුණු ලබා දීම සිදු කරනු ඇත.

(ආ) ව්‍යාපෘතිය සඳහා මුළු ලකුණු 20 ක් ලබා දෙන අතර එම ලකුණු විභාග දෙපාර්තමේන්තුවට ගෙන්වා ගෙන 10 ට පරිවර්තනය කරනු ලැබේ.

(ඇ) මෙම ව්‍යාපෘතියේ ලකුණු අනුව තීරණය කරනු ලබන නිපුණතා මට්ටම ද, 5.2.1 (ඈ) හි සඳහන් ආකෘතියට අනුව අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල ලේඛනයෙහි ඇතුළත් කෙරේ.

## II කොටස

### අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2019 සහ ඉන් පසුව පැවැත්වෙන විභාග සඳහා ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

| විෂය අංකය සහ විෂයය | | I පත්‍රය: කාලය (පැය) | I පත්‍රය: * ප්‍රශ්න ස්වභාවය | I පත්‍රය: වරණ සංඛ්‍යාව | I පත්‍රය: ප්‍රශ්න සංඛ්‍යාව | I පත්‍රය: පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව | II පත්‍රය: ** කාලය (පැය) | II පත්‍රය I කොටස: * ප්‍රශ්න ස්වභාවය | II පත්‍රය I කොටස: ප්‍රශ්න සංඛ්‍යාව | II පත්‍රය I කොටස: තෝරා ගෙන පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව | II පත්‍රය II කොටස: * ප්‍රශ්න ස්වභාවය | II පත්‍රය II කොටස: ප්‍රශ්න සංඛ්‍යාව | II පත්‍රය II කොටස: තෝරා ගෙන පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව | II පත්‍රය: පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (41) | බුද්ධ ධර්මය | 2 | 1 | 5 | 50 | 50 | 3 | 4 | 3 | 2/3 | 5 | 5 | 3/5 | 5/8 |
| (43) | ක්‍රිස්තියානි ධර්මය | 2 | 1 | 5 | 50 | 50 | 3 | 4 | 3 | 2/3 | 5 | 5 | 3/5 | 5/8 |
| (44) | ඉස්ලාම් | 2 | 1 | 5 | 50 | 50 | 3 | 4 | 3 | 2/3 | 5 | 5 | 3/5 | 5/8 |
| (45) | බෞද්ධ ශිෂ්ටාචාරය | 2 | 1 | 5 | 50 | 50 | 3 | 4 | 3 | 2/3 | 5 | 5 | 3/5 | 5/8 |
| (47) | ඉස්ලාම් ශිෂ්ටාචාරය | 2 | 1 | 5 | 50 | 50 | 3 | 4 | 3 | 2/3 | 5 | 5 | 3/5 | 5/8 |
| (48) | ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | 2 | 1 | 5 | 30 | 50 | 3 | 3,4 | •5 | 3/5 | 5 | •4 | 3/4 | 6/9 |
| | | | 2 | | 20 | | | | | | | | | |
| (49) | ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | 2 | 1 | 5 | 50 | 50 | 3 | 4 | 3 | 2/3 | 5 | 5 | 3/5 | 5/8 |

• 1 වන සහ 6 වන ප්‍රශ්නය අනිවාර්ය වේ.

*** ප්‍රශ්න ස්වභාවය**

1. බහුවරණ
2. වෙනත් වාස්තවික
3. ව්‍යුහගත
4. අර්ධ ව්‍යුහගත
5. රචනා
6. ප්‍රායෝගික

** ඉහත විෂයන්වල II පත්‍රය සඳහා පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්න කියවා පිළිතුරු ලියන ප්‍රශ්න තෝරා ගැනීම සඳහා පැය තුනට අමතරව විනාඩි **10ක** කාලයක් ලබා දෙනු ලැබේ.

# III කොටස
# මූලාකෘති ප්‍රශ්න

අ.පො.ස.(උ.පෙළ) විභාගය ද්විතීයික අධ්‍යාපනය අවසානයේ පැවැත්වෙන අවසාන සහතිකකරණ විභාගයයි. මෙම විභාගයේ ප්‍රතිඵල මත විශ්වවිද්‍යාල, වෙනත් උසස් අධ්‍යාපන ආයතන සහ අධ්‍යාපන විද්‍යාපීඨ වැනි ආයතනවලට සිසුන් තෝරා ගැනීම ද සිදු කෙරෙන බැවින් මෙහි තේරීමේ පරීක්ෂණයක ලක්ෂණ ද අඩංගු වේ.

ඒ අනුව අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ දී සාධන පරීක්ෂණයක තිබිය යුතු ලක්ෂණ කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු අතර, මෙහි ප්‍රතිඵල මත විශ්වවිද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතන සඳහා සිසුන් තේරීම ද සිදු කරන බැවින් ඒ පිළිබඳ ව ද අවධානය යොමු කර ඇත.

ඒ අනුව ශිෂ්‍ය සාධනය ඇගයීම සඳහා ලිඛිත විභාග ක්‍රමයේ දී ප්‍රධාන වශයෙන් ම රචනා පරීක්ෂණ සහ වාස්තවික (විෂය බද්ධ) පරීක්ෂණ භාවිත කෙරේ. රචනා ස්වරූපයේ පිළිතුරක දී පරීක්ෂකයාගේ පුද්ගල බද්ධතාව බලපාන අතර වාස්තවික ස්වභාවයේ ප්‍රශ්නයක් සඳහා එක් නිවැරදි පිළිතුරක් පමණක් තිබීම නිසා එය සම්පූර්ණයෙන් ම පුද්ගල බද්ධතාවෙන් තොර වේ. මෙම රචනා සහ වාස්තවික යන අන්ත දෙක අතරට ගැනෙන "ව්‍යුහගත කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න" කෙරෙහි වර්තමාන පරීක්ෂණ ක්ෂේත්‍රයේ වැඩි අවධානයක් යොමු වී තිබේ. ව්‍යුහගත ප්‍රශ්නයක් මගින් දිය යුතු පිළිතුරු, ප්‍රශ්නයෙන් කියවෙන යම් යම් සීමා තුළ දැඩි සේ පාලනය කෙරේ. ඒ අනුව පිළිතුරු පත් ලකුණු කිරීමේ දී පරීක්ෂකවරුන් අතරේ ලකුණු දීමේ සංගතතාව ආරක්ෂා කරගත හැකි වන නිසා වාස්තවික හා ව්‍යුහගත ස්වරූපයේ ප්‍රශ්නවලට පරීක්ෂණ ක්ෂේත්‍රයේ වැදගත් ස්ථානයක් හිමි වේ.

ඒ අනුව අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ දී ද අත්‍යවශ්‍ය අවස්ථාවලදී පමණක් රචනා ප්‍රශ්න භාවිත කෙරෙන අතර වාස්තවික වර්ගයේ ප්‍රශ්න සකස් කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරේ. එසේම අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ දී හුදෙක් ස්මරණය මත පමණක් නොරැඳී අවබෝධය, භාවිතය, විශ්ලේෂණය, සංශ්ලේෂණය සහ ඇගයීම වැනි ඉහළ මානසික හැකියා මැන බැලෙන ආකාරයේ ප්‍රශ්න සකස් කිරීම කෙරෙහි අවධානය යොමු වී ඇත. හැකිතාක් දුරට ප්‍රායෝගික සිද්ධිවලට අදාළ ව ප්‍රශ්න සකස් කෙරෙන අතර එහිදී යමක් පැහැදිලි ව තේරුම් ගැනීම, උගත් මූලධර්ම වෙනත් සමාන අවස්ථාවක දී යොදා ගැනීම, ගැටලු විසඳීම, තර්කනය, නව යෝජනා/සැලසුම් ඉදිරිපත් කිරීම, කරුණු සංසන්දනය කිරීම, භාෂාව මැනවින් භාවිත කිරීම සහ අදහස් පැහැදිලි ව ඉදිරිපත් කිරීම ආදී හැකියා සිසුන් තුළ කොතෙක් දුරට වර්ධනය වී ඇත්දැයි මැන බැලෙන ආකාරයට එම ප්‍රශ්න සකස් කෙරෙනු ඇත.

මෙම III වන කොටසෙහි, ප්‍රශ්න පත්‍ර ව්‍යුහය සහ ලකුණු පිරිනැමෙන ආකාරය සමග මූලාකෘති ප්‍රශ්න ඇතුළත් කර ඇති අතර **ඒවා ආදර්ශ ප්‍රශ්න පත්‍ර නොවේ**. එබැවින් ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ දී ප්‍රශ්නවල අන්තර්ගත **අනුකොටස් සංඛ්‍යාව** සහ **ලකුණු බර තැබෙන ආකාරය** ප්‍රශ්න සකස් කිරීම සඳහා පදනම් කර ගැනෙන විෂය කොටස් අනුව අවස්ථානුකූල ව **වෙනස් විය හැකිය.**

මෙහි සඳහන් මූලාකෘති ප්‍රශ්නවලට අමතරව වාස්තවික සහ රචනා පරීක්ෂණ සඳහා භාවිත කෙරෙන, **8 වන පිටුවෙහි සඳහන් සියලු ම ප්‍රශ්න වර්ග ඇතුළු ව වෙනත් ප්‍රශ්න වර්ග ද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ප්‍රශ්න පත්‍රවලට අවස්ථානුකූල ව ඇතුළත් කිරීමේ අයිතිය විභාග කොමසාරිස් ජනරාල් සතු ය.**

වාස්තවික/විෂය බද්ධ පරීක්ෂණ (Objective Tests)

- සැපයීමේ වර්ගය (Supply Type)
- තේරීමේ වර්ගය (Selection Type)
  - ඇඳීමේ වර්ගය (Matching Type)
  - දෙවරණ වර්ගය (Alternative Type)
  - බහුවරණ වර්ගය (MCQ Type)
    - ප්‍රශ්න වර්ගය (Question Type)
    - අසම්පූර්ණ ප්‍රකාශන වර්ගය (Incomplete Statement Type)
    - ප්‍රතිෂේධාත්මක වර්ගය (Negative Type)
    - සම්බන්ධීවරණ වර්ගය (Combined Response Type)
    - හොඳම පිළිතුරු වර්ගය (Best Answer Type)
    - බහු පිළිතුරු වර්ගය (Multiple Response Type)
    - පොදු පිළිතුරු වර්ගය (Common Response Type)
    - ආදේශ වර්ගය (Substitution Type)
    - යුගල වගන්ති වර්ගය (Double Statement Type)
    - ප්‍රකාශය හා හේතුව වර්ගය (Assertion & Reason Type)

**රචනා පරීක්ෂණ (Essay Tests)**

- **රචනා වර්ගයේ ප්‍රශ්න (Essay Type Questions)**
  - විවෘත ප්‍රතිචාර වර්ගය (Open Response Type)
  - ඇවුරු ප්‍රතිචාර වර්ගය (Controlled Response Type)
- **ව්‍යුහගත රචනා ප්‍රශ්න (Structured Essay Type Questions)**
  - ආකෘතිය මගින් ව්‍යුහගත කිරීම (Structuring by using subsections)
  - සැපයෙන තොරතුරු මගින් ව්‍යුහගත කිරීම (Structuring by information provided)
  - කාර්යය මගින් ව්‍යුහගත කිරීම (Structuring by function)

# (41) බුද්ධ ධර්මය

## ප්‍රශ්න පත්‍ර ව්‍යූහය

**I පත්‍රය -** **කාලය : පැය 02යි.**

වරණ **5** බැගින් වූ බහුවරණ ප්‍රශ්න **50කි.** ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතුය.
එක් ප්‍රශ්නයකට ලකුණු **01** බැගින් **මුළු ලකුණු 50කි.**

**II පත්‍රය -** **කාලය : පැය 03යි.** (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10 යි.)

මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත වේ.

I කොටස - අර්ධ ව්‍යූහගත ප්‍රශ්න **තුනකි.** ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40කි.

II කොටස - රචනා වර්ගයේ ප්‍රශ්න **පහකි.** ප්‍රශ්න **තුනකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 60කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු = 40 + 60 = 100

| | | | |
|---|---|---|---|
| අවසාන ලකුණ ගණනය කිරීම : | I පත්‍රය | = | 50 |
| | II පත්‍රය | = | 100 ÷ 2 = 50 |
| | අවසාන ලකුණ | = | 100 |

### I පත්‍රය

**සැලකිය යුතුයි :**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* **නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න. (විභාගයේ දී පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ.)

---

**1.** අප පාසලේ බෞද්ධ සමිතියේ සංවත්සර උත්සවයේ දී ආරම්භක දේශනය පැවැත් වූ විදුහල්පතිතුමා දරුවන්ගේ චරිත සංවර්ධනයට සුගත බුදු ගුණය ආදර්ශයට ගතහැකි යැයි ප්‍රකාශ කළේ ය. එතුමන් විසින් පෙන්වා දුන් පරිදි එම බුදු ගුණයේ සුවිශේෂ අර්ථ රැසකි. ඉන් එකක් නම්,

(1) නිවැරදි ක්‍රියාව නිවැරදි අන්දමින් කිරීම යි.
(2) සුදුසු අය සුදුසු ලෙස ඇසුරු කිරීම යි.
(3) නිසිමග නිසිලෙස ගමන් කිරීම යි.
(4) සුදුසු තැන්හි ප්‍රිය වචන කතා කිරීම යි.
(5) යහපත් සිතුවිලි වැඩි දියුණු කිරීම යි.

**2.** උක්කට්ඨා හා සේතව්‍යා යන දෙනුවර අතර දී හමු වූ ද්‍රෝණ නම් බ්‍රාහ්මණයා ඇසූ ප්‍රශ්නවලට බුදුරජාණන් වහන්සේ දුන් පිළිතුරු බෞද්ධ මූලාශ්‍රයන්හි හමුවේ. ඉන් එක් පිළිතුරක් වන්නේ,

(1) මම මනුෂ්‍යයෙක් නොවෙමි යන්න ය.
(2) මම අසමසම වෙමි යන්න ය.
(3) මම ආශ්චර්යවත් උතුමෙකු වෙමි යන්න ය.
(4) මට ආචාර්යවරයෙකු නැත යන්න ය.
(5) මම අනන්තජින වෙමි යන්න ය.

**3.** බුදුරජාණන් වහන්සේ විසින් ශ්‍රාවකයන්ට දහම් දෙසන ලද්දේ සරල තැනින් ගැඹුරු තැනට සවන් යොමු කරවමින් බව පෙළ දහම පෙන්වා දෙයි. බුද්ධ දේශනාව තුළින් ප්‍රකට වන මෙම ලක්ෂණය හැඳින්විය හැක්කේ,

(1) සප්පරියාය දේශනා යනුවෙනි.
(2) විභජ්ජා ව්‍යාකරණීය යනුවෙනි.
(3) ආනුපුබ්බී කථා යනුවෙනි.
(4) පුච්ඡාවසික දේශනා යනුවෙනි.
(5) නීතත්‍ථ දේශනා යනුවෙනි.

4. ශ්‍රාවක මහරහතන් වහන්සේලා තුළ එලෙසින් ම දක්නට නොමැති, බුදුරජාණන් වහන්සේට පමණක් සුවිශේෂී වූ ශරීර ලක්ෂණ දෙතිසකි. ඉන් එක් ලක්ෂණයක් වන්නේ,

(1) සම වූ වට වූ ගෙල ඇති බව ය. (2) නෙරාගිය විළුඹක් නැති බව ය.
(3) සිරස්පතක් ඇති බව ය. (4) එකසමාන දත් දෙතිසක් ඇති බව ය.
(5) මුවෙකුට සමාන හකු දෙකක් ඇති බව ය.

5. ලිච්ඡවීපුත්‍ර සුනක්ඛත්ත විසින් බුදුරජාණන් වහන්සේට මනුෂ්‍ය ධර්මය ඉක්ම වූ ආර්යභාවය පිණිස වූ ඥාන විශේෂයක් නැතැයි චෝදනා කළ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ සතුව ඇති සුවිශේෂ ඥාණාධිගමයන් පිළිබඳ පැහැදිලි කරමින් පැවැත් වූ සූත්‍ර දේශනාව නම්,

(1) මහාසීහනාද සූත්‍රය යි. (2) කාලාම සූත්‍රය යි. (3) ධම්මචක්කපවත්තන සූත්‍රය යි.
(4) වීමංසක සූත්‍රය යි. (5) අච්ඡරියබ්භුත සූත්‍රය යි.

6. ප්‍රථම ධර්ම සංගායනාවේ දී බුද්ධ භාෂිත ශ්‍රී සද්ධර්මය නිකාය වශයෙන් පහකට බෙදන ලදී. එම ගොණු කිරීම අද දක්වා ම භාවිතය තුළ දැකගත හැකි ය. එයින් ඛුද්දක නිකාය කොටස් පහළොවකින් යුක්ත යැයි පිළිගැනේ. ඉන් එක් කොටසක් වන්නේ,

(1) පෙටකෝපදේශය යි. (2) නෙත්තිප්පකරණය යි. (3) උදානපාළිය යි.
(4) විසුද්ධිමාර්ගය යි. (5) මිළින්දපඤ්හය යි.

7. ''ධර්ම රත්නයේ ගුණ'' යන මැයෙන් විශේෂ ධර්ම සාකච්ඡාවක්, මැදින් පොහොය දින අප විහාරස්ථානයේදී සිදු කෙරුණි. එහි දී සන්දිට්ඨික යන්නෙහි අර්ථය, සාකච්ඡාවට සහභාගී වූ උපාසක උපාසිකාවෝ විවිධාකාරයෙන් ප්‍රකාශ කළහ. ඒ අතරින් නිවැරදි වන්නේ,

(1) දෘෂ්ටියක් වශයෙන් නො ගැනීම යන්න යි.
(2) යහපත් වූ දැක්මක් ඉදිරිපත් කිරීම යන්න යි.
(3) රාග ද්වේශාදී කෙලෙස් තමා තුළ ඇති නැති බව දැනගත හැකි වීම යන්න යි.
(4) තම තමාගේ දෘෂ්ටිය තුළින් දැන ගත යුතු වීම යන්න යි.
(5) බුද්ධාදී සියලු උතුමන්ගේ මග පෙන්වීම යන්න යි.

8. ලෝකයේ බොහෝ ආගම් සහ දර්ශනවාද අවිනශ්වර ආත්ම පදාර්ථයක් ඇති බව පිළිගන්නා අතර බුදුදහම අනාත්මවාදී ඉගැන්වීමකි. ඒ බව තහවුරු කෙරෙන ප්‍රකාශය වන්නේ,

(1) භවගාමී ආත්ම පදාර්ථයක් ඇත යන්න යි. (2) මරණයෙන් සියල්ල කෙළවර වේ යන්න යි.
(3) ආත්මය නූපදී. නො මැරේ යන්න යි. (4) ආත්මය සදාකාලික ය යන්න යි.
(5) ආත්මීය වශයෙන් ගත හැකි කිසිවක් නො මැත යන්න යි.

9. බුදුදහම න්‍යායාත්මක හෙවත් සිද්ධාන්තමය වශයෙන් මධ්‍යස්ථ ය. එසේ වන්නේ ශාස්වත, අශාස්වත යන උභයාන්තයට නො වැටෙන බැවිනි. බුදුදහම ප්‍රායෝගික, ප්‍රතිපදාමය වශයෙන් ද මධ්‍යස්ථ ය. එසේ වන්නේ කාමසුඛල්ලිකානුයෝගය, අත්තකිලමථානුයෝගය යන අන්ත දෙකට ම නොවැටෙන බැවිනි. ඒ අනුව මධ්‍යම දේශනාව නම්,

(1) ස්කන්ධ විභාගය යි. (2) ත්‍රිලක්ෂණ සිද්ධාන්තය යි. (3) අටළොස් ධාතු විභාගය යි.
(4) නාමරූප විභාගය යි. (5) පටිච්චසමුප්පාදය යි.

10. බුදු දහම එදිනෙදා දිවිපැවැත්මට අදාළ වන ආකාරය පිළිබඳ ධර්ම සාකච්ඡාවක් එක්තරා ජනමාධ්‍යයක් මඟින් මෑතක දී ප්‍රචාරය කෙරුණි. එහි දී ප්‍රකාශ වූ කරුණු අතුරින් නිවැරදි වූයේ,

(1) බුදු දහම නිවන පමණක් අරමුණු කරගත් දහමකි යන්න ය.
(2) තමාගේ දියුණුවත් අනෙකාගේ දියුණුවත් අවධාරණය කරන දහමකි යන්න ය.
(3) ආත්මාර්ථකාමිත්වය බරපතල වරදකි යන්න ය.
(4) ගෘහ ජීවිතයේ පැවැත්ම උදෙසා මඟපෙන්වීමක් බුදු දහමෙහි දක්නට නොලැබෙ යි යන්න ය.
(5) ජීවිතයක සාර්ථකත්වයට අදාළ වන්නේ ආර්ථික සමෘද්ධිය පමණි යන්න ය.

11. ශ්‍රමණ සම්ප්‍රදායට අයත් ගුරුකුලයක් වන ආජීවකයන් පිළිබඳ විශේෂ දේශනයක් පසුගිය පොහෝදා බුද්ධ ධර්මය විෂයභාර ස්වාමීන් වහන්සේ විසින් අප පාසලේ දී පවත්වන ලදී. එහි දී ''ආජීවකොති නග්ග සමනකො'' යන අටුවා පාඨය ද ඉදිරිපත් කෙරිණි. එයින් අදහස් වන්නේ,

(1) දැඩි ව්‍රත අනුගමනය කළ පිරිසක් වූ බව ය.
(2) වනගත ව ජීවත් වූ බව ය.
(3) සංචාරක ජීවිතයක් ගත කළ බව ය.
(4) නිර්වස්ත්‍ර පැවිද්දන් වූ බව ය.
(5) ආජීවකයන් හිසකෙස් උදුරා දමා පැවිදි වූ පිරිසක් බව ය.

12. අප පිරිවෙනේ සාහිත්‍ය සමිතියේ දී අතුරු කාතාවක් පැවැත් වූ නන්ද පොඩි හාමුදුරුවන් වහන්සේගේ මාතෘකාව වූයේ ''භික්ෂුණී සමාජයේ ආරම්භය'' යන්න යි. උන් වහන්සේ විසින් ඉදිරිපත් කළ එක් කරුණක් නිවැරදි නො වීය. එම කරුණ නම්,

(1) බෞද්ධ භික්ෂුණී සමාජයේ ආරම්භය සමගින් කාන්තාවන්ට සාධාරණයක් ඉටු විය යන්න යි.
(2) විශේෂ හේතු මත භික්ෂුණීන්ගේ පැවිද්ද පිළිබඳ බුදුරජාණන් වහන්සේ එතරම් උනන්දු නො වූහ.
(3) බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ට මෙන් ම භික්ෂුණීන්ට ද විනය නීති 227 පැනවූහ.
(4) කාන්තාවන්ට පැවිද්ද ලබාදීමේ දී අෂ්ටගරු ධර්ම පනවන ලදී.
(5) බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ට මෙන් ම භික්ෂුණීන්ට ද තනතුරු ප්‍රදානය කළහ.

13. තාපස, ජටිල, නිගණ්ඨ, සචේලක, අචේලක ආදී වශයෙන් බුද්ධ කාලීනව විවිධ ශ්‍රමණ ගුරුකුලවලට අයත් පැවිද්දන් සිටි බව මූලාශ්‍රයවල සඳහන් වේ. විවිධ ව්‍රත අනුගමනය කරමින් සංචාරයෙහි යෙදුණු මෙම පැවිදි කණ්ඩායම්වල පොදු ලක්ෂණයක් වන්නේ,

(1) නිත්‍යාත්මයක් පිළිගැනීම ය.
(2) ස්ථිර වාසස්ථාන තිබීම ය.
(3) ශ්‍රැතමය ඥාණය අගය කිරීම ය.
(4) ඊශ්වර නිර්මාණවාදය පිළිනොගැනීම ය.
(5) වර්ෂා ඍතුවේ දී පිණ්ඩපාතය ලබා නොගැනීම ය.

14. සාමණේර භික්ෂූන් අධිශීලයෙහි පිහිටුවීම උපසම්පදා විනය කර්මය ලෙස හැඳින්වේ. ඊට අදාළ ක්‍රම අටක් මහාවග්ගපාළියෙහි දැක්වේ. එයින් භික්ෂු භික්ෂුණී උභතො සංඝයා ඉදිරියේ සිදුකරනු ලබන උපසම්පදා විනය කර්මය හඳුන්වනු ලබන්නේ,

(1) අට්ඨවාචික උපසම්පදාව නමිනි.
(2) ඤත්තිචතුත්ථකම්ම උපසම්පදාව නමිනි.
(3) පඤ්හබ්‍යාකරණ උපසම්පදාව නමිනි.
(4) දූතේන උපසම්පදාව නමිනි.
(5) අට්ඨගරුධම්ම පටිග්ගහන උපසම්පදාව නමිනි.

15. විනය මහාවග්ගපාළිය අනුව උපසපන් භික්ෂුවක විසින් පිළිපැදිය යුතු නිස්සය ධර්ම හතරකි. භික්ෂු ජීවිතයට අදාළ අපිස් පැවැත්ම අර්ථවත් කරන ආකල්ප එයින් ඉගැන් වේ. නිස්සය යන්නෙහි වචනාර්ථය වන්නේ,

(1) පැවිද්දා වෘක්ෂ මූලික විය යුතු ය යන්න යි.
(2) පැවිද්දා පාංශකුලික විය යුතු ය යන්න යි.
(3) පැවිද්ද පූතිමුත්තභෙසජ්ජ උදෙසා ය යන්න යි.
(4) නිසි පැවතුම් ඇසුරු කිරීම ය යන්න යි.
(5) පැවිද්දා විසින් ධර්මය දායාදය කොටගත යුතු ය යන්න යි.

16. ප්‍රථමාභිසම්බෝධි යුගයේ භික්ෂූන් අතර ශ්‍රමණ සාරූප්‍ය නො වන ක්‍රියා ප්‍රකට වූ නමුදු බුදුරජාණන් වහන්සේ නීති නො පැන වූහ. එකල ධර්මය යටතේ සංග්‍රහ වී ඇති අනුශාසනා පමණක් ප්‍රමාණවත් වූ බව සූත්‍රාන්තන්හි සඳහන් වේ. ඊට අමතරව භික්ෂූන්ගේ ශික්ෂණය හා සමගිය සඳහා උපකාරී වූයේ,

(1) භික්ෂු ප්‍රාතිමෝක්ෂය ය.
(2) භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය ය.
(3) සතර කමටහන් ය.
(4) ඕවාද ප්‍රාතිමෝක්ෂය ය.
(5) සතර සංග්‍රහ වස්තුව ය.

**17.** අප විහාරස්ථානයේ පවත්වාගෙන යන විශාඛා කුළඟන සමිතිය විසින් පසුගිය වසරේ වස් ආරාධනා කිරීමට පෙර වස්විසීම පිළිබඳ සාකච්ඡාවක් පවත් වන ලදී. එහි දී විවිධ අදහස් පළ වූ අතර ඉන් වැරදි මතයක් වූයේ,

(1) වස්විසීමට අනුදැනීමෙන් භික්ෂු ජීවිතයට පහසුවක් ඇති විය.

(2) පෙරවස් හා පසුවස් යනුවෙන් වස් එළඹීම් දෙයාකාර ය.

(3) වස් සමාදන් වූ භික්ෂුවක් කවර හේතුවක් නිසා හෝ එම ස්ථානයෙන් බැහැර නොවිය යුතු ය.

(4) එම කාලය තුළ වස් නො වැස චාරිකාවේ යෙදෙන භික්ෂුවට දුකුළා ඇවත් සිදු වේ.

(5) වස් එළඹෙන දිනයෙහි ආවාසයෙක සිටින සෑම උපසපන් භික්ෂුවක් ම වස් සමාදන් විය යුතු ය.

**18.** හීන වූ, ග්‍රාම්‍ය වූ, පුහුදුන් ස්වභාවයෙන් යුක්ත වූ, අනාර්ය වූ, අවැඩ පිණිස පවතින්නා වූ කාමසුඛල්ලිකානුයෝගයත්, දුක් වූ, අනාර්ය වූ, අනර්ථය පිණිස පවතින්නා වූ අත්තකිලමථානුයෝගයත් යන අන්ත දෙකෙන් මිදී මධ්‍යම ප්‍රතිපදාව නම් වූ ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි ගමන් කරන බැවින් ශ්‍රාවක සංඝයා,

(1) සුපටිපන්න නම් වේ.

(2) උජුපටිපන්න නම් වේ.

(3) ඤායපටිපන්න නම් වේ.

(4) සාමීචිපටිපන්න නම් වේ.

(5) දක්ඛිණෙය්‍ය නම් වේ.

**19.** බ්‍රාහ්මණ ඉගැන්වීම්වලට අයත් වර්ණධර්ම න්‍යායට අදාළව මිනිසුන් උස් පහත් වශයෙන් වර්ග කෙරේ. උසස් ම වර්ණය වන බමුණන්ට පමණක් සීමා වූ අනෙක් වර්ණයන්ට හිමි නොවූ වරප්‍රසාදයක් ලෙස සැලකිය හැක්කේ,

(1) දන් දීම ය. (2) දන් පිළිගැනීම ය. (3) අධ්‍යාපනය ලැබීම ය.

(4) යාග කරවීම ය. (5) ජටා ඇරීම ය.

**20.** වෛදික බ්‍රාහ්මණයන් විසින් ඉදිරිපත් කරන ලද ආශ්‍රම ධර්ම අනුව ශුද්‍ර වර්ණය හැර ඉතිරි උසස් වර්ණ තුනට අයත් පුද්ගලයන්ගේ ජීවිතය අවස්ථා හතරකට බෙදා වෙන් කරන ලදී. ඒ අනුව ජීවිතයේ තෙවැනි අවධිය වෙන් වන්නේ,

(1) හුදකලාව අර්ධ වශයෙන් තවුස් පැවැත්ම පුරුණු කිරීම පිණිස ය.

(2) අඹු දරුවන් පෝෂණය කරමින් පස්කම් සුව විඳීමට ය.

(3) කුමර කුමරි බඹසර රකිමින් අධ්‍යාපනය ලැබීමට ය.

(4) අනගාරිකව සපුරා නිශ්කාමී ජීවිතයක් ගත කිරීමට ය.

(5) තමා උගත් දේ අන්‍යයන්ට ඉගැන්වීමට ය.

**21.** වෛදික බ්‍රාහ්මණයන්ගේ මූලික නීති සංග්‍රහය වන මනුස්මෘතියට අනුව කිසිදු අවස්ථාවක ස්වාධීනව ක්‍රියා කිරීමේ අයිතිය කාන්තාවන්ට නො දිය යුතු ය. ඇය සිය ජීවිතයේ විවිධ අවධි ගත කළ යුත්තේ පුරුෂයාගේ රැකවරණය යටතේ ය. අවිවාහක තරුණියක් විසිය යුත්තේ,

(1) බාල සහෝදරයාගේ වසඟයෙහි ය.

(2) වැඩිමහල් සහෝදරයාගේ ආධිපත්‍යය තුළ ය.

(3) පියාගේ වසඟයෙහි ය.

(4) ගුරුවරයාගේ රැකවරණය යටතේ ය.

(5) පවුලේ පිරිමි සාමාජිකයන්ගේ රැකවරණය යටතේ ය.

**22.** බුද්ධ කාලීන භාරතයෙහි ප්‍රකට ශාස්තෘවරුන් සදෙනෙක් සිටි බවත්, ඔවුන් තම තමන් පිළිගත් වාදාන්තරයන් ප්‍රකාශ කළ බවත්, පිරිස් පිරිවරාගෙන ගුරුකුල වශයෙන් සාධු සම්මතව විසූ බවත්, සඳහන් වේ. ඔවුන් අතර සප්තපදාර්ථවාදය මෙන්ම අකිරියවාදය ද ඉගැන්වූ ශාස්තෘවරයා වූයේ,

(1) නිගණ්ඨනාතපුත්ත ය. (2) පකුධකච්චායන ය. (3) අජිතකේශකම්බල ය.

(4) මක්ඛලීගෝසාල ය. (5) සංජය බෙල්ලට්ඨපුත්ත ය.

**23.** කර්මය හා එහි ප්‍රතිවිපාක පිළිබඳ ඉගැන්වීම් කිරියවාද හා අකිරියවාද යනුවෙන් දෙකකට බෙදේ. ෂට්ශාස්තෘවරුන්ගේ ඉගැන්වීම් අතර කිරියවාදී ඉගැන්වීම් ඉදිරිපත් කරන ලද්දේ නිගණ්ඨනාතපුත්ත තුමා විසින් පමණි. එම ඉගැන්වීම අර්ථවත් කරන පාඨය වන්නේ,

(1) කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පනතතාය.
(2) අඤ්ඤො කරොති - අඤ්ඤො පටිසංවේදෙති.
(3) නත්ථි සුකට දුක්කටානං කම්මානං ඵලං විපාකො.
(4) සබ්බං පුබ්බේකත හේතු.
(5) චේතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා.

**24.** භාරතීය ශ්‍රමණ බ්‍රාහ්මණයන් අතුරෙන් සමහරෙක් මරණින් මතු උපතක් හා සාංසාරික පැවැත්මක් පිළිගත්හ. මියගිය තැනැත්තා ම නැවත උපදී යැයි ඔවුහු ඉගැන් වූහ. එය බුදු දහමට එකඟ **නො වන්නේ,**

(1) අධිච්චසමුප්පන්න දෘෂ්ටියට ඇතුළත් වන නිසා ය.
(2) සංශය වාදයක් වන නිසා ය.
(3) උච්ඡේද දෘෂ්ටියට ඇතුළත් වන නිසා ය.
(4) කර්ම නියතියක් ප්‍රකට වන නිසා ය.
(5) ආත්මවාදී සංකල්පයක් වන නිසා ය.

**25.** අප දහම් පාසලේ ධර්මාචාර්ය පන්තිභාර ගුරුහිමියෝ ''ෂට්ශාස්තෘවරුන්ගේ ඉගැන්වීම් පිළිබඳ වාක්‍ය පහක් ලියා දක්වන්න''යි ශිෂ්‍යයන්ට පැවරුමක් දුන්හ. එහි දී එක් සිසුවෙකු විසින් ලියා දක්වන ලද වාක්‍ය පහෙන් නිවැරදි වූයේ එකක් පමණි. එනම්,

(1) අජිතකේශකම්බලගේ ඉගැන්වීම් ශාස්වතවාදයට ඇතුළත් වේ.
(2) සංජය බෙල්ලට්ඨපුත්ත කිරියවාදියෙකි.
(3) පූර්ණ කාශ්‍යප කර්මය හා ඵලය පිළිගත්තේ ය.
(4) මක්ඛලීගෝසාල නියතිවාදියෙකි.
(5) නිගණ්ඨනාතපුත්ත උච්ඡේදවාදියෙකි.

**26.** ''සමාජ ප්‍රභවය හා විකාශය කෙරෙහි එක් සාධකයක් පමණක් හේතු වී ඇත'' යන අදහස ද ''කිසිදු සාධකයක් ඊට බලපා නැත.'' යන අදහස ද ''සියල්ලට ම හේතු වූයේ පූර්ව කර්ම නියතිය ය'' යන අදහස ද භාරතීය ආගමික ඉගැන්වීම් අතර ප්‍රකට ව පැවතිණ. මේ අතර සමාජ ප්‍රභවය හා විකාශය කෙරෙහි බහුවිධ හේතු සාධක බලපා ඇතැයි පෙන්වා දෙන්නේ,

(1) බ්‍රාහ්මණ දහම යි. (2) හින්දු දහම යි. (3) ජෛන දහම යි.
(4) බුදු දහම යි. (5) ආජීවක දහම යි.

**27.** ප්‍රථම ධර්ම සංගායනාවේ දී ධර්ම විනයෙහි ආරක්ෂාවට යම් යම් පියවර ගන්නා ලදී. එහි දී ධර්ම විනය කොටස්වලට බෙදා එක් එක් භික්ෂු පරම්පරාවන්ට වගකීම් පවරා භාණක ක්‍රමය යටතේ පවත්වාගෙන යාමට කටයුතු කෙරිණ. දීඝ නිකාය භාර කරන ලද්දේ,

(1) ආනන්ද හිමියන් ඇතුළු ශිෂ්‍ය පිරිසට ය. (2) අනුරුද්ධ හිමියන් ඇතුළු ශිෂ්‍ය පිරිසට ය.
(3) මහා කාශ්‍යප හිමියන් ඇතුළු ශිෂ්‍ය පිරිසට ය. (4) මුගලන් හිමියන් ඇතුළු ශිෂ්‍ය පිරිසට ය.
(5) සැරියුත් හිමියන් ඇතුළු ශිෂ්‍ය පිරිසට ය.

**28.** ථෙරීය සංගායනා පැවැත්වීමට අවශ්‍ය පසුබිම ශාසනය තුළින් ම පැන නැගුණ බව මූලාශ්‍රය තුළින් තහවුරු වේ. එම ධර්ම සංගායනා පිළිබඳ තොරතුරු හෙළිදරව් කර ගැනීමට උපකාරී වන බෞද්ධ මූලාශ්‍රය රාශියක් ඇත. එක් අට්ඨකතා මූලාශ්‍රයක් වන්නේ,

(1) සමන්තපාසාදිකා අටුවාව යි. (2) පඤ්ච සූදනී අටුවාව යි.
(3) මනෝරථපූරණී අටුවාව යි. (4) පරමත්ථදීපනී අටුවාව යි.
(5) ධම්මපදට්ඨ කථාව යි.

**29.** බෞද්ධ දර්ශනයේ දේශාන්තර ව්‍යාප්තිය විෂයෙහි තෙවන ධර්ම සංගායනාව සුවිශේෂ වේ. එහි දී රටවල් නවයකට ධර්ම දූතයන් වහන්සේලා වැඩම කළ අතර වර්තමාන මියන්මාරයට එදා වැඩම කරන ලද්දේ,

(1) මිහිඳු හිමියන් ඇතුළු පිරිස ය.

(2) මහා ධම්මරක්ඛිත හිමියන් ඇතුළු පිරිස ය.

(3) මහාරක්ඛිත හිමියන් ඇතුළු පිරිස ය.

(4) සෝන හා උත්තර යන දෙන ම ඇතුළු පිරිස ය.

(5) යෝනක ධම්මරක්ඛිත හිමියන් ඇතුළු පිරිස ය.

**30.** අප සතු සාම්ප්‍රදායික පාලි මූලාශ්‍රය අනුව බුද්ධත්වයෙන් වසර 20ට පසු භික්ෂූන් උදෙසා විනය නීති පැනවීම ඇරඹිණි. ඊට තුඩුදුන් හේතු හතරක් පාරාජිකපාළියෙහි ඇතුළත් වන අතර භද්දාලි සූත්‍රයේ හේතු පහක් දැක්වේ. එම සූත්‍රයේ දක්වා ඇති අමතර හේතුව නම්,

(1) භික්ෂූන් වහන්සේලා අතර කීර්තියෙන් අගතැන්පත් වූවන් බහුල වීම ය.

(2) භික්ෂූන් වහන්සේලා අතර බහුශ්‍රැත වූවන් බහුල වීම ය.

(3) සසුනට ලැබුණු ලාභ ප්‍රයෝජන මහත් වීම ය.

(4) භික්ෂු පිරිස විශාල වීම ය.

(5) භික්ෂූන් වහන්සේලා අතර අඬදබර බහුල වීම ය.

**31.** ස්වකීය ශ්‍රාවක භික්ෂූන්ගේ විවිධ නිපුණතාවන් අගය කරමින් උන් වහන්සේලාට විශේෂඥ තනතුරු පිරිනැමීම බුදුරජාණන් වහන්සේ ධරමාන අවදියේ දී ම සිදු වූ බව පෙනේ. ධර්ම විනයෙහි ආරක්ෂාව පිණිසත් චිර පැවැත්ම පිණිසත් උපකාරී වූ එම ක්‍රියාවලිය තුළ, වීර්ය ඇත්තවුන් අතර අගතනතුර, පිරිනමන ලද්දේ,

(1) මහාකස්සප මාහිමියන්ට ය.

(2) මොග්ගල්ලාන මාහිමියන්ට ය.

(3) ආනන්ද මාහිමියන්ට ය.

(4) නන්ද මාහිමියන්ට ය.

(5) කුමාර කස්සප මාහිමියන්ට ය.

**32.** බුදු දහම අනුව සත්ත්වයා හා ලෝකය විශ්ලේෂණාත්මකව හැදෑරීමේ දී පඤ්චස්කන්ධ විභාගයට මුල් තැන ලැබේ. මේ ස්කන්ධ පහ ම ත්‍රිලක්ෂණ ස්වභාවයෙන් යුක්ත යැයි ද බුදු දහම නොයෙක් විට පැහැදිලි කර දී ඇත. නිත්‍යාත්මයක් ඇතැයි පිළිගත් අබෞද්ධ චින්තකයෙකුට බුදුරජාණන් වහන්සේ එකී ස්කන්ධ විභාගයත්, ත්‍රිලක්ෂණයත් වදාළහ. එම චින්තකයා නම්,

(1) උපාලි ගෘහපතියා ය.

(2) සච්චක පණ්ඩිවරයා ය.

(3) වච්ඡගොත්ත පිරිවැජියා ය.

(4) භාරද්වාජ බ්‍රාහ්මණයා ය.

(5) දීඝජාණුකෝලිය පුත්‍රයා ය.

**33.** ලෝක ධර්මයන් සියල්ල අනිත්‍ය ය. එනම් පෙරළෙන, වෙනස් වන ස්වභාවයෙන් යුක්ත ය. බුදුදහමට අනුව එබඳු ලෝක ධර්ම අටකි. එම ධර්ම පිළිබඳ අවබෝධයෙන් ක්‍රියාකරන පුද්ගලයාගේ චරිත ලක්ෂණයක් ලෙස සැලකිය **නො හැක්කේ,**

(1) ඉවසිලිමත් බව යි.

(2) මැදිහත් බව යි.

(3) අකම්ප්‍ය බව යි.

(4) නිශ්ශෝකී බව යි.

(5) අදූරදර්ශී බව යි.

**34.** ජීව ලෝකයට අයත් සියලු මිනිසුන්ගේ මෙන් ම සිව්පාවුන් හා පක්ෂීන්ගේ ද ජීවිත ආරක්ෂා කිරීම, ඔවුන්ට දැහැමි වූ රැකවරණය සැලසීම රාජ්‍ය තාන්ත්‍රික වගකීමක් ලෙස බුදුසමය සලකයි. ඒ අනුව රාජ්‍ය ප්‍රතිපත්තියක් වශයෙන් එසේ ජීව ලෝකයට හිතවත්ව සානුකම්පිකව කටයුතු කිරීම රජුගේ පිළිවෙත විය යුතු බව දැක්වෙන්නේ,

(1) මෙත්තානිසංස සූත්‍රයේ ය.

(2) වනරෝප සූත්‍රයේ ය.

(3) චක්කවත්තිසීහනාද සූත්‍රයේ ය.

(4) රාජෝවාද ජාතකයේ ය.

(5) රජ්ජ සූත්‍රයේ ය.

**35.** චතුරාර්ය සත්‍ය දේශනාවේ ස්වභාවය, අරමුණ, සුවිශේෂත්වය හා මූලික ලක්ෂණ ද බුද්ධ දේශනාවේ නොයෙක් අයුරින් පැහැදිලි කර තිබේ. එසේ පැහැදිලි කරන එක් ඉගැන්වීමක් අනුව ''අවිතථ බව'' එම බෞද්ධ මූලධර්මයෙහි විශේෂ ලක්ෂණයකි. ඉන් අදහස් කරනුයේ චතුරාර්ය සත්‍යය,

(1) කවර සැටියෙන් වත් අසත්‍ය නො වන බව ය.
(2) විස්තර කිරීමට දුෂ්කර ඉගැන්වීමක් වන බව ය.
(3) උතුම් පරමාර්ථ ධර්මයක් වන බව ය.
(4) විද්‍යමාන නො වන යථාර්ථයක් බව ය.
(5) අවබෝධයට අපහසු වන බව ය.

**36.** සසර දුක බුද්ධ වචනයෙහි නොයෙක් අයුරින් ප්‍රභේදගත කොට ඇත. එහි අරමුණ වී ඇත්තේ වඩාත් පුළුල් ලෙසත්, ගැඹුරු ලෙසත් දුක විවරණය කොට දැක්වීම යි. 'සංඛාර දුක්ඛ' යන්න ඉන් එක් ප්‍රභේදයකි. එයින් ප්‍රකාශ වන්නේ,

(1) වෙනස් වීමෙන් උපදනා දුක ය.
(2) සමාජගත දුක ය.
(3) පඤ්ච උපාදානස්කන්ධ දුක ය.
(4) ජාති, ජරා, මරණාදියෙන් උපදනා සාමාන්‍ය දුක ය.
(5) කර්මානුරූපී ව විඳින දුක් දොම්නස් ය.

**37.** සමාජ ජීවිතය තුළ දී මිනිසාට මුහුණදීමට සිදුවන දේශපාලන, ආර්ථික, සංස්කෘතික ආදී ගැටලු විවිධාකාර වේ. එම ගැටලු හැඳින්වෙන්නේ සමාජගත දුක් ලෙස ය. සන්තානගත හෙවත් මානසික දුක් නිවාරණය කර ගැනීමට තණ්හාව පෙරටු කොට ගත් කෙලෙස් ප්‍රහීණ කළ යුතු යැයි උගන්වන බුදු දහම සමාජගත දුක් නිවාරණය කර ගැනීමට ආර්ථික, දේශපාලන විසඳුම් ද පෙන්වා දෙයි. එබඳු විසදුම් පෙන්වා දෙන බුද්ධ දේශනාවක් නම්,

(1) ධම්මචක්කපවත්තන සූත්‍රය යි.
(2) මහා තණ්හාසංඛය සූත්‍රය යි.
(3) චක්කවත්තීසීහනාද සූත්‍රය යි.
(4) බ්‍රහ්මජාල සූත්‍රය යි.
(5) මධුපිණ්ඩික සූත්‍රය යි.

**38.** බුද්ධ දේශිත පටිච්චසමුප්පාද ධර්මයෙහි ඇතුළත් අවිජ්ජා, සංඛාර ආදී අංග දොළහේ අර්ථ මොනවා දැයි පසුගිය පුරපසොළොස්වක පොහෝදා අප විහාරස්ථාන ධර්ම ශාලාවේ පැවති ධර්මෝදය උපාසක උපාසිකා සමිතියේ මාසික ධර්ම සාකච්ඡාවේ දී අවධානයට යොමු විය. එහි දී ප්‍රකාශ වූ විවිධ අදහස් අතුරින් නිවැරදි වූයේ,

(1) සත්ත්වයාගේ ශරීරය නාම රූප නම් වේ යන්න යි.
(2) ඇඩිව අල්ලා ගැනීම භව යන්නෙහි අර්ථය වේ යන්න යි.
(3) සංඛාර යනු චේතනාමය ක්‍රියාකාරීත්වය වේ යන්න යි.
(4) නිවැරදි අවබෝධය විඥාන නම් වේ යන්න යි.
(5) උපාදාන යනු නියත මිත්‍යා දෘෂ්ටියකි යන්න යි.

**39.** හරයෙන් ද රසයෙන් ද අනූන වූ කෙටි ධර්ම පාඨ එක්කාසු කර ඒවායේ අර්ථය දැක්වෙන වගන්ති පුවරුවල ලියා විහාරස්ථානයේ තැනින් තැන ප්‍රදර්ශනය කරන තරුණ ස්වාමීන්වහන්සේ නමක ගැන දකුණු පළාතෙන් වාර්තා වේ. උන්වහන්සේ රැස් කළ පහත සඳහන් ධර්මපාඨ අතුරෙන් කුසල කර්ම නිශ්චයට අදාළ වූ ධර්මපාඨය වන්නේ,

(1) තංච කම්මං කතං සාධු යං කත්වා නානුතප්පති යන්න ය.
(2) කම්මනා වත්තතී ලොකො කම්මනා වත්තතී පජා යන්න ය.
(3) කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පනීතතා යන්න ය.
(4) සබ්බ අකුසලධම්ම පහීනො කුසලධම්ම සමන්නාගතො යන්න ය.
(5) කුසලස්ස උපසම්පදා යන්න ය.

**40**. අප විසින් සිදු කරනු ලබන හොඳ නරක ක්‍රියාවන් හැඳින්වීම සඳහා බුදුදහම විවිධ ව්‍යවහාර භාවිත කරයි. කුසල - අකුසල, පුඤ්ඤ - පාප, සාධු - අසාධු, සාවජ්ජ - අනවජ්ජ යනාදිය ඊට නිදසුන් වේ. මේ අතුරින් බහුලව භාවිත කර ඇත්තේ කුසල - අකුසල, පුඤ්ඤ - පාප යන ව්‍යවහාරයන් ය. එම ඉගැන්වීම් පිළිබඳව කියැවෙන පහත ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ,

(1) පින් නිවනට ය. කුසල් සසරට ය යන්න යි.
(2) දස කුසල් මඟින් උගන්වන්නේ කළ යුතු ක්‍රියාවන් ය යන්න යි.
(3) පාපය ද අකුසලය ද සමාන වන බව ය යන්න යි.
(4) දස පින් කිරියවත් මඟින් පවින් වැළකීමට ඉගැන් වේ යන්න යි.
(5) කුසල් සිත් වැඩීම ආර්ය මාර්ගයට ඇතුළත් නොවේ යන්න යි.

**41**. ආජීව අෂ්ටමක ශීලය හා උපෝසථ අෂ්ටාංග ශීලය පඤ්ච ශීලයට වඩා උසස් ය. පුද්ගලයා උසස් ශික්ෂණයකට යොමු කරන එම ශීල ශික්ෂාවන් චරිත සංවර්ධනයට විශේෂයෙන් උපකාරී වේ. එසේම නිවන් සුවය වෙත පුද්ගලයා යොමු කරවයි. ආධ්‍යාත්මික සංවර්ධනයට අනුබලයක් වෙයි. කය වචන දෙක ද හික්මවයි. දස ශීලය සමඟ සැසඳීමේ දී එම ශීල ශික්ෂාවන් දෙකෙහි දක්නට ලැබෙන විශේෂත්වය නම්,

(1) පවින් වැළකීමට අවස්ථාව සැලසීම ය.
(2) අපිස් ගුණය වැඩි දියුණු කිරීම ය.
(3) කුසල ධර්ම සංවර්ධනය කිරීම ය.
(4) මිල මුදල් භාවිතයට දොර වසා නො තිබීම ය.
(5) නිෂ්කාමී ජීවිතයට යොමු කිරීම ය.

**42**. බෞද්ධ ශ්‍රද්ධාව ධර්මානුකූලව හඳුන්වා දෙමින් කෙටි වාක්‍ය පහක් ලියන්නැයි අප විහාරස්ථ ඉරු දින දහම් පාසලේ ධර්මාචාර්ය ශ්‍රේණියේ සිසු සිසුවියන්ට ගුරු හාමුදුරුවන් වහන්සේ විසින් පැවරුමක් ලබා දෙන ලදී. එහි දී එක් සිසුවෙකු විසින් ලියා ඉදිරිපත් කරන ලද ශ්‍රද්ධාව හඳුන්වා දෙන වැකි පහෙන් සතරක් ම වැරදි වුව ද එකක් නිවැරදි විය. එම වැකිය නම්,

(1) තෙරුවන් ගුණ ගැන උපදවාගත් භක්තිය ශ්‍රද්ධාව ය යන්න යි.
(2) ආකාරවතී ශ්‍රද්ධාව යනු කරුණු නො දැන පැහැදීම ය යන්න යි.
(3) අඹු සැමියන් සමාන ශ්‍රද්ධාවෙන් යුක්ත විය යුතු ය යන්න යි.
(4) ත්‍රිවිධ රත්නය පිළිබඳ ඇදහීම ශ්‍රද්ධාව ය යන්න යි.
(5) ප්‍රඥාවෙන් තොර ශ්‍රද්ධාවන්තයා කෛරාටිකයෙකි යන්න යි.

**43**. සුරක්ෂිත ආර්ථිකයක් පවත්වාගෙන යාම පිණිස මනා කළමනාකරණයෙන් යුක්තව ධනය පරිහරණය කිරීමට බුදුදහම මඟපෙන්වයි. දීඝජාණු කෝලිය පුත්‍රයාට ලබා දුන් ධන පරිහරණයට අදාළ එක් උපදේශයක් නම්, භෝගයන්ගේ අයවැය දෙක දැන සමජීවි කතාවෙන් ක්‍රියා කිරීම ය. එය පැහැදිලි කරන උපමා අතුරෙන් එකක් නම්,

(1) අලගද්දූපමාව යි. (2) වම්මිකෝපමාව යි. (3) තලාකෝපමාව යි.
(4) සල්ලෝපමාව යි. (5) අන්ධවේනූපමාව යි.

**44**. බෞද්ධ ආර්ථික දර්ශනය පිළිබඳ විශේෂ දේශනයක් පැවැත් වූ එක්තරා දේශකයෙකු විසින් නැවත නැවත අවධාරණය කළ කරුණක් නම් බුදුදහම ධාර්මික ධනෝපායනයට මඟපෙන්වන බව ය. එයට අදාළ එක් උපදේශයක් ලෙස හැඳින්විය හැක්කේ,

(1) වංචනික ලෙස කිරුම් මිනුම් භාවිතයෙන් වැළකීම ය.
(2) කොටස් හතරකට බෙදා ධනය පරිහරණය කිරීම ය.
(3) තරඟකාරීව වෙළහෙළදාම් ආදියෙහි නිරත වීම ය.
(4) අවම පිරිවැයකින් උපරිම ලාභයක් ඉපයීම ය.
(5) මිරිදිය මසුන් වගා කිරීම ය.

**45.** බුදුදහම අනුව රට පාලනය කිරීමට විශාල උනන්දුවක් දැක් වූ පාලකයෙක්, සියලු ජන කොටස්වලට දැහැමි රැකවරණය සලසමින්, අපරාධ මර්දනය කරමින්, මහණ බමුණන්ට සත්කාර සම්මාන කරමින්, ප්‍රතිපත්ති ගරුකව ක්‍රියා කළේ ය. එහෙත් නිර්ධනයන්ට තම අභිමත කර්මාන්තා දී කටයුතු සඳහා ධනය පරිත්‍යාග නො කළේ ය. ඔහු විසින් කඩ කොට ඇත්තේ,

(1) පඤ්චශීල ප්‍රතිපත්තිය යි. (2) අපරිහාණීය ධර්මයකි. (3) සක්විති වතකි.
(4) සංග්‍රහ වස්තුවකි. (5) සතර අගති විරතියකි.

**46.** බෞද්ධ ඉගැන්වීම් අනුව රාජ්‍ය පාලන කටයුතු නිසි ලෙස පවත්වාගෙන යන පාලකයෙකු,

(1) නීති ගරුක විය යුතු ය. (2) පිය උරුමය ආරක්ෂා කළ යුතු ය.
(3) අපරාධකරුවන්ට දඬුවම් නො කළ යුතු ය. (4) දැඩි සිත් ඇත්තෙකු විය යුතු ය.
(5) තවුස් පිළිවෙත රැකිය යුතු ය.

**47.** බුදුදහම අනුව සමථ විපස්සනා යනුවෙන් භාවනාව දෙයාකාර ය. බුද්ධකාලීන මහණ බමුණන් අතර ඇතැමෙක් නැවත නැවතත් වීර්යය වඩමින්, උත්සාහය වඩමින් සමථ භාවනාව වඩා චිත්ත සමාධිය උපදවා ගත් බව බෞද්ධ සූත්‍රවල සඳහන් වේ. ඔවුහු ඒ ඔස්සේ ලෞකික අභිඥා, සමාපත්ති ආදිය ද උපදවාගෙන සිටියෝ ය. අප මහ බෝසතුන්ට ද මග පෙන් වූ එබඳු මහණ බමුණන් කිසිවෙකුට උපදවාගත නො හැකි වූ සමාපත්තිය නම්,

(1) චතුර්ථධ්‍යානය යි. (2) සඤ්ඤාවේදයිත නිරෝධයයි.
(3) පරචිත්තවිජානන ඤාණය යි. (4) මනෝමය ඍද්ධි ඤාණය යි.
(5) නේවසඤ්ඤානාසඤ්ඤායතන යි.

**48.** අප විහාරස්ථානයේ මාසික භාවනා වැඩසටහන පසුගිය දා පවත්වන ලදී. එහි දී කර්මස්ථානචාර්ය හිමිපාණෝ මෙතෙක් භාවනාව පිළිබඳ උගත් කරුණු ගෙනහැර දක්වන්නැයි උපාසක උපාසිකාවන්ට උපදෙස් දුන්හ. එහි දී ප්‍රකාශ වූ කරුණු අතුරින් එකක් පමණක් නිවැරදි විය. එය නම්,

(1) සමථය නො වඩා විපස්සනාව වැඩිය හැකි ය.
(2) විදසුන් වැඩීමෙන් තිලකුණු අවබෝධ වේ.
(3) ආසවක්ඛය ඤාණය ලැබෙන්නේ සමථ භාවනාවෙනි.
(4) සීලය සමාධියට උපකාර වන නමුත් සමාධිය සීලයට උපකාරී නොවේ.
(5) විදර්ශනාව වැඩීමෙන් කෙළෙස් යටපත් වේ.

**49.** යම් කරුණක් පිළිබඳ ථේරවාද බෞද්ධ ඉගැන්වීම් හඳුනා ගැනීමට අවශ්‍ය වූ කල්හි විශුද්ධිමාර්ගය කියවිය යුතු යැයි පඬිවරු උපදෙස් දෙති. එහි විවිධ නිර්දේශයන් යටතේ ධර්ම කරුණු විස්තර කොට තිබේ. එම ග්‍රන්ථය භාවනා වැඩීමට උපකාරී වන දස අනුස්සතියක් උගන්වන අතර ඉන් එකක් නම්,

(1) භාවනානුස්සතිය යි. (2) සද්ධානුස්සතිය යි. (3) පුඤ්ඤානුස්සතිය යි.
(4) දේවතානුස්සතිය යි. (5) දේශනානුස්සතිය යි.

**50.** මධ්‍යම ප්‍රතිපදාව හෙවත් ආර්ය අෂ්ටාංගික මාර්ගය යනු බුදුරදුන් වදාළ නිවන් මඟ ය. එහි සම්මා සති යන්නෙන් අදහස් වන්නේ සතර සතිපට්ඨාන වැඩීමයි. ධම්මානුපස්සනාව එම හතරෙන් එකකි. එයට ඇතුළත් වන එක් කරුණක් නම්,

(1) අටලෝ දහම මෙනෙහි කිරීම ය. (2) සත්ත බොජ්ඣංග ධර්ම වැඩීම ය.
(3) තිලකුණු විමසීම ය. (4) සීලානිසංස මෙනෙහි කිරීම ය.
(5) කුසලාකුසල ධර්ම සිහි කිරීම ය.

* * *

# (41) බුද්ධ ධර්මය

## II පත්‍රය

**සැලකිය යුතුයි :**

* I කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසෙන් ප්‍රශ්න **තුනක්** ද, තෝරා ගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

---

### I කොටස

**1.** (i) ලෝකවිදූ බුදු ගුණයෙහි අර්ථය දක්වන්න. (ලකුණු 02 යි.)

(ii) ආසවක්ඛය ඤාණය පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(iii) ''අභික්කන්තං භෝ ගෝතම'' යනා දී වශයෙන් ශ්‍රාවකයන් බුද්ධ දේශනාව අගය කළ සැටි පෙන්වා දෙන්න. (ලකුණු 06 යි.)

(iv) බුදුරදුන්ගේ ආගමික සහනශීලීත්වය ඇගයුමට ලක්කරන්න. (ලකුණු 08 යි.)

**2.** (i) දක්ඛිණෙය්‍ය යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02 යි.)

(ii) ''දුක යනු මිනිස් ජීවිතයේ යථාර්ථය යි.'' පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(iii) ''බුදු දහම මධ්‍යම දේශනාවකි.'' විස්තර කරන්න. (ලකුණු 06 යි.)

(iv) ''බුදු දහම විශ්ව සාධාරණය'' විමසන්න. (ලකුණු 08 යි.)

**3.** (i) බෞද්ධ පැවිද්දේ විශේෂතා **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) ''අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස'' යන්නට අර්ථ දක්වන්න. (ලකුණු 04 යි.)

(iii) විනය නීති පැනවීමට තුඩුදුන් හේතු පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

(iv) විනය නීති පැනවීමේ පරමාර්ථ විස්තර කරන්න. (ලකුණු 08 යි.)

### II කොටස

**4.** (i) ''අහේතු අප්පච්චය වාදය'' හඳුන්වන්න. (ලකුණු 08 යි.)

(ii) එම වාදය පිළිබඳ බෞද්ධ විචාරය ගෙනහැර දක්වන්න. (ලකුණු 12 යි.)

**5.** (i) දෙවන ධර්ම සංගායනාවට තුඩුදුන් ශාසනික ගැටලු පෙන්වා දෙන්න. (ලකුණු 08 යි.)

(ii) එම සංගීතියෙහි ප්‍රතිඵල පිළිබඳ විමසුමක් කරන්න. (ලකුණු 12 යි.)

**6.** (i) ''අනාත්ම ලක්ෂණය'' ධර්මානුකූලව පැහැදිලි කරන්න. (ලකුණු 08 යි.)

(ii) එම ඉගැන්වීමෙන් ප්‍රකටවන බුදු දහමෙහි සුවිශේෂත්වය පරීක්ෂා කරන්න. (ලකුණු 12 යි.)

**7.** (i) ධන සම්පත් කළමනාකරණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් විස්තර කරන්න. (ලකුණු 08 යි.)

(ii) ධනය පිළිබඳ බෞද්ධ ආකල්පය විමසුමට ලක්කරන්න. (ලකුණු 12 යි.)

**8.** (i) සතර කමටහන් (චතුරාරක්ඛා භාවනා) හඳුන්වන්න. (ලකුණු 08 යි.)

(ii) මෙත් වැඩීමෙන් මෙලොව ජීවිතයේ දී ම ලැබෙන අනුසස් පැහැදිලි කරන්න. (ලකුණු 12 යි.)

* * *

# (43) ක්‍රිස්තියානි ධර්මය

## ප්‍රශ්න පත්‍ර ව්‍යූහය

**I පත්‍රය - කාලය : පැය 02යි.**

වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න **50**කි. ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **01** බැගින් මුළු ලකුණු **50**කි.

**II පත්‍රය - කාලය : පැය 03යි.** (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10 යි.)

මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත වේ.

I කොටස - අර්ධ ව්‍යුහගත ප්‍රශ්න **තුනකි.** ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40කි.

II කොටස - රචනා වර්ගයේ ප්‍රශ්න **පහකි.** ප්‍රශ්න **තුනකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 60කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු = 100

අවසාන ලකුණ ගණනය කිරීම :

| | | |
|---|---|---|
| I පත්‍රය | = | 50 |
| II පත්‍රය | = | 100 ÷ 2 = 50 |
| අවසාන ලකුණ | = | 100 |

### I පත්‍රය

සැලකිය යුතුයි :

* **සියලු ම** ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.
* **නිවැරදි හෝ වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරන්න.(විභාගයේ දී පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ.

---

**1.** ''පොදු ජනතාවගේ පිටපත'' යන අරුත ඇති ශුද්ධ බයිබලයේ පිටපත වන්නේ,
(1) වල්ගේට් ය. (2) මැසොරෙටික් ය. (3) සෙප්ටුවාජින්ට් ය.
(4) පෙන්ටටියුට් ය. (5) නබිඊම් ය.

**2.** සෙප්ටුවාජින්ත පිටපතෙහි අඩංගු ද්විතීය සම්මත ග්‍රන්ථයක් වන්නේ,
(1) විලාප ගී ය. (2) රූත් ය. (3) ධර්මදේශකයා ය.
(4) ජුදිත් ය. (5) හිතෝපදේශය ය.

**3.** දාවිත්ගේ පෙළපතෙහි අවසාන රජතුමා වූයේ,
(1) ශෙදකියා ය. (2) ජෙහෝයාකිම් ය. (3) ජොෂියා ය.
(4) මනස්සේ ය. (5) ජෙහෝයාකින් ය.

**4.** ජෝර්දාන් ගඟ ආරම්භ වන කඳු පන්තිය වන්නේ,
(1) ගෙරසීම් ය. (2) තාබෝර් ය. (3) කාර්මෙල් ය. (4) හර්මොන් ය. (5) ලෙබනන් ය.

**5.** ඉශ්රායෙල්හි පළමුවන රජතුමා වූ සාවුල් රජතුමාගේ පියා වූයේ,
(1) ජෙස්සේ ය. (2) දාවිත් ය. (3) බෙන්ජමින් ය. (4) කිෂ් ය. (5) ජොනතන් ය.

6. පුරාණ ගිවිසුමෙහි පාස්කු භෝජනයේ දී නුමුහුන් පුප භාවිතයේ අර්ථය කුමක් ද?
(1) දෙවියන් වහන්සේ සමඟ ඇති කර ගත් ගිවිසුම සංකේතවත් කිරීම ය.
(2) දේව නියමයන් කඩිනමින් ඉටු කළ යුතු බව සංකේතවත් කිරීම ය.
(3) මංගල්‍යයන් හා උත්සවයන් ජයග්‍රාහී ලෙස සැමරීම ය.
(4) වහල්කමේ අමිහිරි දුක්ගාවිනා සංකේතවත් කිරීම ය.
(5) තම අස්වැන්න දෙවියන් වහන්සේට අයත් බව සංකේතවත් කිරීම ය.

7. පැරණි දිවැසිවරුන් දෙදෙනෙකු වන්නේ,
(1) අහීයා හා හුල්දා ය.
(2) මලාකි හා හුල්දා ය.
(3) ශෙපනියා හා එලිෂා ය.
(4) නාතාන් හා හබක්කුක් ය.
(5) සෙකරියා හා නාතාන් ය.

8. ආදිපිතෘවරුන්ගේ යුගය අයත් කාලය වන්නේ,
(1) ක්‍රි. පූ. 2600 - 2300 ය.
(2) ක්‍රි. පූ. 2300 - 2000 ය.
(3) ක්‍රි. පූ. 2000 - 1700 ය.
(4) ක්‍රි. පූ. 1700 - 1400 ය.
(5) ක්‍රි. පූ. 1400 - 1100 ය.

9. මිනිසාගේ විනාශයට හේතුව උඩගුව බව පෙන්වමින් බයිබල් කතුවරයා ඉදිරිපත් කරන කථා පුවත කුමක් ද?
(1) ආදම් සහ ඒව
(2) බාබෙල් කොත
(3) නෝවා
(4) කායින් සහ ආබෙල්
(5) ලාමෙක්

10. පුරාණ ගිවිසුමේ ප්‍රඥා සාහිත්‍යයට අයත් පොත් හතෙන් දෙකක් වන්නේ,
(1) හිතෝපදේශය හා විලාප ගී ය.
(2) සලමොන්ගේ ප්‍රඥාව හා ජූදිත් ය.
(3) ප්‍රේම ගී හා විලාප ගී ය.
(4) ධර්මදේශකයා හා ජෝබ් ය.
(5) සෙකරියා හා සිරාක් ය.

11. ශුද්ධ වූ පාවුලුතුමා අයත් ගෝත්‍රය කුමක් ද?
(1) ජුදා (2) ලෙවී (3) රූබන් (4) එප්‍රායිම් (5) බෙන්ජමින්

12. පුරාණ ගිවිසුමෙහි පසු කාලීන ව ලියවුන පොත් ඇරමයික් භාෂාවෙන් ලියවීමට හේතු වූයේ,
(1) අසිරියානු විප්‍රවාස සමයේ ජූදා ජනතාව ඇරමයික් බසට හුරු වීම යි.
(2) බබිලෝනියානු විප්‍රවාස සමයේ ජූදා ජනතාව ඇරමයික් බසට හුරු වීම යි.
(3) පර්සියානු අධිරාජ්‍යය සමයේ ජූදා ජනතාව ඇරමයික් බසට හුරු වීම යි.
(4) ග්‍රීක අධිරාජ්‍යය සමයේ ජූදා ජනතාව ඇරමයික් බසට හුරු වීම යි.
(5) රෝම අධිරාජ්‍යය සමයේ ජූදා ජනතාව ඇරමයික් බසට හුරු වීම යි.

13. ශුද්ධ බයිබලය පිළිබඳ ව ප්‍රකාශන කිහිපයක් පහත දැක්වේ;
A - එය පුරාණ පොතකි.
B - එය දේවානුභාවයෙන් ලියවුණු පොතකි.
C - එය ආගමික පොතකි.
D - එය දේව වචනය අඩංගු පොතකි.
E - එය පූජනීය පොතකි.
ඉහත ප්‍රකාශන අතරින් ශුද්ධ බයිබලය වෙනත් ආගමික පොතකින් වෙනස් වීමට හේතු වන කරුණු දෙක වන්නේ,
(1) A හා C ය.
(2) B හා D ය.
(3) C හා E ය.
(4) A හා E ය.
(5) D හා E ය.

14. ''ජුදෙව්වන් සමඟ සංවාදය'' නමැති කෘතියේ ජුදෙව්වන් ශුද්ධ ලියවිල්ල කපා හැර ඇති බව චෝදනා කරන්නේ,
(1) ශු. අගුස්තීනුතුමා ය.
(2) ශු. ජෙරොම්තුමා ය.
(3) ශු. ජස්ටින්තුමා ය.
(4) ශු. ක්ලෙමන්ට්තුමා ය.
(5) ශු. අම්බ්‍රෝස්තුමා ය.

**15.** හෙබ්‍රෙව් බසින් පූජකයා සඳහා යෙදෙන වචනය වන්නේ,

(1) බරිත් ය. (2) ගෝයි කඩොෂ් ය. (3) කොහෙන් ය.
(4) සෙගුල්ලාහ් ය. (5) මම්ලෙකෙට් ය.

**16.** ක්‍රිස්තුන් වහන්සේ ස්නාවක ජොහන්තුමාගෙන් බෞතීස්ම ස්නාපනය ලැබුවේ,

(1) කාලීන සිදුවීම්වලට එකඟවන පිණිස ය. (2) ජුදෙව් චාරිත්‍රවලට ගරු කරන පිණිස ය.
(3) දේව පුත්‍රභාවය ප්‍රකාශ වනු පිණිස ය. (4) දේව කැමැත්ත ඉටු වන පිණිස ය.
(5) පව් කමාව ලබා ගනු පිණිස ය.

**17.** ක්‍රිස්තුන් වහන්සේ මෙන් ''සේවක රාජකීයත්වයට'' කැඳවීමක් ලද කිතුනුවා තුළ දිස්විය යුතු ගුණාංගයක් වන්නේ,

(1) වඩා ඵලදායි ලෙස ජීවිතය ගත කිරීම ය.
(2) සේවය ලැබීම නොව සේවය කිරීම ය.
(3) තමන්ට පැවරී ඇති යුතුකම් උපරිමයෙන් ඉටු කිරීම ය.
(4) අන් අයගේ ප්‍රසාදය ලැබෙන පරිදි ක්‍රියා කිරීම ය.
(5) තම අනාගත අභිවෘද්ධිය සඳහා කටයුතු කිරීම ය.

**18.** ශුද්ධ වූ සභාවේ ආරම්භක යුගය යනු,

(5) පළමු ශතවර්ෂය වේ. (2) 1 - 2 ශතවර්ෂ වේ. (3) 1 - 3 ශතවර්ෂ වේ.
(4) 1 - 5 ශතවර්ෂ වේ. (5) 1 - 15 ශතවර්ෂ වේ.

**19.** තේවාචාරිවරුන් අතරින් දයා සේවාවේ මෙන් ම දහම් දෙසුමෙහි හා බෞතීස්ම කිරීමෙහි නිරත වූයේ,

(1) ස්තේපන් හා නිකනොර් ය. (2) ස්තේපන් හා පිලිප් ය.
(3) ස්තේපන් හා තීමොන් ය. (4) ස්තේපන් හා පර්මනස් ය.
(5) ස්තේපන් හා ප්‍රොකොරස් ය.

**20.** ප්‍රාණපරිත්‍යාගී ජීවිත ආදර්ශයට ගන්නා කිතුනු අප;

(1) ව්‍යවස්ථාවට මුල් තැන දෙමින් කටයුතු කළ යුතු වේ.
(2) පීඩා ඉදිරියේ විශ්වාසයට සාක්ෂි දිය යුතු වේ.
(3) ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතු ව කටයුතු කළ යුතු වේ.
(4) ප්‍රේමයෙන් කටයුතු කිරීමට මුල්තැන දිය යුතු වේ.
(5) ප්‍රාණපරිත්‍යාගී ජීවිත සිහිපත් කළ යුතු වේ.

**21.** දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීම පිළිබඳ නව ගිවිසුමෙහි පැරණි ම වාර්තාව වන්නේ,

(1) මාක් ශුභාරංචිය යි. (2) මතෙව් ශුභාරංචිය යි. (3) ලූක් ශුභාරංචිය යි.
(4) 1 කොරින්ති ලිපිය යි. (5) 1 තෙසලෝනික ලිපිය යි.

**22.** සිව්වන ඇන්ටිඕකස් එපිපානෙස් අධිරාජ්‍යයාගේ සමයෙහි කෙළසන ලද ජෙරුසලම් දේව මන්දිරය නැවත පවිත්‍ර කර කැපකිරීම සමරන මංගල්‍ය වන්නේ,

(1) පාස්කු ය. (2) පෙන්තකොස්ත ය. (3) හනුකා ය.
(4) කූඩාරම් ය. (5) පූරිම් ය.

**23.** මෝසෙස්තුමා ප්‍රාතිහාර්ය පාන දිවැසිවරයෙකු ලෙස ඉදිරිපත් කරන දේව ධාර්මික සම්ප්‍රදාය කුමක්ද ?

(1) Q (2) D (3) J (4) P (5) E

**24.** ''ෂමාර්'' යන හෙබ්‍රෙව් වචනයේ අර්ථය වන්නේ,

(1) දූවිල්ල ය. (2) වගා කිරීම ය. (3) රැකබලා ගැනීම ය.
(4) අළු ය. (5) පොළොව ය.

**25.** ආදිපිතෘ ඊසාක්තුමා ව ''දුක්විඳින සේවකයෙකු'' ලෙස හැඳින්වීමට හේතු වූයේ,

(1) දීර්ඝ කාලයක් දරුවකු නොමැති ව දැඩි සිත් වේදනාවෙන් සිටීම ය.

(2) පියා විසින් ඔහුට භාර්යාවක භාරාන් දේශයෙන් තෝරා දීම ය.

(3) රෙබෙකාගේ මෙහෙය වීමෙන් ජාකොබ් ඔහු ව රවටා ආශිර්වාදය ලබා ගැනීම ය.

(4) තමා යාග කිරීමට අවශ්‍ය දර මිටිය මොරියා දේශයට රැගෙන යාම ය.

(5) සේවකයන් කණින ලද ළිං ගෙරාර්හි ගොපල්ලන් අයත් කර ගැනීම ය.

**26.** මිසරයේ සිදු වූ පළමුවන වසංගත තුන අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක්ද?

(1) වතුර ලේ වීම, මැඩි උවදුර හා කිනිතුලු උවදුර

(2) මැඩි උවදුර, කිනිතුලු උවදුර හා වතුර ලේ වීම

(3) වතුර ලේ වීම, කිනිතුලු උවදුර හා මැඩි උවදුර

(4) මැඩි උවදුර, වතුර ලේ වීම හා කිනිතුලු උවදුර

(5) කිනිතුලු උවදුර, වතුර ලේ වීම හා මැඩි උවදුර

**27.** විවාහය නම් සංකල්පයෙන් දෙවියන් වහන්සේ හා දේව ජනතාව අතර සම්බන්ධතාව ඉදිරිපත් කරන දිවැසිවරයා වන්නේ,

(1) යෙසායා ය. (2) ආමොස් ය. (3) ජෙරමියා ය. (4) එසකියෙල් ය. (5) හොසියා ය.

**28.** ශාදොක්ගේ පරම්පරාවට උත්තම පූජක තනතුර අහිමි කිරීම පිළිබඳ ව විරෝධය දැක්වූ කණ්ඩායම වූයේ,

(1) පරිසිවරු ය. (2) එසේනිවරු ය. (3) සෙලට්වරු ය.

(4) සද්දුසිවරු ය. (5) හෙරෝදිවරු ය.

**29.** ජේසුස් වහන්සේගේ බෞතීස්මයේ දී නික්මුණු හඬ ශබ්දය සඳහා පාදක වන පුරාණ ගිවිසුමෙහි ග්‍රන්ථ දෙක කුමක් ද?

(1) ජෙරමියා හා ගීතාවලිය (2) එසකියෙල් හා ගීතාවලිය

(3) යෙසායා හා ජෙරමියා (4) යෙසායා හා එසකියෙල්

(5) යෙසායා හා ගීතාවලිය

**30.** ''ඔබගේ පූජාව නිර්මල පූජාවක් වන පිණිස පළමුව ඔබේ පාප පිළිබඳ ව පාපෝච්චාරණයකින් පසු ව එක්වී රොටී කඩා ස්තුති දෙන්න'' යනුවෙන් සඳහන් වන්නේ කිනම් කෘතියේ ද?

(1) ඩිඩාකේ (2) ඇපොලොජියා (3) පාපෝච්චාරණය

(4) දේව නගරය (5) මූලික සිද්ධාන්ත

**31.** පෙන්තකොස්ත දින අපෝස්තුලුවරුන් විසින් අන්‍ය භාෂා කථා කිරීමේ දී සම්පූර්ණත්වයට පත් වූයේ කිනම් දිවැසිවරයාගේ දිවැස්වැකියක් ද?

(1) ආමොස් (2) ජෙරමියා (3) හොසියා

(4) මීකා (5) ජෝවෙල්

**32.** මුල් කිතුනු සභාවේ ආදර්ශය ලබන ශුද්ධ වූ සභාව, එක පවුලක් ලෙස,

(1) අන් අයගේ සිත් දිනා ගැනීමට පියවර ගත යුතු වේ.

(2) අන් අයගේ අවශ්‍යතා උදෙසා කැපවිය යුතු වේ.

(3) අන් අය පිළිබඳ තොරතුරු සොයා බැලිය යුතු වේ.

(4) අන් අය පිළිබඳ ව එකිනෙකා අතර සාකච්ඡා කළ යුතු වේ.

(5) අන් අය පිළිබඳ විමසිලිමත් ව කටයුතු කළ යුතු වේ.

**33.** ක්‍රි.ව. 496 දී කිතු දහම වැළඳ ගත් ක්ලොවිස් කිනම් ගෝත්‍රයේ නායකයා ද?

(1) බර්ගුන්ඩියන් (2) ඔස්ත්‍රොගෝත් (3) ෆ්‍රැන්ක්

(4) වැන්ඩල් (5) හන්

**34.** ක්‍රි.ව. 563 දී ඉයෝනා නම් ස්ථානයෙහි සෙල්ටික් තාපසාරාමය ආරම්භ කළේ කවුද?
(1) ශුද්ධ වූ කොලුම්බාතුමා ය. (2) ශුද්ධ වූ බෙනඩික්ට්තුමා ය. (3) ශුද්ධ වූ පැට්‍රික්තුමා ය.
(4) ශුද්ධ වූ සිරිල්තුමා ය. (5) ශුද්ධ වූ බොනිෆස්තුමා ය.

**35.** ක්‍රි.ව. 1912 දී අනුරාධපුර නගරයෙහි කරන ලද කැනීම්වල දී කළුගල් කණුවක කොටන ලද කුරුසියක් සොයාගනු ලැබුවේ,
(1) සෙනරත් පරණවිතාරණ මහතා ය. (2) කොස්මස්ඉන්ඩිකොප්ලෙයුස්ටස් මහතා ය.
(3) ඊ.ආර්. අයර්ටන් මහතා ය. (4) බෙන්ජමින් රබායි මහතා ය.
(5) අබුසයිද් මහතා ය.

**36.** ''පෘතුගීසි දයා සංගමය'' විසින් කළ සේවාවලින් ඔබේ ජීවිතයට ලැබෙන පණිවිඩයක් වන්නේ,
(1) කුල භේදය නොසලකා සැමට සමානව සැලකීම ය.
(2) ධර්මය ප්‍රචාරය කිරීම සඳහා හැකි අයුරින් ආධාර කිරීම ය.
(3) කිතුනු සාහිත්‍යයක් බිහි කිරීමට දායක වීම ය.
(4) දුගීන්ට හා අසරණයන්ට පිහිට වීම සඳහා දායක වීම ය.
(5) පාසල් සංවර්ධනය සඳහා දායක වීම ය.

**37.** ලන්දේසි යුගයේ කතෝලිකයන් ධර්මයට දැරූ සාක්ෂියෙන් ඔබට ලැබෙන වැදගත් ම ආදර්ශය වන්නේ,
(1) අභියෝග මධ්‍යයේ දහමට සාක්ෂි දැරීම ය. (2) අනිවාර්ය අධ්‍යාපනයට යොමු වීම ය.
(3) හැකි සෑම අවස්ථාවල ම දේව ප්‍රසාද නිධාන ලැබීම ය. (4) විදේශ භාෂා අධ්‍යයනයට යොමු වීම ය.
(5) ග්‍රන්ථ රචනයට දායක වීම ය.

**38.** ''දේව ධර්මය යනු අවබෝධය සොයා යන ඇදහිල්ලකි.'' යන ප්‍රසිද්ධ කියමන ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින් ද?
(1) ශුද්ධ වූ ඇන්සලම්තුමා ය. (2) ශුද්ධ වූ පීටර් අබෙලාඩ්තුමා ය.
(3) ශුද්ධ වූ පීටර් ලොම්බාර්ඩ්තුමා ය. (4) ශුද්ධ වූ ජෙරොම්තුමා ය.
(5) ශුද්ධ වූ තෝමස් ඇක්වයිනාස්තුමා ය.

**39.** මතෙව් ශුභාරංචියෙහි ඇති ජේසුස් වහන්සේගේ දේශන ගණන කීයද?
(1) එකකි. (2) දෙකකි. (3) තුනකි. (4) හතරකි. (5) පහකි.

**40.** ද්වි ලේඛන උපන්‍යාසය අනුව මතෙව් හා ලූක් ශුභාරංචි සඳහා මූලාශ්‍ර වී ඇත්තේ,
(1) මාක් හා L වේ. (2) Q හා L වේ. (3) Q හා M වේ.
(4) මාක් හා Q වේ. (5) මාක් හා M වේ.

**41.** සර්ගියස් පාවුලස් ශුභාරංචිය අදහාගෙන බෞතීස්ම ස්නාපනය ලබා ගත්තේ,
(1) පාපස්හි දී ය. (2) පම්පිලියේ දී ය. (3) අන්තියෝකියේ දී ය.
(4) ඉකෝනියේ දී ය. (5) ලුස්ත්‍රාවේ දී ය.

**42.** පළමුවරට ශ්‍රී ලංකාවේ බාලිකා පාසල් ආරම්භ කළේ කිනම් ධර්මදූත කණ්ඩායම ද?
(1) බැප්ටිස්ට් (2) ඇමෙරිකන් (3) වෙස්ලියන්
(4) ලන්ඩන් (5) සභා ධර්මදූත සංගමය

**43.** දෙවන වතිකානු මන්ත්‍රණ සභාවේ යෝජනා අනුව ලංකාවේ සිදු වූ නව යොමුවක් වූයේ,
(1) පාසල් රජයට පවරා ගැනීම ය.
(2) පැවිදි සොයුරියන් රෝහල් සේවයට යොමු වීම ය.
(3) ජනවාර්ගික ගැටලුව විසඳීම සඳහා දායක වීම ය.
(4) දේශීය භාෂාවන්ගෙන් ජනවන්දනාව පැවැත්වීමට යොමු වීම ය.
(5) පැවිදි අය ධර්මදූත සේවයට යොමු වීම ය.

**44.** දෙවියන් වහන්සේ මනුෂ්‍යයාට ජීවන හුස්ම දානය කිරීම තුළින් විද්‍යාමාන වන්නේ මනුෂ්‍යයාගේ,
(1) බලය ය. (2) බැහැපත්කම ය. (3) ජීවය ය. (4) උතුම්කම ය. (5) මනහර බව ය.

**45.** ප්‍රේමය, විශ්වාසය හා එකිනෙකා කෙරෙහි ගරුත්වය යන පොරොන්දු ඔස්සේ විවාහපත් යුවළක් ඇතුළත් වන්නේ,
(1) දේව පණිවිඩය බෙද දෙමින් සේවයේ ජීවිතයකට ය.
(2) නිසි අධ්‍යාපනයක් ලබා පාරිශුද්ධ ජීවිතයකට ය.
(3) එකිනෙකාට ත්‍යාජ වෙමින් පරිත්‍යාගශීලී ජීවිතයකට ය.
(4) උත්තරීතර හා යාච්ඤාවේ ජීවිතයකට ය.
(5) නායකත්වය දෙමින් පරිත්‍යාගශීලී ජීවිතයකට ය.

**46.** මහා සභා භේදය නිසා පෙරදිග හා අපරදිග වශයෙන් සභා බෙදී ගියේ කුමන වර්ෂයේ දී ද?
(1) ක්‍රි.පූ. 1022 දී ය. (2) ක්‍රි.පූ. 922 දී ය. (3) ක්‍රි.පූ. 722 දී ය. (4) ක්‍රි.ව. 922 දී ය. (5) ක්‍රි.ව. 1054 දී ය.

**47.** මනුෂ්‍යයා ස්වභාවයෙන් ම සාමාජීය වන හෙයින් අනුන් සමග එකතු වී එකිනෙකාගේ ශුභ සිද්ධිය සඳහා වැඩ කිරීම අත්‍යවශ්‍ය බව පැහැදිලි කරනුයේ,
(1) ''ලෝක සාමය'' නම් විශ්වලේඛනය යි.
(2) ''වෙහෙසෙන මිනිස්සු'' නම් විශ්වලේඛනය යි.
(3) ''මව සහ ගුරුවරිය'' නම් විශ්වලේඛනය යි.
(4) ''අති ඉන්ද්‍රිය ක්‍රිස්තු දේහය'' නම් විශ්වලේඛනය යි.
(5) ''දිව්‍ය සංරක්ෂණය'' නම් විශ්වලේඛනය යි.

**48.** දෙවියන් වහන්සේ ආදම්ට **<u>සහකාරියක්</u>** ලබා දුන් සේක. මෙහි ඉරි ඇඳි වචනයේ අර්ථය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - සහය වන්නියක් B - දැනුම බෙදන්නියක්
C - සහජීවනියක් D - බලය පවත්වන්නියක්
E - ආශිර්වාද කරන්නියක්
මේ අතරින් නිවැරදි පිළිතුරු වන්නේ,
(1) A හා C ය. (2) A හා D ය. (3) A හා E ය. (4) B හා C ය. (5) B හා D ය.

**49.** කිසි ම දේව ප්‍රසාද නිධානයක් දක්නට **නොලැබෙන** කිතුනු සභාව වන්නේ,
(1) මෙතෝදිස්ත සභාව යි. (2) එංගලන්ත සභාව යි. (3) ලූතරානු සභාව යි.
(4) කැල්වින්වාදය යි. (5) ගැලවීමේ හමුදාව යි.

**50.** මිනිසාගේ ගැලවීම පිළිබඳ මත තුනක් පහත දැක්වේ;
A - මිනිසාගේ ගැලවීම සඳහා දේව වරප්‍රසාදය අත්‍යවශ්‍ය නමුත් දේව වරප්‍රසාදය පිළිගැනීමට මනුෂ්‍යයා අනුග්‍රහය දැක්විය යුතු වේ.
B - මිනිසාගේ ගැලවීම සඳහා දේව වරප්‍රසාදය හා දේව අනුග්‍රහය අනවශ්‍ය වේ.
C - මිනිසාගේ ගැලවීම සම්පූර්ණයෙන් ම දේව වරප්‍රසාදය මත පමණක් තීරණය වේ.

ඉහත කියමන් තුන අනුපිළිවෙළින් ඉදිරිපත් කළේ,
(1) අගුස්තීනුතුමා, පෙලාජියස් හා දෙවන ඔරේන්ජ් මන්ත්‍රණ සභාව ය.
(2) දෙවන ඔරේන්ජ් මන්ත්‍රණ සභාව, පෙලාජියස් හා අගුස්තීනුතුමා ය.
(3) පෙලාජියස්, අගුස්තීනුතුමා, දෙවන ඔරේන්ජ් මන්ත්‍රණ සභාව ය.
(4) දෙවන ඔරේන්ජ් මන්ත්‍රණ සභාව, අගුස්තීනුතුමා, පෙලාජියස් ය.
(5) අගුස්තීනුතුමා, දෙවන ඔරේන්ජ් මන්ත්‍රණ සභාව හා පෙලාජියස් ය.

* * *

# (43) ක්‍රිස්තියානි ධර්මය

## II පත්‍රය

**සැලකිය යුතුයි.**

- **I** කොටසින් ප්‍රශ්න දෙකක් ද, **II** කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) ශුද්ධ වූ පාවුලුතුමා විසින් ම ලියන ලද ලිපි දෙකක් නම් කරන්න. (ලකුණු 1 x 2 = 2යි.)

(ii) ශුද්ධ වූ පාවුලුතුමාගේ තෙවන ධර්මදූත චාරිකාවේ දී ''එපිසියෙහි'' සිදුවූ වැදගත් සිදුවීම් දෙකක් ලියන්න. (ලකුණු 2 x 2 = 4යි.)

(iii) ශුද්ධ වූ පාවුලුතුමා එපීසවරුනට යැවූ ලිපිය අනුව (එපීස 5:22 හා 6:4) විවාහකයන්ට දෙන උපදෙස් තුනක් ලියන්න. (ලකුණු 2 x 3 = 6යි.)

(iv) ශුද්ධ වූ පාවුලුතුමා පිලිප්පි ලිපියෙහි දක්වන කිතුනු ගුණාංග පදනම් කර ගනිමින් තරුණ තරුණියන්ට ලැබෙන මඟපෙන්වීම් හතරක් ලියන්න. (ලකුණු 2 x 4 = 8යි.)

**2.** (i) විවිධ තරාතිරම් මත පදනම් වූ ජුදෙව් සමාජය තුළ පිළිගත් හා නොපිළිගත් කණ්ඩායම බැගින් නම් කරන්න. (ලකුණු 1 x 2 = 2යි.)

(ii) ඔබ ඉහත නම් කළ නොපිළිගත් කණ්ඩායම පිළිබඳ කරුණු දෙකක් ඇතුළත් කරමින් විස්තර කරන්න. (ලකුණු 2 x 4 = 4යි.)

(iii) ඉහත ඔබ විස්තර කළ කණ්ඩායම් පිළිබඳ ව මුල් කිතුනු සභාව ක්‍රියා කළ අන්දම කරුණු තුනකින් විස්තර කරන්න. (ලකුණු 2 x 3 = 6යි.)

(iv) ඔබගේ කිතුනු සංසය තුළ කොන්වූවන් සඳහා ඔබට කළ හැකි සේවා හතරක් විස්තර කරන්න. (ලකුණු 2 x 4 = 8යි.)

**3.** (i) 16 වන සියවසේ දී ශුද්ධ වූ සභාව බෙදීයාමේ දී කතෝලික සභාව ඇක් වූ ධනාත්මක ප්‍රතිචාර දෙකක් ලියන්න. (ලකුණු 1 x 2 = 2යි.)

(ii) එම ප්‍රතිචාර පිළිබඳ ව කරුණු දෙක බැගින් ලියන්න. (ලකුණු 2 x 2 = 4යි.)

(iii) එම ප්‍රතිචාර පිළිබඳ ව ඔබේ අදහස් තුනක් ලියන්න. (ලකුණු 2 x 3 = 6යි.)

(iv) සභා භේද ඇති නොවීම සඳහා වර්තමාන ශුද්ධ වූ සභාවට ඔබ කරන යෝජනා හතරක් ලියන්න. (ලකුණු 2 x 4 = 8යි.)

## II කොටස

**4.** (i) දේව අනාවරණය යනු කුමක්දැයි හඳුන්වා දේව අනාවරණය සිදු වූ ආකාර දෙක විස්තර කරන්න.
(ii) වර්තමාන සමාජය තුළ ජීවත් වන ඔබට දෙවියන් වහන්සේ අනාවරණය වන විවිධ මාර්ග පහක් විස්තර කරන්න. (ලකුණු 20යි.)

**5.** (i) යෙසායා දිවැසිවරයා ඉදිරිපත් කරන දුක්විඳින සේවකයා සතු ලක්ෂණ පහක් ඉදිරිපත් කරන්න.
(ii) තම සේවාවන්හි ප්‍රඥාවන්ත ව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන පහක් විස්තර කරන්න.
(ලකුණු 20යි.)

**6.** (i) පාවුලු තුමාගේ සංදේශවල සැලැස්ම (ආකෘතිය) විස්තර කරන්න.
(ii) පාවුලු තුමාගේ ජීවිතයෙන් නූතන ධර්මදූතවරුන්ට ලැබෙන මඟ පෙන්වීම් පහක් දක්වන්න.
(ලකුණු 20යි.)

**7.** (i) සභාපිය යුගය පිළිබඳ ව ප්‍රධාන කරුණු පහක් දක්වන්න.
(ii) වර්තමානයේ ශුද්ධ සභාවට එරෙහිව එල්ල වන අභියෝගවලට ශුද්ධ වූ සභාවේ ප්‍රතිචාරය කෙසේ විය යුතු දැයි කරුණු පහක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 20යි.)

**8.** (i) ශුද්ධ වූ ජුසේ වාස් පියතුමාගෙන් ලාංකිකයන්ට සිදු වූ සේවා පහක් ලියන්න.
(ii) ශුද්ධ වූ ජුසේ වාස් පියතුමාගේ ජීවිතාදර්ශයෙන් හා ඉගැන්වීම්වලින් ඔබට කළ හැකි කාර්යන් පහක් විස්තර කරන්න. (ලකුණු 20යි.)

* * *

# (44) ඉස්ලාම්

**ප්‍රශ්න පත්‍ර ව්‍යුහය**

**I පත්‍රය -** **කාලය : පැය 02යි.**

වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න **50කි.** ප්‍රශ්න **සියල්ලට** ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **01** බැගින් මුළු **ලකුණු 50කි.**

**II පත්‍රය -** **කාලය : පැය 03යි.** (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10 යි.)

මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත වේ.

I කොටස - අර්ධ ව්‍යුහගත ප්‍රශ්න **තුනකි.** ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40කි.

II කොටස - රචනා වර්ගයේ ප්‍රශ්න **පහකි.** ප්‍රශ්න **තුනකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 60කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු = 100

අවසාන ලකුණ ගණනය කිරීම :

| | | |
|---|---|---|
| I පත්‍රය | = | 50 |
| II පත්‍රය | = | 100 ÷ 2 = 50 |
| අවසාන ලකුණ | = | 100 |

## I පත්‍රය

**සැලකිය යුතු යි :**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුයි.
* **නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ** පිළිතුර තෝරාගත යුතු යි. (විභාගයේ දී පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ.)

---

**1.** පහත සඳහන් පුද්ගලයින්ගෙන් ආධ්‍යාත්මික ක්ෂේත්‍රයේ ප්‍රසිද්ධියට පත් වූ යේ කවුද ?

(1) ඉබ්‍රහීම් ඉබ්නු අද්හම් (රහ්)
(2) මුහම්මද් ඉබ්නු ඉස්මාඊල් (රහ්)
(3) නූමාන් බින් සාබිත් (රහ්)
(4) උමර් ඉබ්නු අබ්දුල් අසීස් (රහ්)
(5) උස්මාන් ඉබ්නු මල්ඌන් (රළි)

**2.** ඉස්ලාමය වැළඳගත් ජාහිලියියා ජනයා නැවතත් කුෆ්ර්ට යොමු නොවී රඳවා ගන්නා ලද ගුණාංගය වන්නේ,

(1) එඩිතරකම යි.
(2) සරළ හා චාම් බව යි.
(3) ආගන්තුක සත්කාරය යි.
(4) පොරොන්දු කඩ නොකිරීම යි.
(5) පතිව්‍රතතාවය යි.

**3.** ඉස්ලාම් අනුමත කළ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ කෘෂිකාර්මික කොටස් ව්‍යාපාරය හැඳින්වෙන්නේ කවර නමකින්ද?

(1) මූෂාරකා (2) මුසාරආ (3) මුලාරබා (4) මරාබහා (5) බයිඋල මුඅජ්ජල්

**4.** දාවූද් (අලෛ) සකරියා (අලෛ) යන නබිවරුන් විසින් සිදුකරන ලද ඉපයීම් මාර්ග පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?

(1) ලෝහ වැඩ හා කෘෂිකර්මාන්තය යි.
(2) නැව් තැනීම හා කෘෂිකර්මාන්තය යි.
(3) ලෝහ වැඩ හා වඩු කර්මාන්තය යි.
(4) ව්‍යාපාර හා වඩු කර්මාන්තය යි.
(5) කෘෂිකර්මාන්තය හා සත්ව පාලනය යි.

**5.** ධන සම්පත් අවශ්‍යතාව අනුව වියදම් කිරීම හා බෙදාදීම සම්බන්ධ උමර් ඉබුනු අබ්දුල් අසීස් (රහ්) තුමන්ගේ ප්‍රකාශය කුමක් ද?

(1) ඔබ දුප්පතෙකුට යමක් ලබා දුනහොත් ඔහුට තවත් කෙනෙකුගෙන් තවදුරටත් ලබා ගැනීමට ඉඩ නොතබා දෙන්න.

(2) මා හට ඉෂ්ඨ කිරීමට නොහැකි වූ වගකීම් ඉටු කිරීමට මට අවකාශය ලැබුවේ නම් ධනවතුන්ගෙන් ලබා ගෙන දුප්පතුන්ට බෙදා හරින්නෙමි.

(3) දුගී ජනයාගේ නඩත්තුවට අවශ්‍ය ප්‍රමාණවත් සම්පත් අල්ලාහ් විසින් පොහොසතුන් වෙත ලබා දී ඇත.

(4) දුප්පතුන්, අනාථ දරුවන්, ණයකරුවන්, විවාහ අපේක්ෂිත නමුත් වත්කම් නැති අය මාගෙන් උපකාර ලබා ගත හැකි ය.

(5) ඔවුන් සතු ධනයෙහි සිඟමන් යදින්නවුන්ටත් නැති බැරි අයටත් හිමිකමක් ඇත.

**6.** ''එක් මුස්ලිම් අයකු තවත් මුස්ලිම් අයකුට දෙවතාවක් ණය දුනහොත් ඉන් එක් වතාවක් සදකා දුන් තැනැත්තකු සේ සැලකේ'' යන ප්‍රකාශය

(1) නබි තුමන්ගේ ප්‍රකාශය යි.

(2) අල් කුර්ආන් ප්‍රකාශය යි.

(3) පාලකයකුගේ ප්‍රකාශය යි.

(4) ඉමාම්වරයකුගේ ප්‍රකාශය යි.

(5) සහාබිවරයකුගේ ප්‍රකාශය යි.

**7.** යම් පුද්ගලයකුගේ තව්බා පිළිගැනීමට ලක්වීමට අවශ්‍ය කොන්දේසියක් වන්නේ කුමක්ද ?

(1) කළ අකුසලය වෙනුවෙන් අරාබි බසින් පව් සමාව අයැදීම

(2) පව් සමාව ඉල්ලා කඳුළු වැගිරීම

(3) ලෛලතුල් කද්ර් රාත්‍රියේ අදාළ අකුසල් වෙනුවෙන් පව් සමාව අයැදීම

(4) අකුසලයට හිලව් වශයෙන් අධික ලෙස දන් දීම

(5) අදාළ අකුසල් ක්‍රියාව යළි නොකරන බවට දැඩි ලෙස අධිෂ්ඨාන කර ගැනීම

**8.** ''බිස්මිකල්ලාහුම්ම'' යන ප්‍රාරම්භක වැකිය වන්නේ,

(1) ජාහිලියා සමයේ වූ සම්ප්‍රදායකි.

(2) නබිතුමාගේ සමයේ වූ සම්ප්‍රදායකි.

(3) කුලාෆාවරුන්ගේ සමයේ වූ සම්ප්‍රදායකි.

(4) උමයියාවරුන්ගේ සමයේ වූ සම්ප්‍රදායකි.

(5) නූතනකාලයේ සම්ප්‍රදායකි.

**9.** පූර්ව ඉස්ලාමික සමයේ ජාහිලියියා ගති ලක්ෂණවලින් මිදී සත්‍යය මත පිහිටා කටයුතු කළ පුද්ගලයා කවුද ?

(1) කුස් ඉබුනු සාඉදා

(2) අබූ කුහාෆා

(3) සෛද් ඉබුනු හාරිදා

(4) උස්මාන් ඉබුනු අෆ්වාන්

(5) උමර් ඉබුනු කත්තාබ්

**10.** මුහම්මද් (සල්) තුමන්ට පසුව තවත් නබිවරයකු පහළ වීමේ කිසිදු අවශ්‍යතාවක් නැත යන්නට ප්‍රධාන හේතුව කුමක් ද?

(1) ඉස්ලාම් හි දේශනා සියල්ල අරාබි භාෂාවෙන් සිදු කර තිබීම

(2) මුහම්මද් (සල්) තුමන්ගේ චරිතාපදානය අඩංගු ග්‍රන්ථ නිකුත් වෙමින් තිබීම

(3) පර්යේෂණ තුළින් හදීස් වර්ග කර තිබීම

(4) නබි (සල්) තුමන්ගේ අනුගාමිකයන් එතුමන්ව අනුගමනය කරමින් සිටීම

(5) අල්කුර්ආන්හි ආරක්ෂාව අල්ලාහ් විසින්ම සහතික කොට තිබීම

**11.** ඉස්ලාම් දහමට අනුව ඇඳුම් පැළඳීමේ අරමුණු වන්නේ පහත ප්‍රකාශ අතුරින් කවරක් ද?

(1) ශරීරය ආවරණය කොට විළිබිය රැකගෙන තම පෙනුම ප්‍රසන්න ලෙස තබා ගැනීම

(2) පෙනුම ප්‍රසන්න ලෙසත් පිවිතුරු ලෙසත් තබා ගැනීම

(3) ශරීරය අලංකාර ලෙස පවත්වා ගැනීම

(4) සභ්‍යත්වය රැකගෙන අනන්‍යතාව ආරක්ෂා කර ගැනීම

(5) බාහිර ස්වරූපය පිළිවෙළකටත් ශරීරය පවිත්‍ර ලෙසත් තබා ගැනීම

**12.** ''මිනිසා මිනිසාට වහල් වීමෙන් මුදවා අල්ලාහ්ට පමණක් යටත් වීම සඳහා පමණක්ම අල්ලාහ් විසින් අප එවනු ලැබීය.'' යනුවෙන් පර්සියානු සෙන්පති රුස්තුම් හමුවේ පවසා සිටියේ,

(1) උමර් ඉබුනු කත්තාබ් (රලි) ය.
(2) කාලිද් ඉබුනු වලිද් (රලි) ය.
(3) රුබ්ආ ඉබුනු ආමිර් (රලි) ය.
(4) සඅද් ඉබුනු අබීවක්කාස් (රලි) ය.
(5) අම්ර් ඉබුනු වලීද් (රලි) ය.

**13.** පහත සඳහන් ප්‍රකාශ අතුරින් ඉස්ලාමීය ආර්ථික සංකල්පයට පටහැනි ප්‍රකාශය කුමක් ද?

(1) සියලු සම්පත් අල්ලාහ්ට හිමි ය.
(2) පුද්ගලික දේපලෙහි සමාජයටත් හිමිකමක් ඇත.
(3) වියදම් කිරීම හා ඉතිරි කිරීම ආදියෙහි මධ්‍යස්ථ බව රැකීම ය.
(4) සම්පත් වනාහි මිනිසා පරීක්ෂාවට ලක් කිරීම පිණිස ලබා දුන් බව ය.
(5) සම්පත් වනාහි මිනිස් ශ්‍රමය තුළින් ලබා ගන්නා බව ය.

**14.** ඉස්ලාමීය පසු උරුමකාරත්ව නීතියෙහි ''හජ්බුන් නුක්සාන්'' යනු,

(1) යම් කෙනෙකු ජීවත් ව සිටීම හේතුවෙන් වෙනත් සමහර අයට දේපළවලින් කොටස් උරුමය සහමුලින්ම අහිමි වීම.
(2) යම් කෙනෙකු ජීවතුන් අතර සිටීම හේතුවෙන් සමහර අයට අදාළ දේපළවලින් උරුම විය යුතු කොටස අඩුවෙන් ලැබීම
(3) මරණයට පත් අයගේ පසු උරුමක්කරුවන් බාලවයස්කරුවන් වීම ය.
(4) පසු උරුමක්කරුවන් වෙත වගකීම් පැවරී තිබීම ය.
(5) දේපළ හිමිකරු පසු උරුමකරු විසින් ඝාතනය කර තිබීම ය.

**15.** මදීනා හා එයට උතුරු දිසාවේ සිට පැමිණෙන ඉහ්රාම් අය හජ් හා උම්රා ඉටු කිරීමට බැඳිය යුතු ''මීකාතය'' වන්නේ,

(1) අල් ජුහ්ෆා ය. (2) යලම්ලම් ය.
(3) කර්නුල් මනාසිල් ය. (4) දුල් හුලෛෆා ය.
(5) දාතුල් ඉරාක් ය.

**16.** කලීෆා උස්මාන් (රලි) මෙන්ම අලි (රලි) තුමන්ලාගේ පාලන සමයේ රටතුළ කලහකාරී තත්ත්වයක් ඇති වීමට හේතු වූ තැනැත්තා,

(1) අබ්දුල්ලා බින් උබෛ ය. (2) අබ්දුල්ලාබින් සබා ය.
(3) අබූ ලුඃලුඃ ෆයිරූස් (4) උබයි ඉබුනු සුලුල් ය.
(5) අම්ර් ඉබුනු ලුහෛය ය.

**17.** පහත ප්‍රකාශ සලකන්න.

A - ඉස්ලාම් හි ප්‍රධාන වූ මූලාශ්‍ර වහී මත පදනම් ව සකස් වූ ඒවා ය.
B - මුහම්මද් (සල්) තුමාගේ දේශනා අරාබි භාෂාව කථාකරන අයට සීමාවෙයි.
C - මිනිසා අල්ලාහ්ගේ නියෝජිතයා ය.
D - ඉස්ලාම් ලෞකික ජීවිතයෙන් මිදී ජීවත් වීමට අණ කරයි.
E - ඉස්ලාම් සමාජ ව්‍යූහයට වඩා තනි පුද්ගලයන්ට මුල්තැන දෙයි.
F - ඉස්ලාම් සෑම යුගයකටම මෙන්ම ලොවේ සෑම ප්‍රදේශයකටමත් යෝග්‍ය වේ.

ඉහත ප්‍රකාශ අතුරින් ඉස්ලාමයේ විශේෂාංග අයත් වරණය කුමක් ද?

(1) A, B හා C ය. (2) A, C හා D ය. (3) A, C හා F ය. (4) B, E හා F ය. (5) D, E හා F ය.

● ප්‍රශ්න අංක 18 සිට 23 දක්වා වන සෑම ප්‍රශ්නයකට ම **X** සහ **Y** යන තීරු යටතේ දී ඇති තොරතුරු සලකන්න. **X** හි සඳහන් තොරතුරුවලට කිසියම් හෝ ආකාරයක සම්බන්ධතාවයක් ඇති Y තීරුවේ දී ඇති ප්‍රකාශයන් හි අක්ෂර අනුපිළිවෙල තෝරන්න.

**18.** **X තීරුව** | **Y තීරුව**

(i) මක්බූල් — A - ඉස්නාදිල් සහාබි ගිලිහුනු හදීස්
(ii) මව්කූෆ් — B - මවන ලද හදීස්
(iii) මර්සල් — C - පිළිගත යුතු හදීස්
(iv) මව්ළූ — D - සහබි සමඟ සනද් නිමා වූ හදීස්

(1) A B D C (2) B A D C (3) C D A B (4) D A B C (5) D A C B

**19.** **X තීරුව** | **Y තීරුව**

(i) රබ්බානියියා — A - යථාර්ථවාදය
(ii) ඉන්සානියියා — B - දේවත්ව ස්වභාවයෙන් යුත්තය
(iii) වාකිඉයියා — C - පරිපූර්ණ බවින් යුක්තය
(iv) ෂුමූලියියා — D - මානව දයාවෙන් යුක්තය

(1) A B D C (2) B A C D (3) B D A C (4) B D C A (5) C A D B

**20.** **X තීරුව** | **Y තීරුව**

(i) කිලාෆත් — A - වගකීම් පැවරීම
(ii) රිසාලත් — B - නික්ම යාම
(iii) හිදායත් — C - දේවපණිවිඩය
(iv) හිජ්රත් — D - ඍජුමග
(v) වකාලත් — E - නියෝජිත පාලනය

(1) A C E B D (2) B E C D A (3) D B C E A (4) D B C A E (5) E C D B A

**21.** **X තීරුව** | **Y තීරුව**

(i) ඉමාම් නුඃමාන් බින් සාබිත් (රහ්) — A - සහීහ් බුහාරි
(ii) ඉමාම් මුහම්මද් ඉබුනු ඉද්රීස් (රහ්) — B - මුවත්තා
(iii) ඉමාම් අහමද් ඉබුනු හන්බල් (රහ්) — C - රිසාලතුල් උසූලියා
(iv) මුහම්මද් ඉබුනු ඉස්මාඊල් (රහ්) — D - මුස්නද් අහ්මද්
(v) අනස් ඉබුනු මාලික් (රහ්) — E - ෆික්හුල් අක්බර්

(1) A D E B C (2) B C D A E (3) C D B A E (4) D C B C A (5) E C D A B

**22.** **X තීරුව** | **Y තීරුව**

(i) සම්සරා — A - අත්තිකාරම් දීම
(ii) රහ්න් — B - හවුල් ව්‍යාපාර
(iii) ඉජාරා — C - උකස් තැබීම
(iv) මුලාරබා — D - කුලී පදනම
(v) සලම් — E - තැරව්කාර ව්‍යාපාර

(1) A D E B C (2) B C D A E (3) C D B A E (4) E C D B A (5) E D B C A

23. ''දාරුන් නද්වා'' නම් වූ සභාව ස්ථාපිත කළේ,
   (1) අබ්දුල් මුත්තලිබ්යා ය.
   (2) කුසෙෙ ඉබුනු කිලාබ් ය.
   (3) අබුදුන් ෂම්ස් ය.
   (4) අබු සුෆ්යාන් බින් හර්බ් ය.
   (5) හම්සා බින් අබ්දුල් මුත්තලිබ් ය.

24. ''ඉබුනු සබීල්'' නමින් හැඳින්වෙන කාණ්ඩයට සකාත් හිමිකම් ලැබීමට හේතුව ඔවුන්
   (1) අල්ලාහ්ගේ මාර්ගයෙහි සේවයට කැපවී සිටීම ය.
   (2) තමන් විසින් ලබා ගත් ණය ආපසු ගෙවා ගැනීමට නොහැකිව සිටීම ය.
   (3) වහල් බාවයෙන් නිදහස් කළ යුතුව සිටීම ය.
   (4) අනුමත සංචාරය (ගමන) දුෂ්කරතාවලින් තොරව අවසන් කරගත යුතුව ඇත්තන් ය.
   (5) සකාත් ඒකරාෂි කර සුදුස්සන්ට බෙදාහරින්නනුවන් ය.

25. අල් හදීස් හි ''සනද්'' සම්බන්ධව අධ්‍යයනය කරන කලාව වන්නේ කුමක් ද?
   (1) උසුලුල් හදිස්
   (2) තක්රීජුල් හදීස්
   (3) අස්මාඋර් රිජාල්
   (4) මුස්තලහුල් හදීස්
   (5) ඉල්මුල් හදීස්

26. පොදු යහපත පවත්වා ගැනීමට ඉවහල් වන ඉස්ලාමීය වගකීම වන්නේ කුමක් ද?
   (1) සලාතය
   (2) උපවාසය
   (3) සකාත්
   (4) උම්රා
   (5) හජ්

27. දෙමාපියන් මරණයට පත් වූ පසුව දරුවන් විසින් ඔවුන් හා සම්බන්ධව ඉටු කළ යුතු වැදගත් වගකීමක් වන්නේ,
   (1) ඔවුන්ගේ කබ්ර් තිබෙන ස්ථාන සියාරාත් කිරීම ය.
   (2) ඔවුන් උදෙසා දාන මාන ආදිය දීම ය.
   (3) ඔවුන් නිතර නිතර මෙනෙහි කොට ප්‍රශංසා කිරීම ය.
   (4) ඔවුන්ගේ වසියත් නිසි ලෙස ඉටු කිරීම ය.
   (5) ඔවුන් සතු දේපල නිසි ලෙස බෙදා ගැනීම ය.

28. හජ් හි වාජිබ්වූ වගකීම්වලින් එකක් මග හැරීම හේතුවෙන් ෆිද්යා ලෙස එක් එළුවකු කුර්බාන් කළ නොහැකි අයකු,
   (1) හරම්හි ජීවත්වන මිස්කීන්වරු තිදෙනකුට ආහාර දන් දිය යුතු ය.
   (2) මක්කාහි දී උපවාස තුනක් කළ යුතු ය.
   (3) මදීනාවේ දී උපවාස හතක් කළ යුතු ය.
   (4) මක්කාවේ දින දෙකක් ද මදීනාවේ දින හතක් ද උපවාස කළ යුතු ය.
   (5) මක්කාවේ දින තුනක් ද තම ගමට ආවිගස දින 7ක් ද උපවාස කළ යුතු ය.

29. කරුණු දෙකක් මත මිස වෙනත් කිසිදු හේතුවක් නිසා හෝ මිනිසා ඊර්ෂියා නොකළ යුතු බව හදිස් හි සඳහන් ව ඇත. එම කරුණු දෙක වන්නේ,
   (1) දැනුම ලබා ඒ අනුව කටයුතු කිරීම හා ඉබාදත් වල වැඩි කාලයක් ගත කිරීම ය.
   (2) ජනතාව වෙනුවෙන් කායිකව වෙහෙසීම හා අල්ලාහ්ගේ මාර්ගයෙහි වියදම් කිරීම ය.
   (3) සදකා දීම හා සමාජ සුබ සාධන කටයුතුවල නියැලීම ය.
   (4) වැඩි වශයෙන් උපවාස කිරීම හා රාත්‍රී කාලයේ ඉබාදත්වල යෙදීම ය.
   (5) දැනුම ලබා ඒ අනුව ක්‍රියාතමක වීම හා ධන සම්පත් ලැබ එය අල්ලාහ්ගේ මාර්ගයේ වියදම් කිරීම ය.

**30.** පහත සඳහන් කරුණු සලකන්න.

A - තසව්වුෆ් යනු තපස් ජීවිත සංකල්පය යි.

B - මොන්ගෝලියානුවන් ඉස්ලාමය වැළඳ ගැනීමට සුෆි උත්තමයින් හේතු වූහ.

C - තසව්වුෆ් සංකල්පය නබිතුමන්ගේ සමයේ පටන්ම පැවති එකකි.

D - ඉස්ලාමීය ලෝකයේ ෂාදුලියා, සහ්රවර්දියා සහ නක්ෂබන්දියා වැනි තරීක්කා සංවිධාන තසව්වුෆ් සංකල්පය ඉදිරිපත් කළේ ය.

E - මුස්ලිම් සමාජය බටහිර චින්තනයේ බලපෑම්වලින් ආරක්ෂා කර ගැනීමට තරීක්කා සංවිධාන සිය දායකත්වය ලබා දී ඇත.

ඉහත කරුණු වලින් තසවුෆ් හා සම්බන්ධව ප්‍රකාශ පමණක් අඩංගු වරණය තෝරන්න.

(1) A, B හා C ය. (2) B, D හා E ය. (3) B, C හා D ය. (4) B, C හා E ය. (5) C, D හා B ය.

**31.** කලීෆා ලෙසත් මුජ්තහිද් ලෙසත් සැළකෙන උත්තමයා කවුරුන් ද? ,

(1) උමර් ඉබුනු අබ්දුල් අසීස් (රහ්)

(2) උමර් ඉබුනු කත්තාබ් (රලි)

(3) මුහම්මද් අල් ෆාතිහ් (රහ්)

(4) සුල්තාන් සලාහුද්දීන් (රහ්)

(5) සුල්තාන් අබ්දුල් හමීද් (රහ්)

**32.** පහත සඳහන් කරුණු සලකන්න.

A - අල්ලහ්ගේත් ඔහුගේ දූතයාගේත් මගපෙන්වීම මත ගොඩනගන ලද්දකි.

B - ඉස්ලාමීය සමාජ ව්‍යුහය අනෙකුත් සමාජ ව්‍යුහයන් සමඟ පැවතිය යුතු සම්බන්ධතා අනුමත කරයි.

C - ඉස්ලාමීය සමාජ ව්‍යුහයේ පදනම තුළ තසව්වුෆ් ප්‍රධාන ස්ථානයක් හිමි කර ගනී.

D - ඉස්ලාමීය ඉගැන්වීම් හුදෙක්ම පුද්ගල කේන්ද්‍රීයව නොව සමාජ කේන්ද්‍රීයව ගොඩ නැගී ඇත.

E - ඉස්ලාමීය සමාජ ක්‍රමය රටින් රටට වෙනස් වේ.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් ඉස්ලාමීය සමාජ ව්‍යුහය හා සම්බන්ධ මත පමණක් දැක්වෙන අක්ෂර අඩංගු වරණය තෝරන්න.

(1) A, B හා C ය. (2) A, B හා D ය. (3) A, C හා E ය. (4) B, C හා D ය. (5) B, D හා E ය.

**33.** මිනිස් අයිතිවාසිකම් සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් මෙසේය.

A - 1948 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත් කරන ලද මානව හිමිකම් ප්‍රකාශනය මදීනා සම්මුතිය හා සමාන බවක් පෙන්වයි

B - ඉස්ලාම් ලබා දී ඇති අයිතීන් සියල්ල නබිතුමන් විසින්ම හඳුන්වා දෙන ලද ඒවාය.

C - මිනිස් අයිතිවාසිකම් අයුක්තියට එරෙහිව සටන් කිරීමේ අයිතිය තහනම් කර ඇත.

D - මිනිසාගේ ආත්ම ගරුත්වය ආරක්ෂා කළ යුතු වේ.

E - මිනිසාට ජීවත් වීමට ඇති මූලික අයිතීන් සුරක්ෂිත කළ යුතු ය.

මේවා අතුරින් ඉස්ලාම් මඟින් ලබා දී ඇති මානව හිමිකම් හා සම්බන්ධ ප්‍රකාශවල වඩාත් ම නිවැරදි එකතුව වන්නේ,

(1) A, B හා E ය. (2) A, D හා E ය. (3) B, D හා E ය. (4) C, B හා E ය. (5) C, D හා E ය.

**34.** ඉජ්තිහාද් මත පදනම්ව බිහි වූ (නීති) මූලාශ්‍ර වන්නේ,

(1) අල් හදීස් - අල් ඉජ්මාඋ ය.

(2) අල් හදීස් - අල් කියාස් ය.

(3) අල් ඉජ්මාඋ ය.

(4) අල් ඉස්තිහ්සාන් - ෂරඋ සාබිකා ය.

(5) ඉහත සඳහන් සියල්ල ම ය.

**35.** නීතිමය තීරණ හා විධි විධාන ලබා ගැනීමේ දී ඉමාම්වරයකුගේ කොන්දේසි පිළිපදින්නා,

(1) මුජ්තහිද් බිල් පත්වා ය.

(2) මුජ්තහිද් බිල් මද්හබ් ය.

(3) මුජ්තහිද් මුන්තසිබ් ය.

(4) මුජ්තහිද් මුත්ලක් ය.

(5) මුජ්තහිද් බිල් මාසාඉල් ය.

**36.** ආහාද් වර්ගයට අයත් හදීස් අතර ඉස්නාද්හි දක්නට ලැබෙන ගිලිහීම් මත වර්ගීකරණය කරන ලද හදිස් වර්ග දෙක කුමක් ද?

(1) මුර්සල් - මර්ෆූඋ
(2) මෂ්හූර් - මක්තූඋ
(3) මුඅල්ලක් - මව්කූෆ්
(4) මුන්කතිඋ - මුඅල්ලත්
(5) අල්මෂ්හූර් - අල්අසීස්

**37.** ඉජ්මාඋස් සුකූති සම්බන්ධ වඩාත් ම නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) මුජ්තහිද් සැමදෙනා ම ඒකමතික ව එකම මතයකට පැමිණීම ය.
(2) මුජ්තහිද්වරු සැමදෙනාම තම තමන්ගේ මත පැහැදිලිව ප්‍රකාශ කර තිබීම ය.
(3) සමහර මුජ්තහිද්වරුන් තම මතය ප්‍රකාශ කරන අතරතුර සමහර මුජ්තහිද්වරුන් එම මතය පිළිගෙන ප්‍රකාශයක් නොකොට නිශ්ශබ්දව සිටීම ය.
(4) යම් කරුණක් සම්බන්ධ ව මුජ්තහින්දවරුන්ගෙන් එක් පිරිසක් එක් මතයක් දරන විට තවත් පිරිසක් ඒ සම්බන්ධ ව වෙනත් ප්‍රතිවිරුද්ධ මතයක් දැරීම ය.
(5) මුජ්තහිද්වරුන්ගෙන් බහුතරයක් පිළිගැනීම ය.

**38.** වසරක් පුරා එළුවන් 400ක හිමිකරුවෙක් ඒ සඳහා ලබා දිය යුතු සකාත් ප්‍රමාණය

(1) එළුවන් දෙදෙනකි.
(2) එළුවන් තිදෙනකි.
(3) එළුවන් සිව්දෙනෙකි.
(4) එළුවන් පස්දෙනෙකි.
(5) එක් ගවයෙකි.

- අංක **39** සිට **44** දක්වා වූ ප්‍රශ්නවල දෙවර්ගයක ප්‍රකාශ ලබා දී ඇත. මෙසේ ලබා දී ඇති යුගලවලට මතු සඳහන් **(1), (2), (3), (4)** හා **(5)** අතුරින් වඩාත් ම නිවැරදි වචනය හෝ වාක්‍ය තෝරා එහි අංකය ලියන්න.

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| **1** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **2** | වැරදි ය. | නිවැරදි ය. |
| **3** | නිවැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | වැරදි ය. |
| **5** | නිවැරදි ය. | **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | **පළමුවැනි ප්‍රකාශනය** | **දෙවැනි ප්‍රකාශනය** |
|---|---|---|
| **38.** | ඉල්හාද් සංකල්පය පළමු ව හනීෆ්වරුන් විසින් ඇති කරන ලදී. | අබ්දුල්ලා හ් ඉබුනු උබෙ මුල්හිද් වරුන්ගෙන් එක් අයෙකි. |
| **40.** | කවාරිජ්වරු සිෆ්ෆීන් යුද්ධයේ දී බිහි වූ කණ්ඩායමකි. | පළමු කලීෆා විය යුතු ව තිබුණේත් ඉමාම් විය යුතු ව තිබුණේත් අලි (රලි) තුමන් ය යන මතයේ පිහිටා සිට බිහි වූවෝ ෂියාවරුන් ය. |
| **41.** | මක්කී හා මදනි වාක්‍යය අර්ථය හා භාෂා ශෛලය අතරින් එක සමාන ය. | අල්කුරාන් හි නාසික්-මන්සූක් වශයෙන් සමහර වාක්‍ය දක්නට ඇත. |
| **42.** | මුජ්තහිද් මුත්ලක් යනු ඉජ්තිහාද් සිදු කිරීමට පළමු පෙළේ සුදුසුකම ලැබුවන් ය. | කියාස් හා සහාවරුන්ගේ ඉජ්මා සම මට්ටමෙන් සැලකේ. |
| **43.** | සිය ස්වාමි පුරුෂයා මිය යන විට බිරිඳ වඩා මහලුවියට පත්ව ඇති නම් මාස 4 දින 10ක ඉද්දා කාලය අත්‍යාවශ්‍ය නොවේ. | තලාක් ලැබූ ස්ත්‍රියක් කුර්උ තුනක් ඉද්දා අනිවාර්යයෙන්ම සිටිය යුතු ය. |

**44.** ඉස්ලාමික ඉතිහාසයේ බිහි වූ අකීදා ප්‍රතිපත්ති හා බැඳුනු කොටස් අතර කවාරිජ්වරුන්,මුඃතසිලාවරුන් සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශවලින් වඩාත් ම ගැළපෙන ප්‍රකාශය වන්නේ කුමක් ද?

(1) පළමු කාණ්ඩය අලි (රලි) කලීෆා ලෙස පත් වී සිටිය යුතු බවත්, දෙවන කාණ්ඩය සැඟවී ගිය ඉමාම් මුහම්මද් අස්කර් නැවත පැමිණේ යැයි විශ්වාස කරයි.

(2) පළමු කාණ්ඩය ෂෆාත්අත් තිබෙන බවත්, දෙවන කාණ්ඩය අල්කුර්ආන් නිර්මාණයක් ලෙසත් සලකයි.

(3) පළමු කාණ්ඩය බහුතරයක් සහාබිවරුන්ව කාෆීර් ලෙසත් දෙවන කාණ්ඩය අවසන් දිනයේ දී අල්ලාහ් දර්ශනය කර ගත හැකි බවත් විශ්වාස කරයි.

(4) පළමු කාණ්ඩය මහා පාපක්‍රියාවල යෙදුන අය කාෆීර් වන බවත් දෙවන කාණ්ඩය අකීදා සංකල්ප ස්වයං බුද්ධිය තුළින් වටහා ගත යුතු බවත් විශ්වාස කරයි.

(5) පළමු කාණ්ඩය අලි (රලි), උස්මාන් (රලි) වැනි සහාබිවරුන් යුක්තිසහගත අය බවත්, දෙවන කාණ්ඩය මහා පාපීය ක්‍රියා කළ අය මුඃමිනුත් නොවේ කාෆිර් ද නොවේ යන මතය දරයි.

**45.** ෆික්හ් ක්ෂේත්‍ර ඉතිහාසයේ ඉජ්තිහාද් කිරීමේ අවස්ථා අවුරා දැමීම නිසා සිදු වූ අනිටු විපාකවලින් එකක් වන්නේ කුමක් ද?

(1) මුජ්තහිද් මුත්ලක්වරුන් එක දිගට ම බිහි වීම.

(2) තක්ලීද් මානසිකත්වයෙන් සමාජය නිදහස් වීම.

(3) මද්හබ් සංකල්ප ග්‍රන්ථාරූඪ වීම.

(4) මද්හබ් සංකල්පවලින් බැහැර වීම.

(5) කාලීන ප්‍රශ්නවලට විසඳුම් ලබාදීම.

**46.** ඉස්හාක් ඉබ්නු රාහවෙහි (රහ්), අලි ඉබ්නු මදීනි (රහ්) යන ගුරුවරුන්ගෙන් අධ්‍යාපනය ලබා හදීස් ක්ෂේත්‍රයේ වියතුන් වූයේ,

(1) ඉමාම් බුහාරි (රහ්) ය.

(2) ඉමාම් මුස්ලිම් (රහ්) ය.

(3) ඉමාම් අබුදාවුද් (රහ්) ය.

(4) ඉමාම් ඉබ්නුමාජා (රහ්) ය.

(5) ඉමාම් තිර්මිති (රහ්) ය.

**47.** කලීෆා අබුබකර් (රලි) තුමාගේ සමයේ අල්කුර්ආනය ඒකරාශී කරනු ලැබීමට හේතු වූ කරුණු අතර වඩාත් ම නිවැරදි කරුණ වන්නේ,

(1) අල්කුර්ආනය වනපොත් කළ හාෆිල්වරුන් බොහෝමයක් මරණයට පත්වීම ය.

(2) අල්කුර්ආනය පාරායනය කිරීමෙහි ලා වෙනස්කම් ඇති වීම ය.

(3) අහ්ලුස් සුන්නා - ශීආ වැනි කණ්ඩායම් බිහි වීම ය.

(4) හුදයිෆුතුල් යමානි (රලි) තුමා විසින් උපදෙස් ලබා දීම ය.

(5) නබි (සල්) තුමන් මරණයට පත් වීම ය.

**48.** අපරාධ හා දඬුවම් පිළිබඳ පහත දැක්වන ප්‍රකාශවලින් ඉස්ලාමීය දෘෂ්ටියෙන් වැරදි ප්‍රකාශ වන්නේ කුමක් ද?

(1) අල්ලාහ් සහ රසුල් විසින් අනිවාර්ය කළ දෙයක් නොකර පැහැරහැරීම හෝ තහනම් කළ දෙයක් කිරීමත් වරදක් සේ සැලකීමය.

(2) ''අල් හදූද්'' යනු දඬුවම් මොනවා දැයි යන්න නිර්ණය කර ඇති අපරාධවලට ය.

(3) හුදුද් හා සම්බන්ධ අපරාධයක දී ඒ සඳහා වූ දඬුවම් අපරාධකරුවන්ගේ ස්වභාවය අනුව වෙනස් වන සුලු ය.

(4) විනිශ්චය කරනු ලබන දඬුවම අපරාධ සිදුනොවී වළක්වාලන එකක් විය යුතු ය.

(5) ඉස්ලාමීය දඬුවම් තනි පුද්ගලයන්, ආරක්ෂා කිරීම ඉලක්ක කොට ඇත.

**49.** පහත සඳහන් කරුණු අතුරින් ''අර්කානුල් කියාස්'' හා සම්බන්ධ වඩාත් ම නිවැරදි කාණ්ඩය කුමක් ද?

(1) අස්ල්, ෆරු, ඉල්ලත්, හුත්ම්

(2) අස්ල්, ඉල්ලත්, සබබ්, හුත්ම්

(3) ෆරු, ඉල්ලත්, උර්ෆ්, සනද්

(4) සනද්, හුක්ම්, ඉල්ලත්, සබබ්

(5) අස්ල්, ෆරු, වාජිබ්, ඉල්ලත්

**50.** ෆික්හ් කලාව හා සම්බන්ධව පහත සඳහන් ප්‍රකාශ අතර වඩාත් ම නිවැරදි ප්‍රකාශ වන්නේ කුමක් ද?

(1) ඉමාම් මලික් (රහ්) තුමා සිය නීති සම්පාදනය සඳහා කවුල් ජදීද්, කවුල් කදීම් යන පද යොදා ගෙන ඇත.

(2) ඉමාම් ෂාෆිඊ (රහ්) සහ ඉමාම් අබු හනිෆා (රහ්) යන දෙදෙනා නීති සම්පාදනයේ දී, එකම ප්‍රවේශ ප්‍රතිපත්තියක් අනුගමනය කළ හ.

(3) ඉමාම් අබු හනීෆා (රහ්) තුමා තම නීති සම්පාදනයේ දී බුද්ධියට මෙන් ම පර්යේෂණාත්මක තීරණවලට මුල්තැන දී ඇත.

(4) ඉමාම් අහමද් ඉබුණු හන්බල් (රහ්) තුමාගේ ''මජල්ලතුල් අහ්කාම් අල් අද්ලියා'' නම් වූ නීති ග්‍රන්ථයක් සම්පාදනය කළේ ය.

(5) ෆික්හුල් අක්බර් නම් වූ නීති ග්‍රන්ථය ෂාෆි මද්හබය මත පදනම් ව සම්පාදනය කර ඇත.

* * *

# (44) ඉස්ලාම්

II **පත්‍රය**

* **I** කොටසින් ප්‍රශ්න **දෙකක්ද**, **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරා ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**I කොටස**

**1. (i)** තස්කියතුන් නෆ්ස් යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02යි.)

**(ii)** තස්කියතුන් නෆ්ස් හි වැදගත්කම අල්කුර්ආන් වාක්‍ය හා අල් හදීස් වැකි උපුටා දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි.)

**(iii)** තස්කියතුන් නෆ්ස් තුළින් දෛනික ජීවිතයේ දී යමෙකුට ලැබෙන ප්‍රතිලාභ හතරක් සඳහන් කොට ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 06යි.)

**(iv)** තස්කියතුන් නෆ්ස් තවදුරටත් වර්ධනය කර ගැනීමට ඉවහල් වන මාර්ග හතරක් පැහැදිලි කොට ඒවායින් දෙකක් ඔබේ ජීවිතයේ ක්‍රියාත්මක කළ ආකාරය පහදන්න. (ලකුණු 08යි.)

**2. (i)** මුරාබහා සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 02යි.)

**(ii)** ව්‍යාපාරික කටයුතුවල තහනම් කර ඇති අංග හතරක් සඳහන් කර ඉන් දෙකක් සම්බන්ධ ව කෙටියෙන් පහදන්න. (ලකුණු 04යි.)

**(iii)** ඉපයීම සම්බන්ධයෙන් ඉස්ලාම් දක්වා ඇති වැදගත්කම සම්බන්ධ අල් කුර්අන් සහ අල් - හදීස් ඇතුළු තර්කානුකූල අදහස් තුනක් ගෙන හැර දක්වා ඒ සෑම එකක්ම පහදන්න. (ලකුණු 06යි.)

**(iv)** ආර්ථික විෂමතාව අවම කිරීමට ඉස්ලාම් දහම ඉදිරිපත් කළ විසඳුම් 4ක් සඳහන් කර ඒවායින් දෙකක් දෛනික ජීවිතය හා සම්බන්ධ කර පහදන්න. (ලකුණු 08යි.)

**3. (i)** මහ්රම් අජ්නබි යන පද නිර්වචනය කරන්න. (ලකුණු 02යි.)

**(ii)** විවාහ වීමේ වැදගත්කම සම්බන්ධ ඉස්ලාමීය ඉගැන්වීම් හතරක් ගෙන හැර දක්වමින් ඉන් දෙකක් සම්බන්ධ ව කෙටියෙන් පහදන්න. (ලකුණු 04යි.)

**(iii)** ස්වාමිපුරුෂයා ගේ හා බිරිඳගේ වගකීම් තුනක් වෙන් වෙන්ව ලැයිස්තුගත කර එම කරුණු යහපත් පවුල් ජීවිතයකට කෙසේ දායක වන්නේ ද යන්න ඉස්ලාමීය ඉගැන්වීම් මත සාධාරණීකරණය කරන්න. (ලකුණු 06යි.)

**(iv)** පවුල් ජීවිතයේ දී උද්ගත වන ප්‍රශ්න වළක්වා ගැනීම සඳහා පිටිවහලක් වන ඉස්ලාමීය මඟ පෙන්වීම් හතරක් සඳහන් කර ඒවා ප්‍රායෝගික ජීවිතයේ දී අනුගමනය කළ යුතුය යන්න සනාථ කිරීමට ඔබගේ පාර්ශ්වයෙන් සාධාරණීකරණය කළ හැකි කරුණු හතරක් ඉදිරිපත් කරන්න. (ලකුණු 08යි.)

## II කොටස

**4. (i)** ජාතීන් අතර සහජීවනය හා සංහිඳියාව ඇති කිරීමට ඉස්ලාම් හඳුන්වා දෙන ආදර්ශ පහක් සඳහන් කර ඒවා ශ්‍රී ලංකාවේ ප්‍රායෝගික ව ක්‍රියාත්මක කළ හැකි ආකාරය නිදසුන් සමගින් විස්තර කරන්න.
(ලකුණු 10යි.)

**(ii)** ආගමික හා සමාජීය සංහිඳියාව ක්‍රියාවට නැංවීමේ දී ඒ සඳහා මස්ජිද්වල දායකත්වය හා සම්බන්ධ කරුණු පහක් සඳහන් කර ඒවා ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීමට අවශ්‍ය කරන යෝජනා පහක් ඉදිරිපත් කොට විස්තර කරන්න. (ලකුණු 10යි.)

**5. (i)** ඉස්ලාමීය නීති සම්පාදනයේ දී සුන්නාහි වැදගත්කම උදාහරණ පහක් මගින් විස්තර කරන්න.
(ලකුණු 10යි.)

**(ii)** ෆික්හ් ක්ෂේත්‍රයේ මතු විය හැකි මතභේදාත්මක අවස්ථා වල දී මුස්ලිම්වරයෙකු අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙත් පහක් සඳහන් කර ඒ සඳහා සුදුසු නිදසුන් ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න.
(ලකුණු 10යි.)

**6. (i)** ඉස්ලාම් දහම තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ පහක් සඳහන් කොට ඒ තුළින් ''ඉස්ලාම් යනු පරිපූර්ණ ජීවන ක්‍රමයකි'' යන්න සාධක සහිත ව ඔප්පු කරන්න. (ලකුණු 10යි.)

**(ii)** ඉස්ලාමීය අකීදාව තුළ හටගත් පරස්පර විරෝධී මත දරන කණ්ඩායම් පහක් සම්බන්ධ ව කෙටියෙන් විස්තර කොට ඒවා සමාජය තුළ ඇති කළ අනිටු විපාක පහක් පහදන්න. (ලකුණු 10යි.)

**7. (i)** මකාසිදුෂ් ෂරීආ යනු කුමක්ද? මෙම ක්ෂේත්‍රයට අදාළ ඉතිහාසය කෙටියේ පහදන්න. (ලකුණු 10යි.)

**(ii)** මකාසිදුෂ් ෂරීආ හි පාරම්පික වර්ගීකරණ තුන ම නම් කොට එම කරුණු එකින් එක පහදන්න.
(ලකුණු 10යි.)

**8.** පහත සඳහන් මාතෘකා සම්බන්ධ ව කෙටි සටහන් ලියන්න.

**(i)** බයිතුල් මාල් (ලකුණු 05යි.)

**(ii)** මුජ්තහිද්වරුන් හා ඔවුන්ගේ වර්ගීකරණය (ලකුණු 05යි.)

**(iii)** ශ්‍රී ලංකාවේ ඉස්ලාම්හි හඳුන්වාදීම (ලකුණු 05යි.)

**(iv)** අත්තෘමීන් (ලකුණු 05යි.)

* * *

# (45) බෞද්ධ ශිෂ්ටාචාරය

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

**I පත්‍රය -** **කාලය : පැය 02යි.**

වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න **50කි.** ප්‍රශ්න **සියල්ලට** ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **01** බැගින් **මුළු ලකුණු 50කි.**

**II පත්‍රය -** **කාලය : පැය 03යි.** (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10යි.)

මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත වේ.

I කොටස - අර්ධ ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **තුනකි.** ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40කි.

II කොටස - රචනා වර්ගයේ ප්‍රශ්න **පහකි.** ප්‍රශ්න **තුනකට** පිළිතුර සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 60කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු 40 + 60 = 100

| | | | |
|---|---|---|---|
| අවසාන ලකුණ ගණනය කිරීම : | I පත්‍රය | = | 50 |
| | II පත්‍රය | = | 100 ÷ 2 = 50 |
| | අවසාන ලකුණ | = | 100 |

**I පත්‍රය**

**සැලකිය යුතුයි :**

* **සියලු** ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* **නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න (විභාගයේ දී පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ.)

---

**1.** කුලවාදය භාරතීය සමාජයේ තහවුරු කිරීම සඳහා බ්‍රාහ්මණයන් විසින් යොදාගත් ප්‍රධානතම ආගමික ඉගැන්වීම වූයේ,

(1) වර්ණ ධර්මය යි. (2) ආශ්‍රම ධර්මය යි. (3) ස්ව ධර්මය යි.
(4) ආපද් ධර්මය යි. (5) යාගය යි.

**2.** වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් නැගී සිටීමට ඈත අතීතයේ සිටම ජනතාව පෙළඹී තිබේ. භාරතීය ස්වදේශීය ජනතාවගේ වෘත්තීය නිදහස සීමා කිරීමට බමුණන් විසින් යොදා ගත් ප්‍රමුඛ ඉගැන්වීම වූයේ,

(1) කුල භේදය යි. (2) ආශ්‍රම ධර්ම න්‍යාය යි.
(3) කුලහීනයන්ට අධ්‍යාපනය තහනම් කිරීම යි. (4) ස්වධර්ම න්‍යාය යි.
(5) පූජක ඒකාධිකාරය යි.

**3.** භාරතීය ආගමික හා දාර්ශනික පරිසරය තුළ ශ්‍රමණ සම්ප්‍රදාය බිහි වූයේ බ්‍රාහ්මණ ඉගැන්වීම් ප්‍රතික්ෂේප කරමින් ඊට ප්‍රතිචාරයක් වශයෙනි. එහෙත් ඇතැම් බ්‍රාහ්මණ ඉගැන්වීම් ශ්‍රමණ සම්ප්‍රදාය විසින් සපුරා ප්‍රතික්ෂේප නො කරන ලදබව ද ෂට් ශාස්තෘන්ගේ ඉගැන්වීම් පරීක්ෂා කිරීමෙන් පැහැදිලි වේ. මේ අනුව ඇතැම් ශ්‍රමණයන් විසින් ද පිළිගත් බ්‍රාහ්මණ ඉගැන්වීමක් ලෙස හඳුනා ගත හැක්කේ,

(1) ඊශ්වර නිර්මාණවාදය යි. (2) කුලභේදය යි. (3) නිදහස් චින්තනය යි.
(4) යාගය යි. (5) කර්ම විපාක පිළිගැනීම යි.

**4.** බුද්ධ කාලීන භාරතයේ විවිධ ආගමික සංවිධාන පැවති අතර ශ්‍රමණ සම්ප්‍රදාය ඉන් ප්‍රමුඛ වේ. ඔවුන් අතර විවිධ දාර්ශනික සංකල්ප ඉදිරිපත් කළ ප්‍රකට ශාස්තෘවරුන් විසූ බව සාමඤ්ඤඵල සූත්‍රය ආදී මූලාශ්‍රයන්හි දැක්වේ. එකී තොරතුරුවලට අනුව පූරණ කස්සප ආචාර්යවරයා විසින් ඉදිරිපත් කරන ලද දර්ශනවාදය ලෙස සැලකෙන්නේ,

(1) අමරාවික්ඛේපවාදය යි. (2) නියතිවාදය යි. (3) අකිරියවාදය යි.
(4) පුබ්බේකතහේතුවාදය යි. (5) අධිච්චසමුප්පන්නවාදය යි.

**5.** "නත්ථි මහාරාජ හේතු, නත්ථි පච්චයෝ සත්තානං සංකිලේසාය අහේතු අප්පච්චයා, සත්තා සංකිලිස්සන්ති නත්ථි හේතු නත්ථි පච්චයෝ සත්තානං විසුද්ධියා ............" යනාදී ඉගැන්වීම ඉදිරිපත් කළ ශාස්තෘවරයා වූයේ,

(1) අජිත කේසකම්බලී ය. (2) මක්ඛලී ගෝසාල ය. (3) පූරණ කස්සප ය.
(4) පකුධ කච්චායන ය. (5) සංජය බෙල්ලට්ඨිපුත්ත ය.

**6.** බුද්ධකාලීන භාරතයේ පැවති සොළොස් මහා ජනපද අතරින් උතුරෙන් ගංගා නදිය ද නැගෙනහිරින් චම්පා නදිය ද නිරිත දිගින් වින්ධ්‍යා කඳු වැටිය ද බටහිරින් සෝණ නදිය ද සීමා කොට ගත් රාජ්‍යය වූයේ,

(1) කෝසල රාජ්‍යය යි. (2) මගධ රාජ්‍යය යි. (3) වත්ස රාජ්‍යය යි.
(4) අවන්ති රාජ්‍යය යි. (5) කාසි රාජ්‍යය යි.

**7.** බුද්ධ ශ්‍රාවක භික්ෂූන්ගෙන් ධර්මය අසා තෙරුවන් සරණ ගිය බොහෝ රජවරු බුද්ධ කාලීන භාරතයේ විසූහ. ඒ අතරින් උදේන රජතුමා තෙරුවන් සරණ ගියේ,

(1) මහා කච්චායන තෙරුන්ගෙන් ධර්මය ඇසීමෙනි.
(2) අස්සජි තෙරුන්ගෙන් ධර්මය ඇසීමෙනි.
(3) පිණ්ඩෝල භාරද්වාජ තෙරුන්ගෙන් ධර්මය ඇසීමෙනි.
(4) සැරියුත් තෙරුන්ගෙන් ධර්මය ඇසීමෙනි.
(5) මුගලන් තෙරුන්ගෙන් ධර්මය ඇසීමෙනි.

**8.** ලෝකය ස්වභාව වශයෙන් ද සමුදය වශයෙන් ද නිරෝධ වශයෙන් ද මාර්ග වශයෙන් ද සියලු ආකාරයෙන් තමන් විසින්ම අවබෝධ කළ බැවින් බුදුරජාණන් වහන්සේ සුවිශේෂ ගුණයකින් යුක්ත විය. එම ගුණය හැඳින්වෙන්නේ,

(1) බුද්ධ බුදු ගුණය යනුවෙනි. (2) සම්මා සම්බුද්ධ බුදු ගුණය යනුවෙනි.
(3) සුගත බුදු ගුණය යනුවෙනි. (4) ලෝකවිදූ බුදු ගුණය යනුවෙනි.
(5) භගවා බුදු ගුණය යනුවෙනි.

**9.** ක්‍රි.පූ. 6 වන සියවසේ ලොව පහළ වූ ශ්‍රේෂ්ඨතම ගුරුවරයා ලෙස ගෞතම බුදුරජාණන් වහන්සේ සලකනු ලබයි. උන්වහන්සේ ධර්ම දේශනා කිරීමේදී තමා වෙත පැමිණෙන ප්‍රශ්න, ක්‍රම හතරකට විසඳූ බව දැක්වේ. එහිලා පටිපුච්ඡා ව්‍යාකරණ ක්‍රමය යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) ඍජු පිළිතුරු සැපයීමේ ක්‍රමය යි.
(2) විශ්ලේෂණාත්මක ව පිළිතුරු සැපයීමේ ක්‍රමය යි.
(3) ප්‍රති ප්‍රශ්න අසා පිළිතුරු සැපයීමේ ක්‍රමය යි.
(4) පිළිතුරු නො දී නිහඬ ව සිටීමේ ක්‍රමය යි.
(5) තමන් වහන්සේගේ අදහසට අනුව පිළිතුරු සැපයීමේ ක්‍රමය යි.

**10.** බුදුරජාණන් වහන්සේ භික්ෂු භික්ෂුණීන් වහන්සේලාගේ විවිධ කුසලතා අගයමින් අගතනතුරු පිරිනැමූ බවට ශාසන ඉතිහාසය සාක්ෂි දරයි. ඒ අනුව ධර්ම ඥානය හා අත්දැකීම් බහුලත්වය නිසා චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර අගතනතුරට පත් වූයේ,

(1) ඛේමා රහත් තෙරණින් වහන්සේ ය.
(2) උප්පලවණ්ණා රහත් තෙරණින් වහන්සේ ය.
(3) පටාචාරා රහත් තෙරණින් වහන්සේ ය.
(4) මහා ප්‍රජාපතී ගෝතමී රහත් තෙරණින් වහන්සේ ය.
(5) කිසාගෝතමී රහත් තෙරණින් වහන්සේ ය.

**11.** බුද්ධකාලීන ඇතැම් භික්ෂු භික්ෂුණීන් අතින් සිදු වූ ශාසන විරෝධී ක්‍රියා නිසා බුදු සසුනේ චිරස්ථිතිය වෙනුවෙන් විනය ශික්ෂාපද පනවන ලදි. කම්මක්ඛන්ධකයෙහි එවැනි සුවිශේෂ විනය නීති පද්ධතියක් දක්නට ලැබේ. ධර්මඥානයෙන් පිරිපුන් සැදැහැවත් උපාසකයෙකුට ගැරහීම නිසා සුධම්ම නම් භික්ෂුවට බුදුරදුන් විසින් පටිසාරණීය කර්මය නම් දණ්ඩනය පනවන ලද බව එහි සඳහන් වේ. එම සිද්ධියට මුල් වූ උපාසකතුමා වූයේ,

(1) චිත්ත ගහපතිතුමා ය. (2) නකුල පිතා ය. (3) අනේපිඬු සිටුතුමා ය.
(4) ධනංජය සිටුතුමා ය. (5) මිගාර සිටුතුමා ය.

**12.** එක්තරා පාසලක අ.පො.ස (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල නිකුත් වූ විට සිසුන් අතර ඇති වූ කතාබහක් පහත දැක්වෙන අතර එයින් පුද්ගල ස්වාමිත්වය පිළිබිඹුවන ප්‍රකාශය වන්නේ,

(1) "දෙයියන්ගෙ පිහිටෙන් මම නම් විභාගෙ පාස්." යන්න යි.
(2) "හිතුවෙවත් නැති විදියට මාත් පාස්." යන්න යි.
(3) "විභාගෙට හොඳින් සූදානම් වූ නිසා හොඳ සාමාර්ථයක් මට ලැබුණා." යන්න යි.
(4) "කරුමයක් පල දීලා වෙන්නැති මම ෆේල්." යන්න යි.
(5) "මම නම් පාස් වුණේ සරත් සර්ගෙ පිහිටෙන්." යන්න යි.

**13.** සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ආකල්පය පැහැදිලි කරන දීඝ නිකායාගත අග්ගඤ්ඤ සූත්‍රයට අනුව විවිධ හේතු කරණ කොට ගෙන සමාජය පරිණාමයට පත්වීමෙන් පවුල ද කුල ක්‍රමය ද රාජ්‍යය ද ඇතුළත් සමස්ත සමාජය නිර්මාණය විය. එම විස්තරයට අනුව සමාජ නිර්මාණයෙහි ලා බුදුසමය අවධාරණය කරන ප්‍රධාන සාධකය ලෙස හඳුනාගත හැක්කේ,

(1) කර්ම විපාක සිද්ධාන්තය යි. (2) ස්වභාවවාදය යි. (3) නිර්මාණවාදය යි.
(4) නියතිවාදය යි. (5) හේතුඵලවාදය යි.

**14.** සමාජයේ දුගීභාවය දුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීමත්, අපරාධ මර්දනය කොට සමාජය තුළ සාමය පවත්වාගෙන යාමත්, සිල්වත් ගුණවත් බහුශ්‍රැත උතුමන්ගෙන් අවවාද අනුශාසනා ලබා ගැනීමත් යන උපදේශ ඇතුළත් බෞද්ධ දේශපාලන මූලධර්මය,

(1) දස සක්විති වත යි. (2) සප්ත අපරිහානීය ධර්මය යි.
(3) දසරාජ ධර්මය යි. (4) කූටදන්ත සූත්‍රාගත දේශපාලන න්‍යාය යි.
(5) පංච ශීලය යි.

**15.** පහත සඳහන් කරුණු අතරින් හොඳ නරක විනිශ්චයෙහි ලා නිර්ණායකයක් ලෙස සැළකිය **නො හැක්කේ,**

(1) කැඩපතෙන් තමාම තම සිරුර ප්‍රත්‍යවේක්ෂා කරන්නා සේ තම කායික, වාචසික, මානසික ක්‍රියා ප්‍රත්‍යවේක්ෂණය කළ යුතු ය යන්න යි.
(2) තමා උපමා කොට අනුන්ට හිංසා පීඩා නො කළ යුතු ය යන්න යි.
(3) මෙලොව පරලොව වශයෙන් විපාකය පිළිබඳ විමසා කටයුතු කළ යුතුය යන්න යි.
(4) තමා පිළිබඳ, සමාජය පිළිබඳ, ධර්මය පිළිබඳ සලකා බලා කටයුතු කළ යුතු ය යන්න යි.
(5) සියලු සංස්කාරයෝ නැසෙන සුළු හෙයින් අප්‍රමාදීව කටයුතු කළ යුතු ය යන්න යි.

**16.** පින් පව්, කුසල් අකුසල් හැඳින ගනිමින් හොඳ නරක විනිශ්චය කිරිමෙහි ලා භාවිත බෞද්ධ නිර්ණායක ගණයට ඇතුළත් ධම්ම පද දේශනාව වනුයේ,

(1) මෝඩයා තමා කළ පව් මෝරා විපාක දෙනතෙක් එය මී පැණි මෙන් සලක යි යන්න යි.
(2) තමාට අහිත වූ අයහපත් දේ ලෙහෙසියෙන් කළ හැකිය යන්න යි.
(3) ක්‍රෝධ කරන්නා ක්‍රෝධ නො කිරීමෙන් දිනිය යුතුය යන්න යි.
(4) පසුතැවීමෙන් කඳුලු පිරි දෙනෙතින් විපාක විඳීමට සිදුවන ක්‍රියා නො කිරීම මැනවි යන්න යි.
(5) අසත් පුරුෂයා සත් පුරුෂකමින් දිනිය යුතුය යන්න යි.

**17.** අවිවාහක දැහැමි ජීවිතයක් ගත කළ ධර්මසේන මහතා පසුගිය දින හදිසි හෘදයාබාධයකින් මිය ගියේ ය. එය ප්‍රදේශයේ බොහෝ දෙනාගේ සංවේගයට හේතු විය. ඔහුගේ අවමංගල උත්සවයේදී විහාරස්ථානයේ විහාරාධිපති හිමිපාණෝ දීර්ඝ අනුශාසනාවක් කළහ. "ධර්මසේන මහතා පින් පව් හොඳින් තේරුම් ගෙන, ලජ්ජා බය ඇතිව ජීවත් වූ අයෙක්, එතුමා කිසි විටකත් අනුන්ගේ කිසිම දෙයක් සොර සිතින් ලබා ගත්තේ නැහැ. කුරා කුහුඹියෙකුගේ වත් ජීවිතයක් විනාශ කිරීමට බය වූ අයෙක්, කඩපිල් ගානේ ඕපා දූප කියමින් කාලෙ කා දැම්මේ නැහැ. හැකි හැම විටම අනුන්ට උදව් කරමින් සමගියෙන් ජීවත් වුණා. කෙනෙකුගේ දුකකදී කරදරයකදී ඔහු සැම විටම තම ධනය ඒ වෙනුවෙන් කැප කෙළේ නිර්ලෝභීව යි. ආගමට දහමට ලැදිව, තෙරුවන් කෙරෙහි පැහැදීමෙන් කර්මඵල විශ්වාස කරගෙන  කටයුතු කළා." යනාදී වශයෙන් ඔහුගේ ගුණ වර්ණනා කොට නිවන් සුව ප්‍රාර්ථනා කළහ. මේ ප්‍රකාශයෙහි දස කුසල්වලට ගැනෙන කරුණු,

(1) තුනක් ඇතුළත් වේ. (2) හතරක් ඇතුළත් වේ. (3) පහක් ඇතුළත් වේ.
(4) අටක් ඇතුළත් වේ. (5) දහයක් ඇතුළත් වේ.

**18.** රුවන්ගිරි මධ්‍ය මහා විද්‍යාලයේ බෞද්ධ ශිෂ්‍ය සංගමයේ රැස්වීම මසකට වරක් පැවැත් වෙයි. එහිදී විදුහල්පතිතුමා අනුශාසනාවක් පවත්වමින්,

" ගුණ ගරුක යහපත් දරුවන් වීමට නම් තමා වරදින් වැලකී, අනුන් වරදින් වලක්වා, අනුන් කරන වරදට අනුබල නො දී කටයුතු කළ යුතු බවත් එම අවබෝධය ඇති දරුවා තමන්ටත් අනුන්ටත් වරදක් නො කරන බවත්" සඳහන් කෙළේය. මේ තුළින් කියැවෙන බෞද්ධ සදාචාර මූලධර්මය වන්නේ,

(1) අත්තූපනායික ධර්ම පර්යාය යි. (2) ත්‍රිකෝටි පාරිශුද්ධි සීලය යි. (3) පංචසීල ප්‍රතිපත්තිය යි.
(4) ත්‍රිවිධ අධිපති ධර්මය යි. (5) විරතිය හා සමාදානය යි.

**19.** පුද්ගල චර්යා පාලනය කිරීමෙහි ලා නීතිය ප්‍රබල සාධකයකි. නීතිය සමාජ සම්මතයකි. එම සම්මතයන් නො ඉක්මවා ක්‍රියා කිරීම බුදුසමය තුළ වැදගත්කොට සලකා තිබේ. මේ අදහස ඉස්මතු වන බෞද්ධ මූලධර්මය වන්නේ,

(1) සප්ත ආර්ය ධනය යි. (2) දස රාජ ධර්මය යි. (3) සතර බ්‍රහ්ම විහරණය යි.
(4) සතර සංග්‍රහ වස්තුව යි. (5) සප්ත අපරිහානීය ධර්මය යි.

**20.** ජීවත්වීමේ අයිතිය, සම්පත් රැක ගැනීමේ අයිතිය, සාර්ථක පවුල් ජීවිතයක් ගත කිරීමේ අයිතිය මෙන්ම සමාජය තුළ විශ්වාසයත්, සහජීවනයත් ස්ථාපිත කිරීමට අනුබල දෙන මූලික බෞද්ධ ඉගැන්වීමක් ලෙස හඳුනා ගත හැක්කේ,

(1) බෝධිසත්ත්ව ප්‍රතිපදාව යි. (2) නිර්වාණගාමී මාර්ගය යි. (3) සම්මා ආජීවය යි.
(4) පංචශීල ප්‍රතිපදාව යි. (5) අත්තූපනායික ධර්ම පර්යාය යි.

**21.** සෞන්දර්ය රසාස්වාදය බුදුසමයට අනුචිත නො වූවකි. තථාගතයන් වහන්සේ මෙන්ම විරාගී යතිවරුන් ද නිරාමිස සෞන්දර්යාස්වාදය කළ බව බෞද්ධ මූලාශ්‍රය තුළ දක්නට ලැබේ. එහි සෞන්දර්ය රසාස්වාදයේ මූලිකම පදනම ලෙස දක්වා ඇත්තේ,

(1) ප්‍රසාදය හා නිර්වේදය ඉපදවීම යි. (2) සුඛාස්වාදය ජනිත කරවීම යි.
(3) ඉන්ද්‍රිය පිනවීම යි. (4) ආමිස සුවය විඳ ගැනීම යි.
(5) විරාගය ඇති කිරීම යි.

**22.** 'දැහැමි ව උපයා ගන්නා ලද ධනය අර්ථාන්විත ව පරිභෝජනය කළ යුතුය' යන්න බෞද්ධ ඉගැන්වීමයි. එහිලා බුදු සමය විවිධ පරිභෝජන සිද්ධාන්ත ඉදිරිපත් කොට ඇති අතර පඤ්චබලි සංකල්පය ද ඒ අතර ප්‍රමුඛ ඉගැන්වීමකි. එහි 'අතිථි බලි' යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) ඥාතීන් විෂයයෙහි යුතුකම් ඉටු කිරීම යි.
(2) ආගන්තුකයින් විෂයයෙහි යුතුකම් ඉටු කිරීම යි.
(3) වැඩිහිටියන් විෂයයෙහි යුතුකම් ඉටු කිරීම යි.
(4) ආගම විෂයයෙහි යුතුකම් ඉටු කිරීම යි.
(5) මිය ගිය ඥාතීන් විෂයයෙහි යුතුකම් ඉටු කිරීම යි.

**23.** "නිවැරදි කාය වාග් මනඃ කර්මයන්ගෙන් යුක්ත වූ ආර්ය ශ්‍රාවකයා සැපයට පැමිණෙයි. සොම්නසට පැමිණෙයි." අනණ සූත්‍රාගත ඉහත සැපය හඳුන්වන්නේ,

(1) අත්ථි සුඛ ලෙස යි. (2) භෝග සුඛ ලෙස යි. (3) අනණ සුඛ ලෙස යි.
(4) අනවජ්ජ සුඛ ලෙස යි. (5) නිරාමිස සුඛ ලෙස යි.

**24.** සිගාල ගෘහපති පුත්‍රයා පියාගේ අවවාදය අනුව අළුයම පිබිදී දිය නා පිරිසිදු වී සිදු කළ දිසා නමස්කාරය දුටු බුදුරජාණන් වහන්සේ එම ක්‍රියාව අර්ථ ශූන්‍යබවත්, නිසි පරිදි සදිසා වන්දනය යනු ස්ථායී සංස්ථාවන් උදෙසා යුතුකම් හා වගකීම් ඉටු කිරීම බවත් පෙන්වා දුන්හ. ඒ අනුව දකුණු දිශාවෙන් නියෝජනය වන්නේ,

(1) මහණ බමුණන් ය. (2) මවුපියන් ය. (3) අඹු දරුවන් ය.
(4) ගුරුවරුන් ය. (5) මිතුරන් ය.

**25.** "ධර්මයට කැමති වන්නා දියුණුවට පත්වේ. ධර්මයට අකැමති වන්නා පිරිහීමට පත්වේ" යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. එම දේශනාව අන්තර්ගත සූත්‍රය වන්නේ,

(1) වසල සූත්‍රය යි. (2) පරාභව සූත්‍රය යි. (3) වේළුද්වාර සූත්‍රය යි.
(4) මංගල සූත්‍රය යි. (5) බාලපණ්ඩිත සූත්‍රය යි.

**26.** බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩ වාසය කරද්දී එක්තරා දේවතාවෙක් උන්වහන්සේ හමුවට පැමිණ මංගල කරුණු කවරේ දැයි ප්‍රශ්න කළවිට මංගල සූත්‍රය දේශනා කළහ. එම සූත්‍රයෙහි මංගල කරුණු 38 ක් අන්තර්ගත වන අතර ඉන් එක් මංගල කරුණක් වන්නේ,

(1) ඉවසීම යි. (2) මෛත්‍රිය යි. (3) සත්‍යවාදී බව යි.
(4) උත්සාහය යි. (5) කරුණාව යි.

**27.** **න පරෙසං විලෝමානි - න පරෙසං කතාකතං**
**අත්තනාව අවෙක්ඛෙය්‍ය - කතානි අකතානි ච**

ඉහත ධම්මපද ගාථාවේ අදහස වන්නේ,

(1) අනුන්ගේ පිහිට නො පතා තමාට තමාම පිහිට විය යුතු බව ය.
(2) අනුන්ගේ කටයුතු ගැන නො සොයා තමන්ගේ කටයුතු ගැන සෙවිය යුතු බව ය.
(3) තමන් උපමා කොට අනුන්ට හිංසා නො කළ යුතු බව ය.
(4) තමාගේ මෙන්ම මෙරමාගේ යහපත උදෙසා කටයුතු කළ යුතු බව ය.
(5) තමාට මෙන්ම අනුන්ට ද ධර්මය හැර පිහිටක් නැති බව ය.

**28.** "ජිනෙ කදරියං දානේන" - යන ගාථා පදයෙන් කියැවෙන ධර්මෝපදේශය වන්නේ,

(1) ක්‍රෝධ කරන්නා ක්‍රෝධ නො කිරීමෙන් දිනන්නේ ය යන්න යි.
(2) හිංසා කරන්නා මෛත්‍රියෙන් දිනන්නේ ය යන්න යි.
(3) තද මසුරා තමා සතු දෑ දීමෙන් දිනන්නේ ය යන්න යි.
(4) බොරු කියන්නා සත්‍ය කීමෙන් දිනන්නේ ය යන්න යි.
(5) අයහපත් පුද්ගලයා යහපතින් දිනන්නේ ය යන්න යි.

**29.** සම්මා සම්බුද්ධත්වයට පත් වී නොබෝ කලකින් ම ධර්ම දූත සේවාව ආරම්භ කිරීමට බුදුරජාණන් වහන්සේ විසින් තීරණය කරන ලද්දේ,

(1) බුදුරදුන්ගේ ම අදහසකට අනුව ය.
(2) රහත් හැට නමගේ ඉල්ලීමට අනුව ය.
(3) සහම්පතී බ්‍රහ්මයාගේ ඉල්ලීමට අනුව ය.
(4) පස්වග මහණුන්ගේ ඉල්ලීමට අනුව ය.
(5) බිම්බිසාර රජුගේ ඉල්ලීමට අනුව ය.

**30.** ප්‍රථම ධර්ම සංගායනාවේදී ආනන්ද තෙරුන්ට චෝදනා පහක් එල්ල විය. බුදුරජාණන් වහන්සේට වැසි සළුවක් මැසීම හා සම්බන්ධ චෝදනාවක් ද ඒ අතර විය. උන්වහන්සේට එම චෝදනාව එල්ල වූයේ,

(1) වැසි සළුව සඳහා සුදුසු වස්ත්‍රයක් භාවිත නො කිරීම හේතුවෙනි.
(2) මාගමක් ලවා වැසි සළුව මැස්සවීම හේතුවෙනි.
(3) සළු මැසීම භික්ෂූන්ට අකැප වීම හේතුවෙනි.
(4) සළු මසා භාවිතයට ගැනීම බුදුරදුන් අනුමත නො කර තිබීම හේතුවෙනි.
(5) පයින් මැඩ ගෙන වැසි සළුව මැසීම හේතුවෙනි.

**31.** තමන් වහන්සේගේ ඇවෑමෙන් පසු ඡන්න හිමියන්ට බ්‍රහ්මදණ්ඩය පනවන්න යැයි බුදුරදුන් කරන ලද නියමයට අනුව ප්‍රථම සංගීතිකාරක තෙරවරු උන්වහන්සේට බ්‍රහ්මදණ්ඩය පැනවීමට තීරණය කළහ. බ්‍රහ්මදණ්ඩයේ ස්වභාවය ඇසූ ඡන්න හිමියන් සිහි සුන්ව ඇද වැටුණි. එහි දැක්වෙන බ්‍රහ්මදණ්ඩය යනු,

(1) වැඩ වසන ආරාමයෙන් නෙරපීම යි.
(2) වැඩ වසන ග්‍රාමයෙන් නෙරපීම යි.
(3) සිවුරු හරවා ගිහි බවට පත් කරවීම යි.
(4) කිසිදු ශාසනික කටයුත්තකට සහභාගි කරවා නො ගැනීම යි.
(5) කථා නො කිරීමත් අවවාද අනුශාසනා නො කිරීමත් මගින් බැහැර කිරීම යි.

**32.** කාලාශෝක රාජ්‍ය සමයේ සිදුකරන ලද දෙවන ධර්ම සංගීතියේදී නිෂ්ප්‍රභ කරන ලද දස අකැප වස්තුවේ දැක්වෙන “අමථිත කප්ප” යනුවෙන් අදහස් කරන ලද්දේ,

(1) නො පැසුණු සුරා පානය කිරීම කැප බව ය.
(2) වාටි නො මැසූ ඇතිරිලි භාවිතය කැප බව ය.
(3) කිරිත් නො වූ දීත් නො වූ කිරි වැළඳීම කැප බව ය.
(4) ආචාර්ය පරම්පරාවෙන් පැවත එන චිරාගත දේ හොඳ වුව ද, නරක වුව ද, එලෙසින්ම පිළිපැදීම කැප බව ය.
(5) පසුව අනුමැතිය ගැනීමේ අටියෙන් සංඝ කර්ම කිරීම කැප බව ය.

**33.** අශෝක රාජ්‍ය සමය වනවිට විවිධ හේතු සාධක කරණකොට ගෙන බුදුසසුන පරිහාණියට පත්වෙමින් පැවති බව ඓතිහාසික වාර්තාවන්ගෙන් සනාථ වේ. ඒ සඳහා බලපෑ ප්‍රමුඛතම හේතුව ලෙස සැළකිය හැක්කේ,

(1) බ්‍රාහ්මණ ආගම බලවත්වීම ය.
(2) භික්ෂූන් වහන්සේලා ලාභ සත්කාරවලට ගිජු වීම ය.
(3) ලාභ සත්කාර අපේක්ෂාවෙන් අන්‍ය තීර්ථකයන් සසුනට ඇතුළත්ව සිටීම ය.
(4) රාජානුග්‍රහය නිසි පරිදි නො ලැබීම ය.
(5) භික්ෂූන් වහන්සේලා පොහොය කර්ම නො කර සිටීම ය.

**34.** ක්‍රි.ව දෙවන හා තුන්වන සියවස්වල භාරතයේ ප්‍රකට විශ්වවිද්‍යාල කිහිපයක් බිහි වූ බව මූලාශ්‍රයන්හි සඳහන් වේ. නාලන්දා විශ්වවිද්‍යාලය ද ඒ අතර ප්‍රමුඛ වේ. මෙම විශ්වවිද්‍යාලය බිහි කිරීමේ ගෞරවය හිමි වන්නේ,

(1) තථාගත ගුප්ත රජතුමාට ය.
(2) බාලාදිත්‍ය රජතුමාට ය.
(3) වික්‍රමාදිත්‍ය රජතුමාට ය.
(4) ශක්‍රාදිත්‍ය රජතුමාට ය.
(5) නරසිංහගුප්ත රජතුමාට ය.

**35.** ප්‍රාග් බෞද්ධ යුගයේ ලාංකික ජනයා දෙවියන් ඇදහීම සිදු කළ බවත්, පණ්ඩුකාභය රජතුමා විවිධ දෙවිවරුන් සඳහා අනුග්‍රහ දැක්වූ බවත් මහාවංසාදී ඓතිහාසික වාර්තා මගින් සනාථ වේ. එම වාර්තාවලට අනුව එකල ජනයා විසින් දඩයමට අධිපති දෙවියා ලෙස සලකන ලද්දේ,

(1) වෙස්සවණ ය
(2) ජුතින්ධර ය.
(3) කම්මාර ය.
(4) ව්‍යාධ ය.
(5) පුරදේව ය.

**36.** බුදුදහම පැමිණෙන්නට පෙර ලක්දිව බොහෝ ආගමික ඇදහිලි හා විශ්වාස පැවතිණ. එම ඇදහිලි හා විශ්වාසයන්ට අනුග්‍රහ දැක් වූ රජෙකු ලෙස පණ්ඩුකාභය රජු හඳුනාගත හැකිය. රජු ආගමික කටයුතු ඉටු කිරීමට පහසුකම් සපයා දීමක් ලෙස ‘සොත්ථි ශාලා’ නම් ගොඩනැගිලි විශේෂයක් කරවා දුන් බව මහා වංසයේ සඳහන් වේ. එම ගොඩනැගිලි විශේෂය තනවා දෙන ලදැයි සැලකෙන්නේ,

(1) බ්‍රාහ්මණයන් උදෙසා ය.
(2) පරිබ්‍රාජකයන් උදෙසා ය.
(3) නිගණ්ඨයන් උදෙසා ය.
(4) ආජීවකයන් උදෙසා ය.
(5) තාපසයන් උදෙසා ය.

**37.** මහාබෝධි වංශයේ සඳහන් වන ආකාරයට ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලංකාවට වැඩම කරවා පෙරහැරකින් අනුරාධපුර නගරය කරා වැඩම කරවද්දී එක්තරා බමුණු ග්‍රාමයක දින හතක් තැන්පත් කර තබා පුද පූජා පැවැත් වූ බව සඳහන් වේ. එම ග්‍රාමය වන්නේ,

(1) පණ්ඩුල බමුණු ග්‍රාමය යි. (2) තිවක්ක බමුණු ග්‍රාමය යි. (3) සොත්ථිය බමුණු ග්‍රාමය යි.
(4) උපතිස්ස බමුණු ග්‍රාමය යි. (5) ඒකනාලා බමුණු ග්‍රාමය යි.

**38.** ශ්‍රී ලාංකේය ඉපැරණි බෞද්ධ මධ්‍යස්ථාන මගින් ඉටු වූ ශාසනික කාර්යභාරය අතිමහත් ය. ඒ අනුව ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම, පාලි අටුවා රචනා කිරීම, විනය සංගායනාවක් පැවැත්වීම ආදී ධර්ම ශාස්ත්‍රීය සේවාවන් ඉටු කරන ලද්දේ,

(1) අභයගිරි විහාරයේ මූලිකත්වයෙනි. (2) මහා විහාරයේ මූලිකත්වයෙනි.
(3) ජේතවන විහාරයේ මූලිකත්වයෙනි. (4) චේතියගිරි විහාරයේ මූලිකත්වයෙනි.
(5) වෙස්සගිරි විහාරයේ මූලිකත්වයෙනි.

**39.** අභයගිරි විහාරය මහා විහාරය තරමට ම ශ්‍රී ලංකාවේ ප්‍රකට වූ බෞද්ධ සිද්ධස්ථානයකි. මහා විහාරයේ සංවර්ධනයට මෙන්ම අභයගිරි විහාරයේ සංවර්ධනයට ද මෙරට නරපතීන් විසින් විවිධ පරිත්‍යාගයන් සිදු කරන ලදී. ඒ අනුව අභයගිරි විහාරයේ ප්‍රයෝජනය සඳහා තනවන ලද "ගාමිණීතිස්ස ජලාශය" ඉදි කරන ලද්දේ,

(1) ගජබා රජු ය. (2) සද්ධාතිස්ස රජු ය. (3) ජෙට්ඨතිස්ස රජු ය.
(4) කණිට්ඨතිස්ස රජු ය. (5) දුටුගැමුණු රජු ය.

**40.** ගොවියකු වූ ප්‍රියන්ත සිය පවුලේ අවශ්‍යතා සපුරා ගත්තේ මහත් වූ ආර්ථික දුෂ්කරතා මැද්දේ ය. ස්වාමිපුරුෂයාගේ ගොවිතැන් කටයුතුවලට උදව් කිරීම හා ගෙදර දොර කටයුතු කිරීම හැර බිරිඳට ද ස්ථිර රැකියාවක් නො තිබුණි. ඒ නිසා දරුවන් සිවු දෙනාගේ කාර්යයන් ද ඉටු කර ගත්තේ ඉතා අපහසුවෙනි. මෙසේ කාලය ගෙවන අතරතුර සති අන්තයේ බිරිඳගේ ඥාති සහෝදරයෙකු ඇතුළු පිරිසක් නිවසට පැමිණෙන බවට දුරකථන ඇමතුමක් ලැබුණි. ඉන් සැමියා කම්පනයට පත් වේ යැයි බිරිඳට සිතුන ද ප්‍රියන්ත වෙතින් එවන් හැසිරීමක් ප්‍රකට වූයේ නැත. හන්දියේ වෙළඳසැලෙන් අවශ්‍ය සියලු කළමනා ණයට ගෙනවිත් දී පිරිසට අවශ්‍ය සියලු සංග්‍රහ කිරීමට ඔහු උත්සුක විය. පිරිසට මැනවින් සංග්‍රහ කොට සතුටින් පසුවන සැමියා දුටු බිරිඳට උපන්නේ කෘතවේදී හැඟීමකි. උක්ත කරුණින් පැහැදිලි වන මූලික අදහස වන්නේ,

(1) ප්‍රියන්ත ණය වීමට බිය නො වූ පුද්ගලයෙකු වූ බව යි.
(2) ප්‍රියන්ත බිරිඳට හොඳින් සලකන පුද්ගලයෙකු වූ බව යි.
(3) ප්‍රියන්ත කා හට වුව ද දෙවැනි වීමට අකමැති පුද්ගලයෙකු වූ බව යි.
(4) ප්‍රියන්ත ආගන්තුක සත්කාරය ගරු කළ අයෙකු වූ බව යි.
(5) ප්‍රියන්ත පරාර්ථය විෂයයෙහි නිර්ලෝභී පුද්ගලයෙකු වූ බව යි.

**41.** ථෙරවාදී පාලි ත්‍රිපිටකය ආරක්ෂා කොට පවත්වා ගැනීමෙහි ලා බුරුම රජවරුන්ගෙන් සිදු වූ මෙහෙය ප්‍රසංසාර්හය. ප්‍රකට බුරුම බෞද්ධ රජදරුවන් අතර අනෞරථ රජු සිදු කළ වැදගත් ශාසනික ධර්ම ශාස්ත්‍රීය සේවාවක් වන්නේ,

(1) ත්‍රිපිටකය බුරුම අක්ෂරවලින් ලියවා තැබීම ය.
(2) ධර්ම සංගායනාවට අනුග්‍රහ දැක්වීම ය.
(3) බෞද්ධ විශ්වවිද්‍යාලයක් ආරම්භ කිරීම ය.
(4) ත්‍රිපිටකය කිරිගරුඬ පුවරුවල ලියවා තැබීම ය.
(5) ස්වේදගොන් චෛත්‍යය නිර්මාණය කිරීම ය.

**42.** ථායි දේශයට බුදු සමයේ ආභාසය නිසා හිමි වූ දායාදයක් ලෙස බෞදධ උත්සව කලාව දැක්විය හැකිය. මේ අනුව ථායිලන්තයේ වාර්ෂිකව පැවැත්වෙන විවිධ බෞද්ධ උත්සව අතර ථායි රජතුමා අනිවාර්යයෙන් සහභාගි විය යුතු උත්සවය ලෙස පිළිගනු ලබන්නේ,

(1) වෙසක් උත්සවය යි. (2) කඨින උත්සවය යි. (3) ඇසළ උත්සවය යි.
(4) අලුත් අවුරුදු උත්සවය යි. (5) මළවුන් පිදීමේ උත්සවය යි.

**43.** චීන බෞද්ධ ඉතිහාසයේ පිළිගැනීමට අනුව එරටට බුදුදහම පළමුවරට හඳුන්වා දීම සිදු වූයේ හැං මිං ති අධිරාජ්‍යයාගේ යුගයේදී ය. එහිලා පුරෝගාමීන් ලෙස සැලකෙන්නේ,

(1) කාශ්‍යප මාතාංග හා ධර්මාකර හිමිවරුන් ය.
(2) කාශ්‍යප මාතාංග හා සංඝපාල හිමිවරුන් ය.
(3) කාශ්‍යප මාතාංග හා කුමාරජීව හිමිවරුන් ය.
(4) කාශ්‍යප මාතාංග හා ශාන්තරක්ෂිත හිමිවරුන් ය.
(5) කාශ්‍යප මාතාංග හා ධර්මරක්ෂ හිමිවරුන් ය.

**44.** ජපානයට බුදුදහම හඳුන්වා දීමෙන් පසු එය විවිධ සංස්කරණයන්ට ලක් විය. මෙහි ප්‍රතිඵලය වූයේ ජපානය තුළ විවිධ නිකායයන් ව්‍යාප්ත වී යාමයි. එරට ජනප්‍රියත්වයට පත් බොහෝ නිකායයන් චීනයේ ආරම්භ වී සංවර්ධනය වූ ඒවා ලෙස හඳුනාගත හැකි අතර ඇතැම් ඒවා භාරතීය සම්භවයක් සහිත බෞද්ධ නිකායයන් විය. මේ අනුව භාරතයේ ප්‍රභවය වී චීනයේදී සංස්කරණයන්ට ලක් ව ජපානයේදී සංවර්ධනය වී ජනාදරයට පත් ප්‍රකට බෞද්ධ සම්ප්‍රදාය ලෙස හඳුනාගත හැක්කේ,

(1) නිචිරෙන් සම්ප්‍රදාය යි. (2) නෙම්බුත්සු සම්ප්‍රදාය යි. (3) සෙන් සම්ප්‍රදාය යි.
(4) තෙන්දයි සම්ප්‍රදාය යි. (5) ෂින්ගොන් සම්ප්‍රදාය යි.

**45.** ජීවමාන බුදුරදුන් දවස බෞද්ධ ස්තූප ගොඩ නැගුණු බව මූලාශ්‍රයන්හි සඳහන් වේ. ථූපාර්හ පුද්ගලයන් සඳහා ස්තූප තැනීම හා වන්දනා මාන කිරීම සුදුසු බව බුදුරදුන් විසින් ම දේශනා කොට තිබේ. මහා පරිනිබ්බාණ සූත්‍රයේ දැක්වෙන ථූපාර්හ පුද්ගලයින්ගේ අනුපිළිවෙල වනුයේ,

(1) බුදුරදුන්, සක්විති රජු, පසේ බුදුරදුන්, අරහත්.
(2) සක්විති රජු, බුදුරදුන්, පසේ බුදුරදුන්, අරහත්.
(3) බුදුරදුන්, පසේ බුදුරදුන්, සක්විති රජ, අරහත්.
(4) සක්විති රජු, අරහත්, පසේ බුදුරදුන්, බුදුරදුන්.
(5) බුදුරදුන්, පසේ බුදුරදුන්, අරහත්, සක්විති රජු.

**46.** සඳකඩපහණ, පූජනීය ගොඩනැගිලි මෙන්ම රාජකීය ගොඩනැගිලි දොරටු අලංකරණය සඳහා ද යොදා ගෙන ඇත. එහෙත් එම සඳකඩපහණ අලංකරණය සඳහා පමණක් නොව වෙනත් සංකේතාර්ථයන් ධ්වනිත කිරීම සඳහා ද යොදා ගෙන ඇති බව උගතුන්ගේ මතය යි. ඒ අනුව මහාචාර්ය විනී විතාරණයන් දක්වා ඇති අදහස වන්නේ, ඉන්

(1) සංසාර චක්‍රය නිරූපණය කෙරෙන බව යි.
(2) ජාති, ජරා, ව්‍යාධි, මරණ යන තත්ත්වයන් නිරූපණය කෙරෙන බව යි.
(3) නිර්වාණය නිරූපණය කෙරෙන බව යි.
(4) චන්ද්‍ර සූර්ය දෙදෙනා හා බැඳුණු විශ්වාස නිරූපණය කෙරෙන බව යි.
(5) සිවු දිසා නිරූපණය කෙරෙන බව යි.

**47.** ඉපැරණි ලක්දිව ශිල්පීන් විසින් ගන්ධකුටි, ප්‍රාසාද, ගෙඩිගේ හා ටැම්පිට යන සැලසුම් ආකෘතිවලට අනුව විහාර නිර්මාණය කොට තිබේ. ඒ අනුව ගෙඩිගේ සම්ප්‍රදායට නිදසුනක් වන්නේ,

(1) විජයාරාම පිළිම ගෙය යි. (2) තොලුවිල පිළිම ගෙය යි
(3) පන්කුලිය පිළිම ගෙය යි. (4) කිරිබත් වෙහෙර පිළිම ගෙය යි.
(5) පොළොන්නරු ථූපාරාම පිළිම ගෙය යි.

**48.** බොහෝ විද්වතුන්ගේ අදහසට අනුව ලෝකයේ පළමු වරට බුද්ධ ප්‍රතිමා නිර්මාණය ආරම්භ වී ඇත්තේ කණිෂ්ක රාජ්‍ය සමයේ ගන්ධාර හා මථුරා යන ප්‍රදේශ දෙක කේන්ද්‍ර කර ගෙන ය. මේ ප්‍රදේශ දෙකෙහි නිර්මාණකරුවන් ගුරු කොට ගන්නා ලද මූලික ආකෘතීන්වල ස්වභාවය අනුව බුද්ධ ප්‍රතිමාවන්හි වෙනස්කම් ගණනාවක් විද්‍යාමානවන බව හඳුනාගෙන ඇත. ඒ අනුව මථුරා බුද්ධ ප්‍රතිමාවෙහි අනන්‍යතාව පෙන්නුම් කරන වඩාත් නිවැරදි වරණය වන්නේ,

(1) නෙත් අඩවන් ය, තොල් සිහින් ය, කම්මුල පිම්බී ඇත.
(2) හිසකේ ස්වභාවික ය, විනිවිද පෙනෙන තරම් දුහුල් සිවුර රැලි අඩු ය.
(3) විනිවිද පෙනෙන තරම් දුහුල් සිවුර රැලි අඩු ය, හිසකේ ශෛලිගත ය.
(4) කෝමල සිරුර ය, අත් සිරුරට ඇත්ව ය, හිසකේ ස්වාභාවික ය.
(5) හිසකේ කැරලි ගැසී ඇත, තොල් සිහින් ය. පරිමාණානුකූල කම්මුල් ය.

**49.** නූතන යුගයේ ශ්‍රී ලාංකේය බෞද්ධ සිතුවම් කලාව පෝෂණය කිරීමට දායකත්වය ලබා දුන් චිත්‍ර ශිල්පීන් රැසක් පිළිබඳ ව තොරතුරු වාර්තා වේ. රිචඩ් හෙන්රිකස්, එම් සාර්ලිස්, සෝලියස් මෙන්ඩිස්, ජෝර්ජ් කීට්, ඇල්බට් ධර්මසිරි, සෝමබන්ධු විද්‍යාපති එයින් කිහිප දෙනෙකි. මොවුන්ගේ සිතුවම් තුළ අනන්‍යතා තහවුරු කරන ලක්ෂණ දක්නට ලැබේ. ඒ අනුව එම්. සාර්ලිස් චිත්‍ර ශිල්පියාගේ චිත්‍රවල දක්නට ලැබෙන එවැනි ලක්ෂණයක් වන්නේ,

(1) යුරෝපීය ස්වාභාවික චිත්‍ර ශෛලිය උපයෝගී කර ගැනීම.
(2) බුද්ධිගෝචර රටාවක් උපයෝගී කර ගැනීම.
(3) බුද්ධාලම්බන ප්‍රීතියට වඩා ශෘංගාරය ඉස්මතු කොට දැක්වීම.
(4) අඛණ්ඩ කථන ක්‍රමය සෑම සිතුවමකම දක්නට ලැබීම.
(5) ඉන්දියානු හා ලාංකේය සම්භාව්‍ය සිතුවම් කලාවේ සම්මිශ්‍රණයකින් යුක්ත වීම.

**50.** මෙරට බොහෝ කලා නිර්මාණයන් පෝෂණය කිරීමට දායක වූ මාධ්‍යයක් ලෙස ජාතක කතා සැලකේ. අතීතයේ මෙන්ම වර්තමානයේ ද බොහෝ නාට්‍යවේදීන් ස්වකීය නිර්මාණයන් සඳහා ජාතක කතා උපයෝගී කරගෙන ඇත. පහත දැක්වෙන වේදිකා නාට්‍ය අතරෙන් ජාතක කතාවක් මුල් කරගෙන නිර්මාණය වූ නාට්‍යයක් වන්නේ,

(1) සිරිසඟබෝ (2) මනමේ (3) නල දමයන්ති
(4) සකුන්තලා (5) සිංහබාහු

* * *

# (45) බෞද්ධ ශිෂ්ටාචාරය

## II පත්‍රය

**සැලකිය යුතුයි :**

* I කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද II කොටසෙන් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* එක් ප්‍රශ්නයකට ලකුණු 20 කි. (පළමු කොටසේ එක් අනු ප්‍රශ්නයකට ලකුණු **හතර** බැගින් ද දෙවන කොටසේ එක් අනු ප්‍රශ්නයකට ලකුණු **දහය** බැගින් ද හිමි වේ)

---

### I කොටස

**1.** (i) බ්‍රාහ්මණ සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ පහක් නම් කරන්න.

(ii) බුද්ධ කාලීන මගධ රාජ්‍යය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(iii) බුදුරජාණන් වහන්සේගේ අෂ්ට විද්‍යා නම් කරන්න.

(iv) බුදුරජාණන් වහන්සේ පිළිබඳ ප්‍රකට නූතන ඇගයීම් දෙකක් ගෙන හැර දක්වන්න.

(v) **නකුල මාතා** චරිතයෙන් වර්තමාන පවුල් සංස්ථාවට ලබා ගත හැකි ආදර්ශ කෙටියෙන් දක්වන්න.

**2.** (i) **"න භජේ පාපකේ මිත්තේ .............."** ගාථාව සම්පූර්ණ කරන්න

(ii) එම ගාථාවේ අදහස නිවැරදි ව ලියන්න.

(iii) පාප මිත්‍ර සේවනයේ අනිටු විපාක සංක්ෂේපයෙන් දක්වන්න.

(iv) කල්‍යාණ මිත්‍ර සේවනයේ වටිනාකම සාරාංශ කොට දක්වන්න.

(v) සිගාලෝවාද සූත්‍රයට අනුව නැගෙනහිර දිසාවෙන් නියෝජනය වන යුතුකම් හා වගකීම් නම් කරන්න.

**3.** (i) අටසිල් පිළිවෙළින් නම් කරන්න

(ii) මිථ්‍යාකාමයෙන් වැළකීමේ අනුසස් කෙටියෙන් දක්වන්න.

(iii) දස රාජ ධර්ම නම් කරන්න.

(iv) ආකාරවතී ශ්‍රද්ධාව හඳුන්වා දෙන්න.

(v) 'මුදිතා' බ්‍රහ්ම විහරණයෙන් වර්තමාන සමාජයට ලැබිය හැකි ආදර්ශ සැකෙවින් දක්වන්න.

### II කොටස

**4.** (i) ජනතාවගේ ආර්ථික සංවර්ධනය විෂයයෙහි පාලක පක්ෂයේ වගකීම් බෞද්ධ මූලාශ්‍රයානුසාරයෙන් විභාග කරන්න.

(ii) රටක පාලන තන්ත්‍රය යහපත් ආකාරයෙන් පවත්වාගෙන යාමෙහිලා ජනතාවගේ යුතුකම් හා වගකීම් කවරේදැයි බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් පැහැදිලි කරන්න.

**5.** (i) පරිසරය පිළිබඳව බුදු සමය දක්වන හිතකාමී ආකල්පය වර්තමාන පාරිසරික ගැටලු අවම කර ගැනීමෙහි ලා ආදර්ශ කරගත හැකි අයුරු ප්‍රකට කරන්න.

(ii) සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බෞද්ධ ආකල්පය ජනතාවගේ ප්‍රබුද්ධ රසාස්වාදය උදෙසා උපයෝගී වන අයුරු පැහැදිලි කරන්න.

**6.** (i) ප්‍රථම ධර්ම සංගීතියෙහි පසුබිම කෙටියෙන් පැහැදිලි කොට ශාසන චිරස්ථිතිය පිණිස එය ඉවහල් වූ ආකාරය ඓතිහාසික නයින් පරීක්ෂා කරන්න.

(ii) නාලන්දා විශ්වවිද්‍යාලයේ සැකැස්ම පිළිබඳ හැඳින්වීමක් කොට එහි අධ්‍යාපන - පරිපාලන ව්‍යුහය පැහැදිලි කරන්න.

**7.** (i) ප්‍රාග් මහින්ද යුගයේ ශ්‍රී ලංකාවේ පැවති ආගමික ඇදහිලි හා විශ්වාස හඳුන්වා දී ඇතැම් සංකල්ප බුදු සමයේ ආභාසයෙන් හැඩ ගැසුණු ආකාරය පහදා දෙන්න.

(ii) පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලනය විෂයයෙහි බුදු සමයේ බලපෑම කෙතෙක් දැයි උදාහරණ මගින් පෙන්වා දෙන්න.

**8.** (i) මියන්මාරය හා ශ්‍රී ලංකාව අතර පැවති බෞද්ධ සංස්කෘතික සම්බන්ධතා දෙරටේම බුදුසමයේ පෝෂණයට ඉවහල් වූ ආකාරය ඓතිහාසික නයින් ප්‍රකට කරන්න.

(ii) දඹදෙණි යුගයේ සිංහල ගද්‍ය හා පද්‍ය සාහිත්‍යය බුදුසමයෙන් පෝෂණය වූ ආකාරය සනිදර්ශනව පැහැදිලි කරන්න.

* * *

# (47) ඉස්ලාම් ශිෂ්ටාචාරය

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

**I පත්‍රය -** **කාලය : පැය 02යි.**

වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න **50කි.** ප්‍රශ්න **සියල්ලට** ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට **ලකුණු 01** බැගින් මුළු **ලකුණු 50කි.**

**II පත්‍රය -** **කාලය : පැය 03යි.** (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10 යි.)

මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත වේ.

I කොටස - අර්ධ ව්‍යුහගත ප්‍රශ්න **තුනකි.** ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40කි.

II කොටස - රචනා වර්ගයේ ප්‍රශ්න **පහකි.** ප්‍රශ්න **තුනකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 60කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු = 100

අවසාන ලකුණ ගණනය කිරීම :

| | | |
|---|---|---|
| I පත්‍රය | = | 50 |
| II පත්‍රය | = | 100 ÷ 2 = 50 |
| අවසාන ලකුණ | = | 100 |

### I පත්‍රය

**සැලකිය යුතුයි :**

* **සියලු ම** ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

* **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.(විභාගයේ දී පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ.

---

**1.** අල්කුර්ආනයට නබි මිතුරන් විසින් සපයන ලද විවරණය හඳුන්වන්නේ කෙසේද?

(1) තෆ්සීර් බිල් මඃසූර් (2) තෆ්සීර් බිල් මඃකූල් (3) තෆ්සීර් සූෆි
(4) තෆ්සීර් බිර්රයිඃ (5) තෆ්සීර් අල් ඉෂාරි

**2.** වහී පහළ කරන ලද ආරම්භ කාලයේ දී, නබි(සල්) තුමාගේ උපදේශවල සාරංශය වන්නේ,

(1) තව්හීද්, රිසාලත් හා කිලාෆත් ය. (2) කිලාෆත්, තව්හීද් හා මආද් ය.
(3) කිලාෆත්, රිසාලත් හා මආද් ය. (4) තව්හීද්, කිලාෆත් හා රිසාලත් ය.
(5) තව්හීද්, රිසාලත හා මආද් ය.

**3.** හදීස් දැනුම් දෙන්නන්ගේ නාම අනුපිළිවෙළින් ගොනු කරන ලද හදීස් ග්‍රන්ථ වන්නේ,

(1) අල් - ජාමිඋ ය. (2) අල් - මුසන්නෆ් ය. (3) අස් - සුනන් ය.
(4) අල් - මුස්නද් ය. (5) අල් - මව්ලූඋ ය.

**4.** උස්තුරුලාබ් යන ආකාශ උපකරණය බිහි කිරීම සඳහා මඟ පෙන් වූ ග්‍රන්ථය වන්නේ,

(1) අල් ජබර් වල් මුකාබලා ය. (2) කිතාබුල් අආනි ය. (3) කානූන් ය.
(4) සිද්ධාන්ත ය. (5) සුරතුල් අර්ල් ය.

**5.** කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයේ ''මඩිගේ බද්ද නිලමේ'' තනතුර දැරූ මුස්ලිම් ප්‍රධානියා වන්නේ,

(1) රාජ කරුණ ගෝපාල් මුදියන්සේ රාලහාමි ය. (2) බුවැලීකඩ අබු බකර් පුල්ලේ ය.
(3) අබූ උස්මාන් ය. (4) ඌසුබු ලෙබ්බේ ය.
(5) ෂේක් ආලිම් ය.

6. පහත X හි ෂරීආ නීතිය හා සම්බන්ධ ව විද්වතුන් ඉදිරිපත් කළ අදහස් ද, Y හි එය ඉදිරිපත් කළ විද්වතුන්ගේ නම් ද අනුපිළිවෙලින් නොවන ලෙස සඳහන් කර ඇත.

| X | Y |
|---|---|
| එක් එක් භාණ්ඩ සඳහා වූ ප්‍රමාණය ෂරීආ නීතිය වේ. | A - ආචාර්ය උමර් සුලෙයිමාන් |
| සියලු ක්ෂෙත්‍රයන්හි දැඩි සම්බන්ධයක් ඇති වචනය ''ෂරීආහ්'' යන දේව නීතිය වේ. | B - ආබාදි |
| මිනිස් සමූහයා අතර මානුෂීය ක්‍රියාවන් පාලනය කර විධිමවත් කරන මාර්ගය දේව නීතිය වේ. | C - අල් ජුර්ජානි |

X ට ගැළපෙන Y හි නිවැරදි අනුපිළිවෙල වන්නේ,

(1) A, B හා C ය. (2) A, C හා B ය. (3) B, C හා A ය.
(4) C, A හා B ය. (5) C, B හා A ය.

7. ඉස්ලාමීය ශිෂ්ඨාචාරය හා සම්බන්ධව පහත ප්‍රකාශ අතුරින් වඩාත් සුදුසු ප්‍රකාශය වන්නේ,

(1) නැගෙනහිර හා බස්නාහිර පදනම් කර ගැනීම යි.
(2) රෝම - පර්සියානු ශිෂ්ඨාචාරය මිශ්‍ර වීම යි.
(3) ග්‍රීක ශිෂ්ඨාචාරය පදනම් කොට බිහි කිරීම යි.
(4) මෙලොව හා පරලොව යහපත ඉලක්ක කර තිබීම යි.
(5) අරාබියානු සංස්කෘතිය පදනම් වී තිබීම යි.

8. ''මකාසිදුෂ් ෂරීආ'' ව වර්ග කිරීමේ පියවර කිහිපයක් ඇත. එයින් මිනිසාට ඇතිවන දුෂ්කරතා හා අපහසුතාවලින් ඉවත් කිරීම පෙන්නුම් කරන්නේ,

(1) ළරූරියියාත් ය. (2) හාජියියාත් ය. (3) තක්මීලියියාත් ය.
(4) තහ්සීනියියාත් ය. (5) උමූමියියාත් ය.

9. මක්කා කාල සමයේ මුස්ලිම්වරුන්ට පුහුණුව ලබා දීම සඳහා නබි (සල්) තුමාණන් විසින් තෝරාගත් ස්ථානය වන්නේ,

(1) දාරුල් නද්වා ය. (2) දාරුල් අර්කම් ය.
(3) අබූ සුෆියාන්ගේ නිවස ය. (4) උක්කාස් ය.
(5) මජන්නා ය.

10. තමාට ආවේණික වූ නීති පදනමක් සකස් කිරීම මඟින් නීතිමය ගැටලු විසඳනු ලබන මුජ්තහිද් වන්නේ,

(1) මුජ්තහිද් මුකයියද් ය. (2) මුජ්තහිද් මස්අලා ය. (3) මුජ්තහිද් මද්හබ් ය.
(4) මුජ්තහිද් ෆත්වා ය. (5) මුජ්තහිද් මුත්ලක් ය.

11. ක්‍රි. ව. 1626 හි කොළඹින් පිටුවහල් කරන ලද මුස්ලිම්වරුන්ට රැකවරණය ලබා දුන් ශ්‍රී ලාංකීය රජු,

(1) I වන විමලධර්මසූරිය රජතුමා ය. (2) II වන විජයබාහු රජතුමා ය.
(3) සෙනරත් රජතුමා ය. (4) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා ය.
(5) II වන රාජසිංහ රජතුමා ය.

12. ලාංකීය මුස්ලිම්වරුන්ගේ ඉතිහාසයේ බිහි වූ ''මුස්ලිම් නේෂන්'' හා ''අස්සවාබ්'' වැනි පුවත් පත් එළි දැක්වූ අය පිළිවෙළින්,

(1) අයි. එල්. එම්. ඒ. අසීස් හා ඒ. එම්. ඒ. අසීස් ය.
(2) සිද්දි ලෙබ්බෙ හා අයි. එල්. එම්. ඒ. අසීස් ය.
(3) ඩබ්ලිව්. සී. අබ්දුල් රහ්මාන් හා ටී. බී. ජායා ය.
(4) වාපිච්චි මරික්කාර් හා මාපිල්ලෙයි ලෙබ්බෙයි ආලිම් ය.
(5) සිද්දි ලෙබ්බෙයි හා ඔරාබි බාෂා ය.

**13.** පහත ප්‍රකාශ සලකා බලන්න.

A - අරාබියානුවන් කොන් කිරීම

B - පාලන අයිතිය අහ්ලුල් බෛත්වරුන්ටය යන අදහස

C - තුර්කිවරුන්ගේ ආභාෂය

D - කුඩා රාජ්‍ය බිහිවීම

E - බයිසාන්තීයවරුන්ගේ ආභාෂය

F - බයිතුල්මාල් අවභාවිතය

G - පසු උරුමක්කරුවන්ගේ අවිධිමත් බව

H - කර්බලා සිද්ධිය

ඉහත ප්‍රකාශ අතරින් අබ්බාසීයානුවන්ගේ බිඳවැටීමට හේතු වූ කරුණු පමණක් ඇතුළත් කාණ්ඩය කුමක්ද?

(1) A, C හා H ය. (2) A, D හා G ය. (3) B, C හා D ය.

(4) B, E හා F ය. (5) C, E හා H ය.

**14.** පහත කරුණු අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) එක් එක් සියවස්වල ආරම්භ කාලයේ බිහිවන කෙනෙකු පමණක්, එම සියවසෙහි මුජද්දිද් ලෙස සළකනු ලැබේ.

(2) ඉමාම් ගස්සාලි (රහ්) ''හුජ්ජතුල්ලාහ් අල් බාලිගඃ'' යන ග්‍රන්ථය මගින් ග්‍රීක දාර්ශනික චින්තකයින්ගෙන් මුස්ලිම් සමාජය ආරක්ෂා කළේ ය.

(3) ''ෆී ළීලාලිල් කුර්ආන්'' යන අර්ථකතනය මගින් මව්ලානා අබුල් අඃලා මව්දූදි (රහ්) තුමාගේ තෆ්සීර් ක්ෂේත්‍රයට සිදු වූ දායකත්වය ශ්‍රේෂ්ඨ ය.

(4) නබිවරුන්, රසූල්වරුන්, සේම මුජද්දිද් වරුන්ගේ පැමිණීම ද අවසාන වේ.

(5) ෂෙක් අහ්මද් සිර්හින්ද් (රහ්), අක්බර් රජුගේ චින්තනයට විරුද්ධව හඬ නැගුවේ ය.

**15.** පහත සඳහන් ප්‍රකාශ අතුරින් මක්කි සූරාවන් හා සම්බන්ධ ඉතා සුදුසු ප්‍රකාශය කුමක් ද?

(1) මිනිසා හා මිනිසාගේ ඥාති සම්බන්ධතා පිළිබඳ සාකච්ඡාවට ලක් වීම

(2) අපරාද හා දඬුවම් පිළිබඳ සාකච්ඡාවට ලක් වීම

(3) පොලිය, වංචනික කිරුම් මිනුම් වැනි නින්දාසහගත ක්‍රියාවන් අවවාදාත්මක ව සාකච්ඡා වීම

(4) දේශපාලනික ක්‍රියා පිළිවෙත් පිළිබඳ සාකච්ඡාවට ලක් වීම

(5) සමාජ සම්බන්ධතා පිළිබඳ සාකච්ඡාවට ලක් වීම

**16.** පහත ප්‍රකාශ අතුරින් ඉස්ලාමීය දෘෂ්ටියෙන් ඉතා සුදුසු ප්‍රකාශය වන්නේ,

(1) මිනිසා තමාට ද, දෙවියන්ට ද, සමාජයට ද වගකිව යුතු ය.

(2) මිනිසා දෙවියන්ට ද, සමාජයට ද වගකිව යුතු ය.

(3) මිනිසා දෙවියන්ට ද, පවුලට ද, සමාජයට ද වගකිව යුතු ය.

(4) මිනිසා තමාට හා දෙවියන්ට පමණක් වගකිව යුතු ය.

(5) මිනිසා තමාට පමණක් වගකිව යුතු ය.

**17.** ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ප්‍රථම මුස්ලිම් කතානායක ලෙස සේවය කරනු ලැබුවේ,

(1) සර් රාසික් ෆරීඩ් ය.

(2) එම්. එච්. මොහමඩ් ය.

(3) වෛද්‍ය එම්. සී. එම්. කලීල් ය.

(4) බාකිර් මාකාර් ය.

(5) එස්. එච්. ඉස්මායිල් ය.

**18.** පහත ප්‍රකාශ කුලෆාඋර් රාෂිදීන්වරුන් හා සම්බන්ධ වේ.

A - තමාට පසුව පැමිණෙන කලීෆා වරයාව පත් කිරීම

B - ශ්‍රේෂ්ඨ සහාබාවරු හය දෙනෙකු සමග සාකච්ඡා කර කලීෆා ලෙස පත් කර ගනු ලැබීම

C - තම පවුලේ සාමාජිකයින් කිසිවකු කලීෆා ලෙස පත් කර නොගන්නා ලෙස අවධාරණය කිරීම

D - සකීෆා බනී සායිදහි සහාබාවරුන් විසින් ඒකමතික ව කලීෆා තෝරා පත් කර ගනු ලැබීම

E - කාලිද් ඉබ්නු වලීද් (රලි) තුමා පොදු සෙන්පතිවරයෙකු ලෙස පත් කර යර්මූක් දෙසට පිටත් කිරීම

F - මජ්ලිසුස් ෂූරාව සුවිශේෂ සභාවක් ලෙස පත් කිරීම

එයින් කලීෆා අබු බක්කර් (රලි) තුමා සමග පමණක් සම්බන්ධ වන කරුණු වෙන් කළ විට හිමිවන කාණ්ඩය තෝරන්න.

(1) A, D හා E (2) B, C හා D (3) B, E හා F

(4) C, E හා F (5) C, D හා E

**19.** ඉබ්නු බතූතා තුමා ශ්‍රී ලංකාවේ සංචාරය කළ ස්ථාන වන්නේ,

(1) හලාවත, කුරුණෑගල හා නුවර ය. (2) පුත්තලම, ශ්‍රී පාද කන්ද හා ගාල්ල ය.

(3) පුත්තලම, බේරුවල හා කොළඹ ය. (4) මන්නාරම, ශ්‍රී පාද කන්ද හා බේරුවල ය.

(5) හලාවත, නුවර හා මීගමුව ය.

**20.** පහත ''අ'' කොටසින් තෆ්සීර් ග්‍රන්ථ ද ''ආ'' කොටසින් මුෆස්සීර්වරුන්ගේ නම් ද පෙන්නුම් කෙරේ.

| ''අ'' **කොටස** | ''ආ'' **කොටස** |
|---|---|
| (i) ජාමිඋල් බයාන් | A ඉමාම් අබු හයියාන් |
| (ii) මෆාතිහුල් ගෛබ් | B ෆහ්රුද්දීන් අර්රාසි |
| (iii) අල් බහ්රුල් මුහීත් | C ඉමාම් ආලූසි |
| (iv) තෆ්සීර් ජලාලෙන් | D ඉමාම් අත්තබරි |
| (v) රූහුල් මආනි | E ජලාලුදීන් සුයූති |

ඉහත (අ) හි සඳහන් තෆ්සීර් ග්‍රන්ථ හා ගැලපෙන මුෆසිර්වරුන් දැක්වෙන නිවැරදි අනුපිළිවෙළ කුමක් ද ?

(1) A B D E C (2) A C B E D (3) B C E A D (4) D B A E C (5) D E B A C

**21.** අනුරාධපුරයේ බටහිර පිවිසුම් මග''යෝනස්'' වරුන්ට වෙන් කරන ලද බවට මහාවංශයේ සඳහන් වන අදහස,අයත් වන්නේ කුමන රාජ සමයට ද?

(1) වළගම්බා (2) අග්‍රබෝධි (3) දාතෝපතිස්ස (4) ධාතුසේන (5) පණ්ඩුකාභය

**22.** පහත ප්‍රකාශ අතුරින් ඉජ්තිහාද් පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ඉස්ලාමීය ෂරීආ, අකීදාව වැනි සියලු අංශවලින් ඉජ්තිහාද් සිදුවිය හැකි ය.

(2) නබි (සල්) තුමාණන්ගේ කාලයේ සිට ම ඉජ්තිහාද් සඳහා දිරිගැන්වීම දක්නට ලැබුණි.

(3) සහාබාවරුන්ගේ කාලයේ අල් කුර්ආනය මඟින් පමණක් ඉජ්තිහාද් සිදු කරනු ලැබීම ය.

(4) ඉජ්තිහාද් කිරීමේ තරාතිරම හිමි වීමට බහු භාෂා හැකියාව අවශ්‍ය ය.

(5) සහාබාවරුන්ගේ කාලයේ කලීෆා අලි (රලි) තුමා හැර මුල් කලීෆාවරු තිදෙනාම ඉජ්තිහාද් කළහ.

**23.** හදීස් වර්ග අතර ''මුන්කතිඃ'' යනු,

(1) හදීසයක දැනුම්දෙන්නන්ගේ පිළිවෙළෙහි සහාබිවරයා අත හැර තාබිර් වරයෙකු ඍජුවම නබි(සල්) තුමාගෙන් දැනුම් දීම

(2) හදීස් හි ඉස්නද් තාබිර් වරයෙකු දක්වා ගොස් ඔහුගෙන් අවසන් වීම

(3) දැනුම් දෙන්නා යහපත් විනය ඇත්තෙකු වීම

(4) ඉස්නාදයේ අතර මග එක් දැනුම්දෙන්නෙකු (රාවි) අත හැර තිබීම

(5) හදීස් දැනුම්දෙන්නන්ගේ (රාවි) අනුපිළිවෙළෙහි සහාබිවරයා ගිලිහී තිබීම

**24.** පහත පුද්ගලයින් කිහිප දෙනෙක් ද ඔවුන්ගේ සේවයන් ද සඳහන් කර ඇත. එයින් වඩාත් නිවැරදි ගැළපීම තෝරන්න.

| | | |
|---|---|---|
| (1) ඖරංගසීප් | - | මජල්ලතුල් අහ්කාමිල් අද්ලියියා |
| (2) කලීෆා අබුබක්කර් (රලි) | - | ජෙරුසලම් ජයග්‍රහණය |
| (3) අලි බින් සීනා | - | අල් හාවි |
| (4) නිළාමුල් මුල්ක් | - | ජාමිඋල් අස්හර් |
| (5) කලීෆා මන්සූර් | - | දාරුල් හික්මා |

**25.** පහත A, B හා C කාණ්ඩයන් කියවා පිළිතුරු සපයන්න.

A - බටහිර ප්‍රදේශයේ ඉස්ලාමීය සදාචාරය ද ශිෂ්ඨාචාරය ද හඳුන්වා දී එහි විද්‍යා ඥාන වර්ධනයට දායක වූයේ ස්පාඤ්ඤයේ මුස්ලිම් පාලකයන් ය.

B - සුන්නාව රැක ගැනීමට ඉදිරිපත් කළ ක්‍රියාවලි අතර අස්මාඋල් රිජාල්, ඉල්මුල් ජරහ් වත්තඃදීල් ආදිය සඳහන් කළ හැකි ය.

C - ස්පාඤ්ඤයේ කුර්තුබා මස්ජිදය, පළමු අබ්දුර් රහ්මාන් විසින් ආරම්භ කර දෙවන හිෂාම් විසින් නිම කරන ලද මස්ජිදය වේ.

(1) A, B හා C තුන ම නිවැරදි ය.
(2) A, B නිවැරදි වන අතර C වැරදි ය.
(3) A, B හා C තුන ම වැරදි ය.
(4) A නිවැරදි වන අතර B හා C වැරදි ය.
(5) B හා C නිවැරදි වන අතර A වැරදි ය.

**26 - 30** දක්වා වූ එක් එක් ප්‍රශ්නය සඳහා ප්‍රකාශ දෙක බැගින් ලබා දී ඇත. එම ප්‍රකාශ පිළිබඳ ඉතා සුදුසු සම්බන්ධතාවක් දක්වන නිවැරදි පිළිතුර පහත වගුවේ අංක (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් තෝරන්න.

| **පළමුවන ප්‍රකාශය** | **දෙවන ප්‍රකාශය** |
|---|---|
| (1) නිවැරදිය | නිවැරදිය |
| (2) නිවැරදිය | වැරදිය |
| (3) වැරදිය | නිවැරදිය |
| (4) වැරදිය | වැරදිය |
| (5) නිවැරදිය | නිවැරදි මෙන්ම පළමු ප්‍රකාශය විස්තර කරන්නක් ද වේ. |

| | **පළමුවන ප්‍රකාශය** | **දෙවන ප්‍රකාශය** |
|---|---|---|
| **26.** | ඉන්ද්‍රියයන් මගින් ලබන අත්දැකීම් දැනුම වේ යන අදහස ග්‍රීක වරුන්ගේ අදහස වේ. | මිනිසා වෙනුවෙන් ආධ්‍යාත්මික, විනය පද්ධතියක් මිනිස් දැනුමෙන් පමණක් ලබා ගත හැකිය. |
| **27.** | ෂරීආ වෙන් සමහර කරුණු තහනම් කිරීම මගින් ද සමහර කරුණු අනුමත කිරීම මගින් ද ඇති කිරීමට ප්‍රිය කරන අරමුණු මකාසිදුස් ෂරීආ මගින් පෙන්නුම් කෙරේ. | මක්සද්, මකාසිද්, මසාලිහ්, ඉලල්, අස්රාර්, නතාඉජ්, මආල් වැනි පදවල පරිණාම වර්ධනය මකාසිදුෂ් ෂරීආ නම් වේ. |
| **28.** | ශ්‍රී ලාංකීය රජු විසින් ඩමස්කසයේ කලීෆා වරයාට යවනු ලැබූ තුටු පඬුරු සහිත නෞකාව ඉන්දියානු සාගරයේ දී මං පැහැරීම, මුස්ලිම්වරු සින්දු දේශය සමග සටන් කිරීමට හේතුවක් විය. | දඹදෙණිය පාලන කාලයේ දාතෝපතිස්ස රජතුමාගේ විශ්වාසයට පාත්‍ර වූ වාණිජ ක්ෂේත්‍රයේ සම්බන්ධීකාරක ලෙස ''පෙරිය තම්බි මරික්කාර්'' යන තැනැත්තා කටයුතු කළේය. |
| **29.** | ''සුන්නා හි සහාය නොමැතිව අල්කුර්ආනය වටහා ගත හැකිය'' යන්න අහ්ලුල් කුර්ආන් වාදීන්ගේ මතය වේ. | අල්කුර්ආනය විවිධ ස්ථානවල ඉජ්තිහාදයට අවකාශය ලබා දීමට මූලික කරුණු සමහරක් ඉදිරිපත් කර ඇත. |
| **30.** | අල්කුර්ආනය එක් රැස් කිරීම නිසා කලීෆා අබූ බක්ර් (රලි) තුමා ''ජම්උල් කුර්ආන්'' යන විශේෂ නාමය ලැබුවේ ය. | අල්කුර්ආනය ලව්හුල් මහ්ෆූල්හි ආරක්ෂා කර රමළාන් මාසයකදී, බයිතුල් හික්මාවට සම්පූර්ණයෙන් පහළ කරන ලදි. |

**31.** තෆ්සීර් - තඃවීල් යන පදවල විස්තරය වන්නේ,

(1) තෆ්සීර් යනු අල් කුර්ආනයට ලබා දෙන විස්තරය වේ.
තඃවීල් යනු අල් හදීස් හි විස්තරය වේ.

(2) තෆ්සීර් යනු මක්කි වාක්‍යවල විස්තරය වේ.
තඃවීල් යනු මදනි වාක්‍යවල විස්තරය වේ.

(3) තෆ්සීර් යනු අල් කුර්ආන් වාක්‍යවල ඍජු විස්තරය වේ.
තඃවීල් යනු අල් කුර්ආන් වාක්‍යවල වක්‍ර විස්තරය වේ.

(4) තෆ්සීර් යනු අල් කුර්ආන් වාක්‍යය කුර්ආන් මගින් විස්තර කිරීම වේ.
තඃවීල් යනු අල් කුර්ආන් වාක්‍යය අල් හදීස් මගින් විස්තර කිරීම වේ.

(5) තෆ්සීර් යනු අල් කුර්ආන් වාක්‍ය මගින් විස්තර කිරීම වේ.
තඃවීල් යනු අල් කුර්ආනයට නවීන කාලයේ දෙන ලද විස්තරය වේ.

**32.** මුස්ලිම් උම්මත් භේද නොවිය යුතුය. යන අදහස ඇති ව කලහකාරීන්ගේ බලපෑමෙන් කිලාෆතය භාරගත් සහාබිවරයා,

(1) තල්හා (රලි) ය.
(2) සුබෙයිර් (රලි) ය.
(3) අලි (රලි) ය.
(4) සඃද් ඉබ්නු අබී වක්කාස් (රලි) ය.
(5) අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රලි) ය.

**33.** මතභේදවල දී රැකිය යුතු පිළිවෙත් පිළිබඳ නිවැරදි ප්‍රකාශය,

(1) තමා පිළිබඳ උසස් මතයක් ඇති කර ගැනීම
(2) තර්ක කර තම මතය තහවුරු කිරීම
(3) තම ඉමාම්වරයාගේ මතයෙහි රැඳීම
(4) දැඩි මතදාරී බව අතහැර මධ්‍යස්ථ බව පිළිපැදීම
(5) ඉජ්තිහාදයට අදාළ කරුණුවල දී තම අදහස තදින් තහවුරු කිරීම

**34.** අල් කුර්ආනය ගොනු කරන විට සුරතුත් තව්බාහි අවසාන වාක්‍යය ලිඛිතව ආරක්ෂා සහිතව තබා ගත් සහාබිවරයා,

(1) අබු හුරෛරා (රලි) ය.
(2) අබු කුසෙයිමා (රලි) ය.
(3) අබු තල්හා (රලි) ය.
(4) අබු උබෙයිදා (රලි) ය.
(5) අබු ජන්දල් (රලි) ය.

**35.** ඉස්ලාමය විසින් මිනිසාට ලබා දුන් වගකීම් අතර ඉබාදත්, ඉමාරත් සමඟ තුන්වැනිව පවතින අංගය,

(1) විලායත් ය.
(2) රිසාලත් ය.
(3) කිලාෆත් ය.
(4) තස්කියත් ය.
(5) බරාඅත් ය.

**36.** අල් කුර්ආනය එකවර සම්පූර්ණයෙන් පහළ නොවීමට ප්‍රධාන හේතුව වන්නේ,

(1) ලිවීමට හා කියවීමට දන්නා අය අවම වීම
(2) දෑවා පහසු කිරීම හා චිත්ත ධෛර්යය ලබා දීම
(3) ක්ෂණිකව සටහන් කර ගැනීමට පහසුකම් නොතිබීම
(4) අඛණ්ඩව සටන් ක්‍රියාත්මක වීම
(5) කාෆිර්වරුන්ගේ අඛණ්ඩ විරෝධතාව

**37.** ''ඔවුන් ඔබලාට වස්ත්‍රයක් ලෙස ද ඔබලා ඔවුන්ට වස්ත්‍රයක් ලෙස ද සිටිති'' යන අල්කුර්ආන් වාක්‍යයෙන් පෙන්නුම් කරන්නේ,

(1) සැමියා හා බිරිඳ පිළිබඳව යි.
(2) බිරිඳ හා දරුවන් පිළිබඳව යි.
(3) සැමියා හා දරුවන් පිළිබඳව යි.
(4) දෙමව්පියන් හා දරුවන් පිළිබඳව යි.
(5) පුරුෂයන් හා ස්ත්‍රීන් පිළිබඳව යි.

**38.** පහත සඳහන් වන්නේ මුස්ලිම්වරුන්ගෙන් ම බිහි වූ චින්තනවාදී කණ්ඩායම් අතරින් කිහිපයකි.

A - වාසිලියියා
B - ඉස්මායිලියියා
C - බෂරියියා
D - සෙයිදියියා
E - හිෂාමියියා
F - නුසෙයිරියා

මෙයින් ෂීආවරුන්ගේ උප කොටසක් පෙන්නුම් කරන්නේ,

(1) A, B හා C ය.
(2) A, C හා B ය.
(3) B, D හා F ය.
(4) C, D හා E ය.
(5) D, E හා F ය.

**39.** පහත A, B හා C මඟින් පෙන්නුම් කරන තොරතුරු පරිශීලනය කරන්න.

A - මෙසපොතේනියානු ශිෂ්ඨාචාරය ඊජිප්තුවේ බිහි විය.

B - ඉන්දියාවෙන් බිහි වූ ශිෂ්ඨාචාරය ද්‍රවිඩ ශිෂ්ඨාචාරය නම් වේ.

C - රෝම ශිෂ්ඨාචාරය ඇතන්ස් හි බිහි වූවකි.

D - ඉස්ලාමීය ශිෂ්ඨාචාරය ඉන්දියානු උප මහද්වීපයෙන් ව්‍යාප්ත විය.

ඉහත තොරතුරු අතුරින්,

(1) A, B, C හා D යන හතරම නිවැරදිය.

(2) B, C නිවැරදි වන අතර A, D වැරදිය.

(3) A, B නිවැරදි වන අතර C, D වැරදිය.

(4) A, B, C හා D යන හතර ම වැරදිය.

(5) A, C හා D වැරදි වන අතර B පමණක් නිවැරදි ය.

**40.** X තීරුවෙන් කුඩා රාජ්‍යන්ගෙ නම් ද Y තීරුවෙන් කුඩා රාජ්‍ය දක්නට ලැබුණු ප්‍රදේශ ද දී ඇත.

| X | Y |
|---|---|
| i අක්ලබි | A ඇෆ්ගනිස්තාන් |
| ii ගස්නවි | B යෙමනය |
| iii ෆාතිමියියාවරු | C මොරොක්කෝව |
| iv සියාදි | D ඊජිප්තුව |
| v තාහිරි | E කුරාසානය |

X තීරුවෙන් සඳහන් කරුණු Y තීරුව හා නිවැරදිව ගැළපූ විට හිමිවන පිළිතුර වන්නේ,

(1) A C D E B (2) C A D B E (3) C A B D E (4) C E B A D (5) E C D A B

**41.** පහත කරුණු සලකන්න.

A - අල්ලාහ් පමණක් නමදිමු.

B - සෑම විටම පව් සමාව අයදිමු

C - කිසිවෙකුට අපවාද නොකියමු.

D - අල් කුර්ආනය වන පොත් කරමු.

E - සොරකම හෝ දුරාචාරය නොකරමු

F - සුන්නාහ්ව ලියා ආරක්ෂා කරමු.

මෙයින් නබි (සල්) තුමාණන් හිජ්රතයට පෙර මදීනාවාසීන් සමග ගිවිසගත් ගිවිසුමෙහි අන්තර්ගත **නොවන්නේ,**

(1) A , B හා D ය. (2) B, C හා D ය. (3) B, D හා F ය.

(4) C, D හා E ය. (5) D, E හා F ය.

**42.** ''මුජතහිද් මුත්ලක්'' ලෙස සලකන පුද්ගලයා,

(1) ඉමාම් නවවි (රහ්) තුමා ය. (2) ඉමාම් මුස්නි (රහ්) තුමා ය.

(3) ඉමාම් සුයුති (රහ්) තුමා ය. (4) ඉමාම් බයිහකි (රහ්) තුමා ය.

(5) ඉමාම් ෂාෆිඊ (රහ්) තුමා ය.

**43.** සින්දු ආක්‍රමයට සම්බන්ධ වූ හමුදා නියෝජිතයින් දෙදෙනා වන්නේ,

(1) තාරික් බින් සියාද් හා මුහම්මද් බින් කාසිම් ය .

(2) මූසා බින් නුසෛයිර් හා හජ්ජාජ් බින් යූසුන් ය.

(3) හජ්ජාජ් බින් යූසුෆ් හා තාරික් බින් සියාද් ය.

(4) මූසා බින් නුසෛයිර් හා මුහම්මද් බින් කාසිම් ය.

(5) හජ්ජාජ් බින් යූසුෆ් හා මුහම්මද් බින් කාසිම් ය.

**44.** කියාසයක් අතහැර දමා එයට වඩා ප්‍රබල කියාසයක් කරා යොමු වීම හඳුන්වන්නේ,

(1) කියාසුල් අව්ලා ය. (2) ඉස්තිස්හාබ් ය. (3) මස්ලහා මුර්සලා ය.
(4) ඉස්තිහ්සාන් ය. (5) උර්ෆ් ය.

**45.** පහත X කොටසේ විද්වතුන්ගේ නම් ද, Y කොටසේ ඔවුන් දායකත්වය දැක් වූ අංශ ද අනුපිළිවෙලින් නොවන ලෙස සඳහන් කර ඇත.

| X | Y |
|---|---|
| i කුවාරිස්මි | A වෛද්‍ය ක්ෂේත්‍රය |
| ii ඉබ්නු සීනා | B උද්භිත විද්‍යාව |
| iii ඉබ්නු කල්දූන් | C ගණිතය |
| iv අත්තීනාවාරී | D සමාජ විද්‍යාව |
| v අබු උබෙයිදා | E සත්ත්ව විද්‍යාව |

Xට ගැළපෙන Y හි නිවැරදි අනු පිළිවෙල වන්නේ,

(1) A C D E B (2) B A D C E (3) C A D B E
(4) C A E B D (5) E C D A B

**46.** ඉස්ලාමීය ඉතිහාසයේ ප්‍රථම වරට නැව් සෑදීමේ කර්මාන්තය ආරම්භ කළ පුද්ගලයා හා ආරම්භ වූ ස්ථානය පෙන්වන වරණය කුමක් ද?

(1) කලීෆා අබ්දුල් මලික් බින් මර්වාන් - ටියුනිසියාව
(2) කලීෆා මුආවියා - ඩැමස්කස්
(3) කලීෆා උස්මාන් - ට්‍රිපෝලි
(4) කලීෆා අබ්දුල් රහ්මාන් - ස්පාඤ්ඤය
(5) අම්ර් ඉබ්නු ආස් - ඊජිප්තුව

**47.** ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත සඳහන් වේ. මෙයින් ඉතා නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) හතරවන විජයබාහු රජ තුමාගේ සේනාධිපති ''මිත්ත'' යන තැනැත්තා විසින් තවත් සේනාධිපතියකු වන තාහූර් යන තැනැත්තා ඝාතනයට ලක් වීම යි.
(2) දේශගවේශක ඉබ්නු බතූතා ක්‍රි. ව. 15 වන සියවසේ දී ශ්‍රී ලංකාවට සංක්‍රමණය කළ තැනැත්තෙකි.
(3) මහා පරාක්‍රමබාහු රජුගේ අන්දරංග ධූර සභාවේ මුස්ලිම්වරු සිව් දෙනකු සේවය කර ඇත.
(4) වස්තුහිමි ගේ මෑණියන් වන මැදගෙඩිය කුමාරිහාමි, අනුරාධපුර රජුකෙනකුගේ අන්තඃපුරයේ සිටි කාන්තාවකි.
(5) යාපහුව යුගයේ රජ කළ රජ කෙනෙකු විසින් ඉරාකයට යවනු ලැබූ දූත පිරිසට උස්මාන් නම් මුස්ලිම්වරයකු නායකත්වය දී ඇත.

**48.** මදීනාහි ඉස්ලාමීය සමාජයක් බිහිවීමට පදනම් වූ ප්‍රධාන ක්‍රියාව කුමක් ද?

(1) මදීනා ප්‍රඥාප්තිය
(2) අව්ස් - කස්රජ් එකඟතාවය
(3) මුහාජිර් - අන්සාර් සම්බන්ධතාවය
(4) නජ්රාන්වාසීන් සමඟ වූ ගිවිසුම
(5) හුදෙයිබියා ගිවිසුම

**49.** මව්ලානා ඉල්යාස් (රහ්) තුමාගේ හා මව්ලානා මව්දූදි (රහ්) තුමාගේ තජ්දීද් සේවය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) පළමු වැන්නා උගත් මුස්ලිම්වරුන්ට ද දෙවැන්නා නූගත් මුස්ලිම්වරුන්ට ද දෑවා කළහ.

(2) පළමු වැන්නා හින්දු සංස්කෘතික ආභාෂයට පාත්‍ර වූ මුස්ලිම්වරුන්ට ද දෙවැන්නා බටහිර සංස්කෘතික ආභාෂයට පාත්‍ර වූ මුස්ලිම්වරුන්ට ද දෑවා කළහ.

(3) පළමු වැන්නා ආගම් වෙනස් කරගත් අයට ද දෙවැන්නා අදේවවාදීන්ට ද දෑවා කළහ.

(4) පළමු වැන්නා දේශපාලනයට ද දෙවැන්නා ආධ්‍යාත්මයට ද වැදගත්කම් දී දෑවා කළහ.

(5) පළමු වැන්නා නවීන ක්‍රමයට ද දෙවැන්නා පාරම්පරික ක්‍රමයට ද දෑවා කළහ.

**50.** තජ්දීද් යන්නෙහි අදහස,

(1) ආගමික අංශයක් භාවිතයෙන් ගිලිහී ගිය පසු එය ආරම්භක තත්වයට නගා සිටු වීම

(2) ආගමික සාධක නවීන කාලයට යෝග්‍යය පරිදි සකස් කිරීම

(3) ආගමික ව්‍යවහාරයේදී ගැටලු සහිත කටයුතු සම්බන්ධව සාකච්ඡා කිරීම

(4) ආගමේ නීතිමය ගැටලු වලට විසඳුම්, ආරම්භ කාල ඉමාම්වරුන්ගේ අදහස් අතුරින් සොයා ගැනීම

(5) ආගමික කටයුතු ආගමික දෘෂ්ටියෙන් ද ලෞකික කටයුතු ලෞකික දෘෂ්ටියෙන් ද පිරික්සීම

* * *

# (47) ඉස්ලාම් ශිෂ්ටාචාරය

**II පත්‍රය**

සැලකිය යුතුයි :

* **I** කොටසින් ප්‍රශ්න **දෙකක්ද**, **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරා ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1. (i)** අල්ලාහ් හා මිනිසා අතර ඇති සම්බන්ධය ශක්තිමත් වීමෙන් මිනිසාට හිමි වන ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න.

**(ii)** බහු වාර්ගික සමාජයක සමාජ සන්හිඳියාව ගොඩනැගීමට මුස්ලිම්වරයෙකු පිළිපැදිය යුතු ක්‍රියාමාර්ග හතරක් ලියා එයින් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

**(iii)** පවුලක් කේන්ද්‍රකොට ගනිමින් යහපත පනවා අයහපත වැළකීමේ දී මවකගේ භූමිකාව කෙටියෙන් පැහැදිලි කරන්න.

**(iv)** ආගමික හා සමාජයීය සහජීවනය පිළිබඳ නබි (සල්) තුමාණන්ගේ මඟ පෙන්වීම් හතරක් නිදසුන් සහිතව ලියන්න.

**(v)** මිනිසා හා ඔහුගේ නෆ්ස් අතර ඇති සම්බන්ධය ඉස්ලාමීය දෘෂ්ටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 4 = 20යි.)

**2. (i)** නබි වරුන්ට වහී පහළ කරන ලද ආකාර හතරක් සඳහන් කරන්න.

**(ii)** අල් කුර්ආනය කොටස් වශයෙන් පහල වීමට හේතු වූ කරුණු ලැයිස්තුගත කරන්න.

**(iii)** සහාබාවරු අල් කුර්ආනය අවබෝධ කර ගැනීමට ගත් ක්‍රියාමාර්ග දෙකක් නිදසුන් සහිතව ගෙන හැර දක්වන්න.

**(iv)** වෛද්‍ය ක්ෂේත්‍රයට මුස්ලිම්වරුන් යොමු වීමට තුඩු දුන් හේතු සඳහන් කරන්න.

**(v)** මධ්‍යතන යුගයට අයත් අල්කුවාරිස්මී හා අල්බිරුනී යන විද්‍යාඥයන් භූගෝල විද්‍යා ක්ෂේත්‍රයට දක්වන ලද දායකත්වය අගයන්න. (ලකුණු 5 x 4 = 20යි.)

**3. (i)** ඉස්ලාමයට පෙර ශ්‍රී ලාංකික අරාබියානු සම්බන්ධතාවය ගෙනහැර දක්වන්න.

**(ii)** ශ්‍රී ලංකාවට ඉස්ලාමය හඳුන්වා දීම හා සම්බන්ධ ඓතිහාසික සාධක දෙකක් නිදසුන් සහිතව ලියන්න.

**(iii)** සිංහල රජ සමයේ මුස්ලිම්වරුන්ගේ ආර්ථික ක්ෂේත්‍රයේ දායකත්වය විස්තර කරන්න.

**(iv)** ශ්‍රී ලංකාවේ ආරම්භ කාලයේ මුහුදුබඩ ප්‍රදේශවල මුස්ලිම් ජනාවාස බිහි වීමට තුඩුදුන් හේතු හතරක් සඳහන් කර එය තහවරු කිරීම සඳහා කරුණු දෙකක් ඉදිරිපත් කරන්න.

**(v)** කලීෆාවරුන් වන මුආවියා (රලි), ජව්ෆර් අල් මන්සූර් යන අය පිළිවෙලින් උමෙයියා, අබ්බාසියා, කිලාෆත් ශක්තිමත් කිරීම සඳහා ඉදිරිපත් කළ ක්‍රියාමාර්ග සසඳන්න. (ලකුණු 5 x 4 = 20යි.)

## II කොටස

**4. (i)** ''ෂරීආ'' යන පදය ද, ඉස්ලාමීය ෂරීආවේ විශේෂතාවය ද පැහැදිලි කරන්න.

**(ii)** ''මකාසිදුෂ් ෂරීආ'' හි පියවර තුන නිදසුන් සමඟ ගෙන හැර දක්වන්න.

(ලකුණු 2x10=20 යි.)

**5. (i)** ඉස්ලාමීය නීති ක්ෂේත්‍රයේ මතභේද ඇති වීමට හේතු සඳහන් කර, එයින් දෙකක් විස්තර කරන්න.

**(ii)** මත භේද ඇති වන විට රැකගත යුතු පිළිවෙත් විස්තරාත්මක ව ගෙන හැර දක්වන්න.

(ලකුණු 2x10=20 යි.)

**6. (i)** අබු බක්කර් (රලි)තුමා මුහුණ දුන් අභියෝග සඳහන් කර, ඒවා ජයගත් ආකාරය විමසන්න.

**(ii)** උමර් (රලි)තුමා ඉදිරිපත් කළ ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.

(ලකුණු 2x10=20 යි.)

**7. (i)** නබි (සල්) තුමාණන්ගේ මක්කා ජීවිත කාල දෑවා ක්‍රමවේදයන් පැහැදිලි කරන්න.

**(ii)** ඉස්ලාමයේ '' තජ්දීද්'' සේවයේ අවශ්‍යතාවය විස්තර කරන්න.

(ලකුණු 2x10=20 යි.)

**8. (i)** සෞන්දර්ය පිළිබඳ ඉස්ලාමීය දැක්ම සඳහන් කර, එම ක්ෂේත්‍රයේ මුස්ලිම්වරු නියැලීමට හේතු වූ කරුණු සඳහන් කරන්න.

**(ii)** ''නගර'' හා ''කොටුව'' නිර්මාණය කිරීමෙහිලා උමෙයා, අබ්බාසීය යුගයේ මුස්ලිම්වරුන්ගේ දායකත්වය අගයන්න.

(ලකුණු 2x10=20 යි.)

* * *

# (48) ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

**I පත්‍රය -** **කාලය : පැය 02යි.**

මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත වේ.

**I කොටස**

මෙය ග්‍රීක හා රෝම ඉතිහාසය ආශ්‍රිත වරණ **5** බැගින් වූ බහුවරණ ප්‍රශ්න **30**කින් සමන්විත ය. එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් ලකුණු **60**කි.

**II කොටස**

මෙය ග්‍රීක හා රෝම සාහිත්‍යය ආශ්‍රිත කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න **20**කින් සමන්විත ය. එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් ලකුණු **40**කි.

I පත්‍රය සඳහා මුළු ලකුණු = 100

**II පත්‍රය -** **කාලය : පැය 03යි.** (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10 යි.)

මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත වේ.

**I කොටස - ග්‍රීක හා රෝම ඉතිහාසය**

මෙම කොටස ප්‍රශ්න **පහකින්** සමන්විත වේ. **පළමු** ප්‍රශ්නය **අනිවාර්ය** වන අතර ලකුණු **20**කි. සෙසු ප්‍රශ්න හතරෙන් ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතු වන්නේ එක් ප්‍රශ්නයක් ග්‍රීක ඉතිහාසයෙන් ද එක් ප්‍රශ්නයක් රෝම ඉතිහාසයෙන් ද වන සේ තෝරා ගනිමින් ය. එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ලකුණු 30කි.

**II කොටස - ග්‍රීක හා රෝම සාහිත්‍යය**

මෙම කොටස ප්‍රශ්න **හතරකින්** සමන්විත වේ. **හයවන** ප්‍රශ්නය **අනිවාර්ය** වන අතර ලකුණු **20**කි. සෙසු ප්‍රශ්න තුනෙන් ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ලකුණු 30**කි.**

II පත්‍රය සඳහා මුළු ලකුණු = 100

| | | | |
|---|---|---|---|
| අවසාන ලකුණ ගණනය කිරීම : | I පත්‍රය | = | 100 |
| | II පත්‍රය | = | 100 |
| | අවසාන ලකුණ | = | 200 ÷ 2 = <u>100</u> |

පෙර පැවති ප්‍රශ්න පත්‍ර ව්‍යුහයට අනුකූලව ප්‍රශ්න සකස් කෙරේ.

## (48) கிரேக்க உரோம நாகரிகம்

**வினாத்தாள்களின் கட்டமைப்பு**

**வினாத்தாள் I** - **நேரம் : 02 மணித்தியாலங்கள்.**
இவ்வினாத்தாள் **I, II** ஆகிய இரண்டு பகுதிகளைக் கொண்டதாகும்.

பகுதி **I** - கிரேக்க உரோம நாகரிக வரலாறு பற்றிய **5** தெரிவுகளைக் கொண்ட **30** பல்தேர்வு வினாக்களைக் கொண்டதாகும்.
ஒரு வினாவுக்கு **02** புள்ளிகள் வீதம் **60** புள்ளிகள்.

பகுதி **II** - கிரேக்க உரோம இலக்கியம் பற்றிய **குறு விடைகள்** வழங்க வேண்டிய **20** வினாக்களைக் கொண்டதாகும். ஒரு வினாவுக்கு **02** புள்ளிகள் வீதம் **40** புள்ளிகள்.

வினாத்தாள் **I** இற்கான மொத்தப் புள்ளிகள் **100** ஆகும்.

**வினாத்தாள் II** - **நேரம் : 03 மணித்தியாலங்கள்.** (மேலதிக வாசிப்பு நேரம் 10 நிமிடங்கள்)
இவ்வினாத்தாள் **I, II** ஆகிய **இரண்டு** பகுதிகளைக் கொண்டதாகும்.

பகுதி **I** - **கிரேக்க உரோம வரலாறு**
இப்பகுதி **5** வினாக்களைக் கொண்டது. **முதலாம்** வினா **கட்டாயமானது.** இதற்கான புள்ளிகள் **20** ஆகும். ஏனைய நான்கு வினாக்களில் **இரண்டு** வினாக்களுக்கு விடையளித்தல் வேண்டும். ஒரு வினாவை கிரேக்க வரலாற்றிலிருந்தும் இன்னொரு வினாவை உரோம இலக்கியத்திலிருந்தும் தெரிவு செய்க. ஒவ்வொரு வினாவுக்கும் **15** புள்ளிகள் வீதம் **30** புள்ளிகள்.

பகுதி **II** - **கிரேக்க உரோம இலக்கியம்**
இப்பகுதி **4** வினாக்களைக் கொண்டது. **ஆறாவது** வினா **கட்டாயமானது.** இதற்கான புள்ளிகள் 20 ஆகும். ஏனைய **மூன்று** வினாக்களில் **இரண்டு** வினாக்களுக்கு விடையளித்தல் வேண்டும். ஒரு வினாவுக்கு **15** புள்ளிகள் வீதம் **30** புள்ளிகள்.

வினாத்தாள் **II** இற்கான மொத்தப்புள்ளிகள் **100** ஆகும்.

இறுதிப் புள்ளியைக் கணித்தல் : வினாத்தாள் I = 100
வினாத்தாள் II = 100
இறுதிப் புள்ளி = 200 ÷ 2 = 100

**குறிப்பு** : பழைய வினாத்தாள் கட்டமைப்புக்கு ஏற்ப வினாக்கள் தயாரிக்கப்படும்.

# (48) Greek and Roman Civilization

## Structure of the Question Paper

**paper I -** **Time : 02 hours**

This paper consists of two parts as part I and II

**Part I**

This contains **30** multiple choice questions with **5** options on Greek and Roman Histrory.

Each question carries **02** marks and the total mark is **60**.

**Part II**

This contains **20** short answer supply type questions on Greek and Roman Literature. Each question carries **02** marks and the total mark is **40**.

Total marks of paper I = 100

**paper II -** **Time : 03 hours** (In addition,10 minutes for reading.)

This paper consists of **two** parts as part I and II

**Part I - Greek and Roman History**

This part contains **five** questions. **First** question is **compulsory** and it carries **20** marks. Out of the four remaining questions,two questions have to be answered, selecting one from Greek History and one from Roman History. Each question carries **15** marks making a total of **30** marks.

**Part II - Greek and Roman Literature**

This part contains **four** questions. Question number **six** is **compulsory** and carries **20** marks. Out of the three remaining questions, **two** questions have to be answered. Each question carries **15** marks making a total of **30** marks.

Total marks of paper II = 100

| | | |
|---|---|---|
| Calculation of the final mark : | Paper I | = 100 |
| | Paper II | = 100 |
| | Final marks | = 200 ÷ 2 = 100 |

The questions will be set according to the previous structure.

# (49) ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

**I පත්‍රය -** **කාලය : පැය 02යි.**

වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න **50කි**. ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **01** බැගින් **මුළු ලකුණු 50කි.**

**II පත්‍රය -** **කාලය : පැය 03යි.** (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10 යි.)

මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත වේ.

I කොටස - අර්ධ ව්‍යුහගත ප්‍රශ්න **තුනකි.** ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40කි.

II කොටස - රචනා වර්ගයේ ප්‍රශ්න **පහකි.** ප්‍රශ්න **තුනකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 60කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු = 100

| | | | | |
|---|---|---|---|---|
| අවසාන ලකුණ ගණනය කිරීම : | I පත්‍රය | | | = 50 |
| | II පත්‍රය | = | 100 ÷ 2 | = 50 |
| | අවසාන ලකුණ | | | = 100 |

### I පත්‍රය

**සැලකිය යුතුයි :**

* **සියලු ම** ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.
* **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.(විභාගයේ දී පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ)

---

**1.** සංස්කෘතිය නමින් හඳුන්වනුයේ,
(1) සදාචාරාත්මක ජීවිතයක් ගත කිරීම යි.
(2) සමාජයක සිරිත් විරිත් සහ සම්ප්‍රදායන් සමූහයේ එකතුව යි.
(3) එක් මානව යුගයකින් තවත් යුගයක් කරා ගමන් කිරීම යි.
(4) එක් මානව සමාජයකින් තවත් සමාජයන් වෙන්කොට හඳුනා ගැනීමේ සාධකය යි.
(5) සමාජයේ පරිපාලන ක්‍රියාවලිය යි.

**2.** ජුදා සංස්කෘතිය බිහිවීමෙහිලා ආභාසය ලැබූ පැරණි සංස්කෘතීන් වන්නේ,
(1) මෙසපොතේමියානු, අසිරියානු, හා බැබිලෝනියානු සංස්කෘතීන් ය.
(2) මෙසපොතේමියානු, රෝම හා ඉන්දියානු සංස්කෘතීන් ය.
(3) අසිරියානු, බැබිලෝනියානු හා ලතින් ඇමරිකානු සංස්කෘතීන් ය.
(4) ග්‍රීක, රොම හා ඉන්දියානු සංස්කෘතීන් ය.
(5) මෙසපොතේමියානු, රෝම හා අසිරියානු සංස්කෘතීන් ය.

**3.** පාලන අධිකාරිය දෙවියන්වහන්සේ ලැබුණු ත්‍යාගයක් බවට විශ්වාස කළ ජාතියක් වන්නේ,
(1) රෝමවරුන් ය. (2) චීන ජාතිකයෝ ය. (3) මිසර ජාතිකයෝ ය.
(4) පර්සියන්වරුන් ය. (5) ග්‍රීක ජාතිකයෝ ය.

**4.** පලස්තීන කඳුවැටිය සෑදී ඇති කොටස් හතර ලෙස සැලකෙන්නේ,

(1) ගලීලය, ජුදයාව, සමාරිය, නෙහෙබ් ය. (2) ගලීලය, ජුදයාව, කානන්, නෙහෙබ් ය.

(3) ජුදයාව, පිලිස්තිය, සමාරිය, කානන්ය. (4) ගලීලය, සමාරිය, ජුදයාව, නෙහෙබ් ය.

(5) සමාරිය, පිලිස්තිය, මොවාබ්, එදොම් ය.

**5.** පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

A - දාවිත් රජ සමයේ පලස්තීනය සහ සිරියාව එක් කරමින් ශක්තිමත් රාජ්‍යයක් ගොඩ නැගීමට හැකි විය.

B - දාවිත් රජ සමයේ දී ගිවිසුම් කරඬුව ජෙරුසලමට ගෙන එන ලදී.

C - දාවිත් රජ සමයේ ජෙරුසලමේ දේව මාලිගාවක් ගොඩනැගී ය.

D - ගෝත්‍රික පාලනය අවසන් කරමින් ජෙරුසලම අගනුවරක් බවට පත් කරන ලදී.

E - දාවිත් රජ සමයේ සිටි ප්‍රධාන පූජකතුමා සහ දිවැසිවරයා සාමුවෙල් ය.

ඉහත ප්‍රකාශ අතරින් දාවිත් රජ පිළිබඳ නිවැරදි වන්නේ,

(1) A, B හා C ය. (2) A, B හා D ය. (3) A, D හා E ය.

(4) B, C හා D ය. (5) B, D හා E ය.

**6.** උතුරු රාජ්‍යය සමබන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ අතරින් වැරදි ප්‍රකාශය වන්නේ,

(1) ක්‍රි.පූ 922 දී ජෙරබොවාම් උතුරු රාජ්‍යයේ රජබවට පත් විය.

(2) එලියා දිවැසිවරයා විසින් බාල් නමස්කාරය හෙලා දැක සැබෑ දේව නමස්කාරය නැවත පිහිට වීය.

(3) අහසියා රජගේ කාලයේ දී එලියා දිවැසිවරයාගේ සේවය සිදු විය.

(4) එලිසා, මිකා, ආමොස් සහ හොසියා යන දිවැසිවරු උතුරු රාජ්‍යයෙහි සේවය කළහ.

(5) උතුරු රාජ්‍යයෙහි වැසියෝ ජෙරුසලමෙහි තම වන්දනා කටයුතු සිදු කළහ.

**7.** පලස්තීනයේ ග්‍රීක පාලනය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,

(1) පලස්තීනයේ බොහෝ නගරවල නාම ග්‍රීක නාම බවට පත් වූයේ ය.

(2) ජුදෙව්වරුන් විසින් ග්‍රීක වෛද්‍ය ක්‍රම අනුගමනය කරන ලදී.

(3) පලස්තීනය තුළ ග්‍රීක ක්‍රීඩාංගණ වැනි ගොඩනැගිලි ඇති විය.

(4) බොහෝ ජුදෙව්වරු පලස්තීනය අතහැර ග්‍රීසියෙහි පදිංචියට ගියහ.

(5) ග්‍රීක පාලනය හේතුවෙන් පලස්තීනයේ දේශපාලන හා ආගමික බලය උත්තම පූජකයන් අතට පත් විය.

**8.** පහත සඳහන් මංගල්‍යය අතරින් පැරණි ම කිතුනු මංගල්‍යය දෙක වන්නේ,

(1) පාස්කුව හා පෙන්තකොස්ත (ශුද්ධාත්ම) මංගල්‍යය යි.

(2) පාස්කුව හා නත්තල් මංගල්‍යය යි.

(3) පෙන්තකොස්ත මංගල්‍ය හා නත්තල් මංගල්‍ය යි.

(4) නත්තල් මංගල්‍යය හා අහස්නැගීමේ මංගල්‍යය යි.

(5) අහස් නැගීමේ මංගල්‍යය සහ පාස්කු මංගල්‍යය යි.

**9.** මුල් අවධියේ තාපස ජීවිතයේ දක්නට ලැබුණ ලක්ෂණ අතරින් ප්‍රධාන ලක්ෂණ තුනක් වන්නේ,

(1) නිශ්ශබ්දතාවය, නිරාහාරශීලය, වැඩ කිරීම ය.

(2) නිශ්ශබ්දතාවය, යාචඤා කිරීම, පොදු ජීවිතය ය.

(3) නිශ්ශබ්දතාවය, යාචඤාව, නිරාහාරශීලය ය.

(4) යාචඤාව, වැඩ කිරීම, පොදු ජීවිතය ය.

(5) භාවනාව, වැඩ කිරීම, පොදු ජීවිතය ය.

**10.** බෙනඩික්ත (පංතිය) නිකාය ආදේශ කොට ගනිමින් එම පැවිදි නීතිය අනුව බිහි වූ තවත් පැවිදි පන්තියක් වන්නේ,

(1) ශිෂ්ටශියන් ය. (2) ට්‍රැපිස්ට්ස් ය. (3) කාර්මෙල් ය.

(4) වින්සෙන්ටියන් ය. (5) කැපුචින් ය.

**11.** මුල් ක්‍රිස්තියානි සමූහය තුළ දක්නට ලැබුණ ලක්ෂණ තුනක් වන්නේ වන්නේ,

(1) එක්සත්කම, නිරාහාරශීලය, යාචඤාව ය. (2) එක්සත්කම, නිරාහාරශීලය, බෙදාගැනීම ය.

(3) එක්සත්කම, බෙදාගැනීම, වන්දනා ගමන් යෑම ය. (4) එක්සත්කම, නිරාහාරශීලය, වන්දනා ගමන් යෑම ය.

(5) එක්සත්කම, යාචඤාව, බෙදාගැනීම ය.

**12.** සෙසරියාවේ ශතාධිපතියා වන කොර්නේලියසර්ගේ සිත් හැරීම,

(1) ජුදා ජාතියේ කෝපයට හේතු විය.

(2) ජුදා සහ අන්‍යජාතික ක්‍රිස්තියානින් අතර මතගැටුමකට හේතු විය.

(3) බොහෝ අන්‍ය ජාතිකයන්ගේ සිත් හැරීමට හේතු විය.

(4) සාවුල් විසින් ක්‍රිස්තියානීන් කෙරෙහි සැක පහළ කිරීමට හේතුවක් විය.

(5) රෝම ජාතිකයන් ක්‍රිස්තියානීන් කෙරෙහි සැක පහළ කිරීමට හේතුවක් විය.

**13.** ජෙරුසලමේ මන්ත්‍රණ සභාව පැවැත්වීමට මූලික හේතුව වූයේ,

(1) අන්‍ය ජාතිකයනට කිතු දහම දේශනා කළ යුතුය යන ප්‍රශ්නය යි.

(2) කිතු දහම වැළඳගත් අන්‍ය ජාතිකයන් චර්මඡේදනය කළ යුතුද යන ප්‍රශ්නය යි.

(3) ශුභාරංචිය දේශනා කිරීමේ දී පළමුව එය ජුදා ජාතිකයන්ට කළ යුතු ද යන ප්‍රශ්නය යි.

(4) ග්‍රීක ජාතික වැන්දඹුවනට දයාවේ කටයුතු ඉටුනොවීම සම්බන්ධයෙන් පැන නැඟුණු ප්‍රශ්නය යි.

(5) බර්නබාස්තුමන් හා පාවුලුතුමන් අතර ඇති වූ මත ගැටුමකි.

**14.** ශුද්ධ වූ පාවුලුතුමන්ගේ සිත්හැරීම සිදු වූයේ,

(1) සමාරියට යන අතරතුර ය. (2) ඩැමැස්කයට යන අතරතුර ය.

(3) ජෙරුසලමට යන අතරතුර ය. (4) ඒපීසියට යන අතරතුර ය.

(5) පිලිප්පියේ ධර්ම ශාලාවකදී ය.

**15.** තෙයියාර් ඩි ෂාර්ඩැන් පියතුමා පිළිබඳව **නොගැළපෙන** වගන්තිය වන්නේ,

(1) එතුමා ජේසු නිකායික පියතුමෙකි.

(2) එතුමා පාෂාණ භූත විද්‍යාඥයෙක් සහ භූ විද්‍යාඥයකි.

(3) එතුමා ප්‍රසිද්ධ සාහිත්‍යධරයෙකි.

(4) එතුමා පීකින් මානවයා සොයා ගත් කණ්ඩායමේ එක් අයෙකු වූයේ ය.

(5) ක්‍රිස්තුන් වහන්සේ තුළ ඉතිහාසයේ පූර්ණත්වය සිදුවන බව එනම් ඔමේගා ලක්ෂ්‍යය පිළිබඳව ලිවීය.

**16.** පහත සඳහන් වගන්ති අතරින් ඇල්බට් අයින්ස්ටයින් පිළිබඳව නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) අයින්ස්ටයින් සාපේක්ෂතාවාදය පිළිබඳ සිද්ධාන්තය සොයා ගත්තේ ය.

(2) අයින්ස්ටයින් අදේවවාදියෙකි.

(3) අයින්ස්ටයින් විශ්වාසය පිළිබඳ ගැටලුවකට මුහුණ දෙන ලදී.

(4) අයින්ස්ටයින් භෞතික විද්‍යාඥයෙකු නොවේ.

(5) අයින්ස්ටයින් ගුරුත්වාකර්ෂණය පිළිබඳව සොයා ගන්නා ලදී.

**17.** ශුද්ධ වූ අගුස්තිනුතුමන් පිළිබඳ ව නිවැරදි ප්‍රකාශ තෝරන්න.

A - කිතුණු සභා ඉතිහාසයේ ශ්‍රෙෂ්ඨතම ලතින් සභා පියා ය.

B - පාප උච්චාරණය නමැති ග්‍රන්ථය එතුමන් ලියූ ග්‍රන්ථ අතර ශ්‍රෙෂ්ඨතම ග්‍රන්ථයකි.

C - එතුමන් කලක් මැනිකිවාදය පිළිගෙන සිටියේ ය.

D - ශාන්ත ජෙරොම්තුමා එතුමන්ගේ ගුරුවරයා වූයේ ය.

E - එතුමන් ඇරිස්ටෝටල්ගේ දර්ශනය ගුරුකොට ගත්තේ ය.

(1) A , B හා C ය. (2) A, B හා D ය. (3) A, C හා D ය.

(4) B, C හා D ය. (5) B, C හා E ය.

**18.** පහත සඳහන් ප්‍රකාශ අතරින් ශුද්ධ වූ තෝමස් ඇක්වයිනස්තුමන් පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) එතුමන් දොමිනිකාන නිකායික පියතුමෙකි, දේව ධර්ම චින්තකයෙකි, සහා ඉතිහාසය පිළිබඳ විශාරදයෙකි.

(2) දේව ධර්ම චින්තකයෙකි, ස්කොලැස්ටික් නමැති ක්‍රම වේදය අනුගමනය කළ අයෙකි, ඉතිහාසය පිළිබඳ විශාරදයෙකි.

(3) දොමිනිකාන පියතුමෙකි, ප්ලේටෝගේ අර්ශනය අනුගමනය කළ අයෙකි, දේව ධර්ම චින්තකයෙකි.

(4) දේවධර්ම චින්තකයෙකි, ස්කොලැස්ටික් ක්‍රමවේදය අනුගමනය කළ අයෙකි, දොමිනිකාන පියතුමෙකි.

(5) දොමිනිකාන පියතුමෙකි, සහා ඉතිහාසය පිළිබඳ විශාරදයෙකි, ප්ලේටෝගේ දර්ශනය අනුගමනය කළ අයෙකි.

**19.** පහත සඳහන් ප්‍රකාශ අතරින් යුප්‍රටීස් - ටයිග්‍රිස් ගංගා නිම්න ශිෂ්ටාචාරය පිළිබඳව නිවැරදි ප්‍රකාශ වන්නේ,

A - නූතන ඉරාකය පුරාණයේ දී මෙසපොතේමියාව යනුවෙන් හඳුන්වන ලදී.

B - ගණිතය, වෛද්‍ය විද්‍යාව සහ ජ්‍යොතිශය මෙම ප්‍රදේශය තුළ වැඩි වර්ධනය විය.

C - මෙසපොතේමියාවේ පාලකයා විසින් මුළු ප්‍රදේශයම පාලනය කරන ලදී.

D - මෙම ප්‍රදේශයේ මූලික ජීවන මාර්ගය වූයේ කෘෂිකර්මය හා සත්ත්ව පාලනය යි.

E - මහා ඇලෙක්සැන්ඩර් රජතුමා කලක් මෙම ප්‍රදේශයෙහි පාලකයාව සිටියේ ය.

(1) A, B හා D ය. (2) A, C හා D ය. (3) B, C හා D ය.

(4) B , D හා E ය. (5) C, D හා E ය.

**20.** පවුල් ජීවිතය හා සම්බන්ධව ශුද්ධ වූ පාවුළුතුමන්ගේ ඉගැන්වීම් තුනක් අඩංගු වන ප්‍රකාශය තෝරන්න.

(1) ස්වාමි පුරුෂයා සහ භාර්යාව අතර සම්බන්ධ ක්‍රිස්තුන් වහන්සේ සහ සභාව අතර සම්බන්ධයට සමාන ය, ක්‍රිස්තුන් වහන්සේ සභාවට ප්‍රේම කළාක් මෙන් ස්වාමි පුරුෂයා තම භාර්යාවට ප්‍රේම කළ යුතු ය, භාර්යාව සෑම කාර්‍යයේදී ම ස්වාමිපුරුෂයාට යටත් විය යුතු ය.

(2) ස්වාමි පුරුෂයා සහ භාර්යාව අතර සම්බන්ධ ක්‍රිස්තුන් වහන්සේ සහ සභාව අතර සම්බන්ධයට සමාන ය, ක්‍රිස්තුන් වහන්සේ තුළ ජීවත් වීමේ දී ස්ත්‍රී පුරුෂ භේදයක් නැත. තම භාර්යාව දික්කසාද කිරීමේ අයිතිය ස්වාමි පුරුෂයාට හිමි වේ.

(3) ක්‍රිස්තුන් වහන්සේ සභාවට ප්‍රේම කළාක් මෙන් ස්වාමි පුරුෂයා තම භාර්යාවට ප්‍රේම කළ යුතු ය, ක්‍රිස්තුන් වහන්සේ සභාවේ හිස වනන්නාක් මෙන් ස්වාමි පුරුෂයා භාර්යාවගේ හිසය, පුරුෂයා හා ස්ත්‍රිය එකිනෙකට සමාන නැත.

(4) ස්වාමි පුරුෂයා සහ භාර්යාව අතර සම්බන්ධ ක්‍රිස්තුන් වහන්සේ සහ සභාව අතර සම්බන්ධයට සමානය ක්‍රිස්තුන් වහන්සේ සභාවට ප්‍රේම කළාක් මෙන් ස්වාමි පුරුෂයා භාර්යාවට ප්‍රේම කළ යුතු ය, ක්‍රිස්තුන්වහන්සේගේ සභාවේ හිස වන්නාක් මෙන් ස්වාමි පුරුෂයා භාරයාවගේ හිස ය.

(5) ස්වාමි පුරුෂයා සහ භාර්යාව අතර සම්බන්ධය ක්‍රිස්තුන් වහන්සේ සහ සභාව අතර සම්බන්ධයට සමාන ය, ක්‍රිස්තුන් වහන්සේ සභාවේ හිස වනන්නාක් මෙන් ස්වාමි පුරුෂයා භාර්යාවගේ හිස ය, පුරුෂයා හා එක සමාන නොවේ.

**21.** මෙසපොතේමියාව සම්බන්ධයෙන් පහත ප්‍රකාශ සලකා බලන්න.

A - මෙසපොතේමියාවේ ප්‍රධාන ජීවන මාර්ග කෘෂිකර්මය සහ සත්ත්ව පාලනය යි.

B - සිහින අර්ථ නිරූපනය කිරීමේ පුරුද්දක් මෙහි ජනයා අතර තිබිණි.

C - පළමුවෙන් කාසි භාවිත කළේ මෙහි ජනයා විසිනි.

D - ග්‍රන්ථකරණය සඳහා මෙහි ජනයා පැපිරස් භාවිතා කරන ලදී.

E - ඔවුන් විසින් අත්තික්කා ගෙඩි බෙහෙත් සඳහා භාවිතා කරන ලදී.

ඉහත ප්‍රකාශ ඇසුරෙන් මෙසපොතේමියාව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A , B හා C ය. (2) A, B හා D ය. (3) A, C හා D ය.

(4) B ,C හා D ය. (5) C, D හා E ය.

**22.** හෙලනිකවාදය යනුවෙන් හැඳින්වෙන්නේ,
(1) ග්‍රීක සහ නැගෙනහිර ආසියානු ශිෂ්ටාචාරයන්ගේ එකතුවකි.
(2) ග්‍රීක සහ මෙසපොතේමියානු ශිෂ්ටාචාරයන්ගේ එකතුවකි.
(3) ග්‍රීක සහ නයිල් ගංගා නිම්න ශිෂ්ටාචාරයන්ගේ එකතුවකි.
(4) ග්‍රීක සහ රෝම ශිෂ්ටාචාරයන්ගේ එකතුවකි.
(5) මෙසපොතේමියාව සහ නයිල් ගංගා නිම්න ශිෂ්ටාචාරයන්ගේ එකතුවකි.

**23.** දෙසැම්බර් මස 25 වන දිනට නත්තල් මංගල්‍යය පැවැත්වීමේ සිරිත ආරම්භ කළ වර්ෂය වන්නේ,
(1) ක්‍රි.ව. 6 දී ය. (2) ක්‍රි.ව. 33 දී ය. (3) ක්‍රි.ව. 325 දී ය.
(4) ක්‍රි.ව. 366 දී ය. (5) ක්‍රි.ව. 1054 දී ය.

**24.** පෙන්තකොස්ත මංගල්‍යය (ශුද්ධාත්ම මංගල්‍යය) පැවැත්වූයේ,
(1) පාස්කුවට දින හතළිහකට පසුව ය.
(2) පාස්කුවට දින හතළිස් පහකට පසුව ය.
(3) පාස්කුවට දින හතළිස් නමයකට පසුව ය.
(4) පාස්කුවට දින පනහකට පසුව ය.
(5) පාස්කුවට දින හැටකට පසුව ය.

**25.** ජර්මනියේ අපෝස්තුලුවරයා ලෙස හැඳින්වූයේ,
(1) ශාන්ත කොලොම්බන් තුමා ය. (2) ශාන්ත පැට්රික් තුමා ය.
(3) ශාන්ත බොනිපස් තුමා ය. (4) ශාන්ත බෙනඩික් තුමා ය.
(5) ශාන්ත බැසිල් තුමා ය.

**26.** ජෙරුසලම් මන්ත්‍රණ සභාවේ දී ගනු ලැබූ තීරණයක් **නොවන්නේ**,
(1) දේව රූපවලට ඔප්පුකරන ලද ආහාර අනුභව නොකිරීම යි.
(2) අන්‍ය ජාතිකයන් සමඟ එක්ව ආහාර නොගැනීම යි.
(3) බොටුව මිරිකා මරන ලද සතුන්ගේ මස් අනුභව නොකිරීම යි.
(4) බොටුව මිරිකා සතුන්ගේ මස් අනුභව නොකිරීම යි.
(5) තහනම් විවාහ සම්බන්ධතාවලට ඇතුළත් නොවීම යි.

**27.** පහත සඳහන් ග්‍රන්ථ ගැන සලකා බලන්න.
A - ශාන්තුවරුන්ගේ චරිත කතා (The Life of Smintf)
B - ක්‍රිස්තු අනුසාරය (Immidention of Christ)
C - පදනම (Foundation)
D - අධ්‍යාත්මික ගීතය (Spiritral Canticle)
E - ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත කථාව (The Life of Christ )
ඉහත සඳහන් ග්‍රන්ථ අතරින් ශුද්ධ වූ ඉග්නේෂියස් ලොසෙලාතුමන්ගේ ජීවිතයට බලපෑ ග්‍රන්ථ වන්නේ,
(1) A සහ B ය. (2) A සහ E ය. (3) B සහ C ය.
(4) C සහ D ය. (5) D සහ E ය.

**28.** මහා චාල්ස් අධිරාජයා (චාල්මේන්) විසින් රදගුරුතුමන්ලාට ඉටු කිරීමට නියම කළේ,
(1) වයිකින් හමුදාවන් අල්ලා ගැනීම යි.
(2) ආසන දේව මන්දිර ආශ්‍රිතව පාසල් ගොඩනැගීම යි.
(3) යුරෝපීය ගෝත්‍රයන් කිතු දහමට හැරවීම යි.
(4) කුලීන හා ධනවත් පවුල්වල ළමුන්ට උසස් අධ්‍යාපනයක් ලබා දීම යි.
(5) ප්‍රජා ප්‍රසාදිතුමන්ලාව ගුරුවරුන් වශයෙන් පත් කිරීම යි.

**29.** අහිමි වූ පරාදීසය (Pradise Lost) නැමැති ග්‍රන්ථය රචනා කරන ලද්දේ,

(1) ජෝන් බැන්යන් විසිනි. (2) සර්වානෝ තෝමස් විසිනි.
(3) ජෝන් මිල්ටන් විසිනි (4) ඩාන්වේ අලගියේරේ විසිනි.
(5) තෝමස් කම්පිස් විසිනි.

**30.** මන්නාරමේ වැසියන් ප්‍රාණ පරිත්‍යාගීන් බවට පත් වූ වර්ෂය වන්නේ,

(1) ක්‍රි.ව. 1520 දී ය. (2) ක්‍රි.ව. 1544 දී ය. (3) ක්‍රි.ව. 1560 දී ය.
(4) ක්‍රි.ව. 1564 දී ය. (5) ක්‍රි.ව. 1568 දී ය.

**31.** පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

A - මයිකල් ආන්ජලෝ ප්‍රසිද්ධ සිත්තරෙකු හා මූර්ති ශිල්පියෙකි.
B - ඔහු සිශ්ටයින් දේව මන්දිරයේදී වහලෙහි (සීලිමෙහි) ලෝකය මැවීමේ සිද්ධිය සිතුවම් කරන ලදී.
C - ආසනගත දේවමාතාවෝ (මැඩෝනා) ඔහුගේ විශිෂ්ට නිර්මාණයකි.
D - ඔහු විසින් ''අවසාන විනිශ්චය'' සිතුවම් ගත කරන ලදී.
E - ඔහු ''දේව සිත්තරා'' යන නමින් හඳුන්වන ලදී.

ඉහත ප්‍රකාශ අතරින් මයිකල් ආන්ජලෝ පිළිබඳ නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A, B හා C ය. (2) A, B හා D ය. (3) A, D හා E ය.
(4) B, C හා D ය. (5) C, D හා E ය.

**32.** පහත සඳහන් ප්‍රකාශ අතරින් පිලිප් බල්දේව්ස්තුමන් සම්බන්ධයෙන් **නොගැළපෙන** ප්‍රකාශය වන්නේ,

(1) එතුමාව හමුදා සේවය සඳහා ගාල්ලට යැවීම යි.
(2) යාපනය ප්‍රදේශයෙහි කැල්විනිස්ත වාදය ප්‍රචලිත කිරීමට එතුමා මහත් පරිශ්‍රමයක් දැරී ය.
(3) ආගම ප්‍රචාරය කිරීමේ ආධාරකයක් ලෙස එතුමා දේශීය භාෂාව ප්‍රගුණ කළේ ය.
(4) එතුමා දෙමළ භාෂාවෙන් බොහෝ පත්‍රිකා ලිවී ය.
(5) කොළරා රෝගය හේතු කොටගෙන එතුමා යාපනයේ දී මිය ගියේ ය.

**33.** ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය ගොඩ නැගීමෙහිලා සෘජුවම බලපෑ ශිෂ්ටාචාර මොනවාද ?

(1) සුමේරියන්, පර්සියන්, ඇසිරියන් (2) ජුදා, ග්‍රීක, රෝම
(3) ඇසිරියන්, බැබිලෝනියන්, කානා (4) ජුදා, පර්සියන්, සුමේරියන්
(5) රෝම, මෙසපොතේමියානු, ඇසිරියන්

**34.** වල්ගේට් යන්නෙහි අර්ථය වන්නේ,

(1) ශුද්ධ වූ බයිබලයේ ලතින් පරිවර්තනය යි.
(2) ග්‍රීක දර්ශනය පිළිබඳ ග්‍රන්ථය යි.
(3) ශුද්ධ වූ බයිබලයේ හිබෲ පිටපත යි.
(4) සභා පියවරුන් විසින් ලියූ ලිපිය යි.
(5) ශුද්ධ වූ බයිබලයේ ග්‍රීක පරිවර්තනය යි.

**35.** ග්‍රීක භාෂාවෙන් ලියවුණු ශුද්ධ වූ බයිබලීය ග්‍රන්ථ වන්නේ,

(1) උත්පත්ති පොත සහ නික්ම යාම යි.
(2) ප්‍රඥාවන්තයා සහ ශු.ලූක් සුබ අස්න යි.
(3) ආමොස් සහ යෙසායා යි.
(4) ද්විතීය නීති සංග්‍රහය සහ රෝමවරුන්ට ලියූ ලිපිය යි.
(5) යාකොබ් 1,2 සහ සලමොන්ගේ ගීතය යි.

**36.** පහත සඳහන් සම්බන්ධතා අතරින් **නොගැළපෙන** සම්බන්ධතා වන්නේ,

A - උගතුන්ගේ භාෂාව - ලතින්

B - ග්‍රීක දර්ශනය - ඥානවාදය

C - මෙසපොතේනියානු ශිෂ්ටාචාරය - ශිෂ්ටාචාරයේ තොටිල්ල

D - මැසරොටික් ග්‍රන්ථ (ලියවිලි) - ග්‍රීක බයිබලයේ ජුදා ග්‍රන්ථ

E - අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත - මතෙව්තුමා

(1) A, B සහ C ය. (2) A, D සහ E ය. (3) B, C සහ D ය.

(4) B, D සහ E ය. (5) C, D සහ E ය.

**37.** ජෙරුසලමේ රජ වංශයෙන් රෙහෝබොවාම් රජ විසින් පාලනය කරන ලද ගෝත්‍ර වන්නේ,

(1) රූබෙන් සහ ජුදෙයාව ය.

(2) දාන් සහ නෙප්තාලි ය.

(3) අෂර් සහ ලෙවි ය.

(4) ජුදෙයාව සහ බෙන්ජමින් ය.

(5) කාන් සහ බෙන්ජමින් ය.

**38.** පරිසිවරුන්ගේ සහ සදිසිවරුන්ගේ කණ්ඩායම් බිහි වුයේ,

(1) ක්‍රි.පු. 63 දී රෝම අධිරාජ්‍යයා වන නිරෝගේ සමයේ දී ය.

(2) ක්‍රි.පු. 200 දී ඊජිප්තියානු සෙන්පති ටොලමිගේ සමයේ දී ය.

(3) ක්‍රි.පු. 200 දී සිරියාවේ රජ වන 3වන අන්තියෝක් සමයේ දී ය.

(4) ක්‍රි.පු. 333 දී ග්‍රීක අධිරාජ්‍ය මහා ඇලෙක්සැන්ඩර්ගේ සමයේ දී ය.

(5) ක්‍රි.පු. 597 දී බැබිලෝනියාවේ රජ වන නබුකද්නසාර්ගේ සමයේ දී ය.

**39.** දාවිත් රජතුමන්ව අභිෂේක කරන ලද ස්ථානය වන්නේ,

(1) කපර්නාවුම් ය. (2) නෙහෙබ් ය. (3) නාසරෙත් ය.

(4) හෙබ්රෝන් ය. (5) බෙතනි ය.

**40.** පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

A - ලුතර්තුමාගේ අදහස් පිළි ගනිමින් ලුතර්ගෙන් ධර්මය වැළඳ ගත්තේ ය.

B - ප්‍රතිසංස්කරණ සභාවන්හි ප්‍රධාන ස්ථානය ලෙස ජිනීවා නගරය පත් කළේ ය.

C - දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ ක්‍රිස්තුන් වහන්සේ වැඩ නොසිටින බවත් එය භෝජනයක් පමණක් බවත් ප්‍රකාශ කළේ ය.

D - දෙවියන් වහන්සේ විසින් පෙරදී තෝරා ගත් අය පමණක් ස්වර්ගයට යන බව පිළිගත්තේ ය.

E - ශුද්ධොත්තම පියතුමන්ගේ බලය කොන්දේසි සහිතව පිළිගත්තේ ය.

ඉහත සඳහන් ප්‍රකාශ අතරින් කැල්වින්තුමන් පිළිබඳ සත්‍ය ප්‍රකාශ වන්නේ,

(1) A, B හා C ය. (2) A, B හා D ය. (3) A ,C හා E ය.

(4) B, C හා D ය. (5) C, D හා E ය.

**41.** ජුදා විවාහ සිරිත් අතර දක්නට **නොලැබෙන** අංගය වන්නේ,

(1) විවාහයට පෙර විවාහ ගිවිසුම ඇති කර ගැනීම යි.

(2) මනාලියව පෙරහැරකින් නිවසට කැඳවාගෙන යාම යි.

(3) විවාහයට පැමිණෙන අයට විවාහ වස්ත්‍ර දීම යි.

(4) භාර්යාවන් දෙදෙනෙකු එකවර විවාහ කර ගැනීමට අවසර තිබීම යි.

(5) පුරුෂයාට පමණක් දික්කසාද වීමේ අවසරය තිබීම යි.

**42.** පහත සඳහන් ප්‍රකාශ අතරින් මතෙව් රිචිතුමන් පිළිබඳ **නොගැළපෙන** ප්‍රකාශය වන්නේ,

(1) එතුමා ඉතාලි ජාතික ජේසු නිකායික පියතුමෙකි.

(2) එතුමා ධර්මදූත සේවය සඳහා චීනයට පැමිණියේ ය.

(3) චීන ජාතිකයන් කිතු දහමට හරවා ගැනීම නිසා එතුමාව චීනයෙන් පිටුවහල් කළේ ය.

(4) එතුමා චීන භාෂාවෙන් ධර්මෝපදේශ ග්‍රන්ථයක් සම්පාදනය කළේ ය.

(5) එතුමා කොම්පියුසියන් ගුරුවරුන්ගේ ජීවිත ක්‍රමය අනුගමනය කළේ ය.

**43.** පහත සඳහන් ප්‍රකාශ අතුරින් එකිනෙකට **නොගැළපෙන** කොටස් ඇති ප්‍රකාශය තෝරන්න.

(1) සීරෝ මලබාර් සභාව - රෝමානු කතෝලික සමඟ සම්බන්ධව සිටි යි.

(2) සීරෝ මලන්කාර සභාව - අන්තියෝකියානු ජන වන්දනා පිළිවෙත් අනුගමනය කරයි.

(3) මාර් තෝමා සභාව - ඇන්ග්ලිකානු සභාව සමඟ ඉතා සමීප සම්බන්ධතාවයක් පවත්ව යි.

(4) රෝමානු කතෝලික සභාව - රෝමානු වන්දනා පිළිවෙත් අනුගමනය කිරීම යි.

(5) සීරෝ මලබා සීරෝ මලංකාර සභා - ශුද්ධෝත්තම පියතුමන්ට පක්ෂපාතීත්වය දක්වයි.

**44.** ජපානයේ කිතු දහම සම්බන්ධයෙන් පහත ප්‍රකාශ සලකා බලන්න.

A - ක්‍රි.ව. පස්වන සියවසේදී ජපානයේ නෙස්ටෝරියානු කිතු දහම තිබූ බව සඳහන් වෙයි.

B - ජපානයේ ප්‍රථමයෙන්ම කිතු දහම දේශනා කළේ ජේසු නිකායික පියවරුන් විසිනි.

C - ජපානය තුළ කිතු දහම පැතිර වීමට සැමවිට රාජානුග්‍රහය ලැබිණි.

D - ප්‍රොතෙස්තන්ත ධර්මදූතයන් විසින් ශුද්ධ වූ බයිබලය ජපන් භාෂාවට පරිවර්ථනය කරන ලදි.

E - ජපාන ජාතිකයන් අතරින් තුනෙන් එකක් පමණ කොටසක් කතු දහම අදහයි.

ඉහත ප්‍රකාශ අතරින් ජපානය පිළිබඳ නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A, B හා C ය. (2) A, B හා D ය. (3) B, C හා D ය.

(4) B, D හා E ය. (5) C, D හා E ය.

**45.** හයවන සියවසේ දී ශ්‍රී ලංකාවේ කිතුනුවන් සමූහයක් සිටි බව දැක්වෙන ග්‍රන්ථය රචනා කර ඇත්තේ,

(1) කොස්මොස් ඉන්ඩිපෙලෙක්ටුස් ය. (2) මාර්තෙන්ද පෝරෝ ය.

(3) කනාහි තෝමස් ය. (4) ඉපොෂ් අබ්සාකිබ් ය.

(5) පාහියන් භික්ෂුන්වහන්සේ ය.

**46.** පෘතුගීසීන් පළමුවරට ශ්‍රී ලංකාවට පැමිණියේ කවර නායකයාගේ නායකත්වය යටතේ ද?

(1) ක්‍රිස්ටෝපර් කොලොම්බස්

(2) වස්කෝද ගාමා

(3) ප්‍රැන්සිස්කෝද අල්මේදා

(4) ප්‍රැන්සිස්කෝ මැගලන්

(5) ලොරෙන්සෝ ද අල්මේදා

**47.** පහත සඳහන් ප්‍රකාශ අතරින් ප්‍රැන්සිස්කානු ධර්මදූතවරුන් සම්බන්ධයෙන් සත්‍ය ප්‍රකාශය වන්නේ,

A - ශ්‍රී ලංකාවට පළමුවෙන්ම පැමිණි ධර්මදූතවරුන් ය.

B - මෙම ධර්මදූතයන් ශ්‍රී ලංකාවට පැමිණියේ ධර්ම ප්‍රචාරය සඳහා ය.

C - මෙම ධර්මදූතවරු දේවස්ථාන අවට කුඩා පාසල් ආරම්භ කළහ.

D - කතෝලික ධර්මය වැළඳ ගැනීමට ප්‍රතික්ෂේප කළ අයට පාලකයන් ලවා දඬුවම් ලබා දුන්හ.

E - කතෝලික ධර්මය වැළඳගත් අයට යම් විශේෂ වරප්‍රසාද හිමි විය.

(1) A, B හා C ය. (2) A, C හා D ය. (3) A, C හා E ය.

(4) B, C හා D ය. (5) C, D හා E ය.

**48.** පෘතුගීසීන්ගේ පැමිණීමෙන් ශ්‍රී ලාංකික සමාජයට අත්වූ බලපෑම ගැන සඳහන් වන පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,

A - විවාහ ලියාපදිංචි කිරීමේ එනම් තෝම්බු ක්‍රමය ඇති විය.

B - සිංහල භාෂාවට බොහෝ අලුත් වචන රාශියක් එක් විය.

C - නූතන අධ්‍යාපන ක්‍රමය ආරම්භ විය.

D - ගෘහ නිර්මාණ ශිල්පයේ විශාල දියුණුවක් ඇති විය.

E - රට තුළ ආර්ථික වර්ධනයක් ඇති විය.

(1) A, B හා C ය. (2) A, B හා D ය. (3) B, C හා D ය.
(4) B, C හා E ය. (5) C, D හා E ය.

**49.** ගොන්සාල්වෙස් පියතුමන් පිළිබඳ වැරදි ප්‍රකාශය වන්නේ,

(1) ගොන්සාල්වෙස් පියතුමන් බ්‍රාහ්මණ වංශයට අයත් ගෝවානු ජාතික පියතුමෙකි.

(2) එතුමා ඔරතෝරියානු නිකායට බැඳී ශ්‍රී ලංකාවට පැමිණියේ ය.

(3) ගොන්සාල්වෙස් පියතුමාට සිංහල කිතුනු සාහිත්‍යයක් බිහි කිරීමට හැකි විය.

(4) ගොන්සාල්වෙස් පියතුමා දෙමළ භාෂාවෙන් ලියූ පොත් ගණන දෙකකි.

(5) ගොන්සාල්වෙස් පියතුමාගේ සිරුර බෝලවත්ත දේවස්ථානය තුළ මිහිදන් කරවා ඇත.

**50.** ඕලන්ද ජාතීන්ගේ පාලන සමයේ අධ්‍යාපනය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

A - ස්වදේශ භාෂාවන්ගෙන් අධ්‍යාපනය දෙන ලදී.

B - ඉගැන්වීම පිණිස ස්වදේශිකයන් ගුරුවරුන් ලෙස පුහුණු කරන ලදි.

C - පාසල් පරිපාලන ක්‍රමයක් හඳුන්වා දෙන ලදි.

D - අධ්‍යාපනය සඳහා දේවස්ථාන අසල වේදිකා ගොඩනගා නාට්‍ය නාඩගම් ආදිය පෙන්වන ලදි.

E - පිරිමි ළමුන්ට පමණක් අධ්‍යාපනය අනිවාර්ය කරන ලදි.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A, B හා C ය. (2) A, B හා D ය. (3) B, C හා D ය.
(4) B, C හා E ය. (5) C, D හා E ය.

* * *

# (49) ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

**II පත්‍රය**

* සැලකිය යුතුයි :

* I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** **(i)** ක්‍රිස්තු වර්ෂ පළමු ශත වර්ෂයේ පලස්තීනයේ රෝමානු පරිපාලනය පිළිබඳ කරුණු හතරක් ලියන්න.

**(ii)** හෙරොද් රජුගේ පාලනයේ ලක්ෂණ පිළිබඳව කරුණු හතරක් ලියන්න.

**(iii)** ජුදා නායක පූජකවරුන් පිළිබඳව කරුණු හතරක් ලියන්න.

**(iv)** ජුදා මන්ත්‍රණ සභාව පිළිබඳ කරුණු හතරක් ලියන්න.

**(v)** පුරාණ පලස්තීනයේ ග්‍රීක පාලනය පිළිබඳ කරුණු හතරක් ලියන්න. (ලකුණු 5x4 =20යි.)

**2.** **(i)** මිලාන් ආඥවේ ප්‍රතිඵලයක් ලෙස ක්‍රිස්තියානීන්ට අත්වූ යහපත පිළිබඳ කරුණු හතරක් සඳහන් කරන්න.

**(ii)** යුරෝපීය ගෝත්‍රයන් වෙනුවෙන් බෙනඩික්ටාන තාපසවරුන් ගෙන් සිදුවූ සේවාවන් හතරක් සඳහන් කරන්න.

**(iii)** මධ්‍යතන යුගයේ යුරෝපයේ සභාව තුළ සිදුවූ අක්‍රමිකතා හතරක් සඳහන් කරන්න.

**(iv)** කුරුසයේ ශුද්ධ වූ ජුවාම්තුමන් විසින් අධ්‍යාත්මිකත්වය පිළිබඳව ලියූ ග්‍රන්ථ හතරක නම් සඳහන් කරන්න.

**(v)** කුරුස යුද්ධ වලින් අත්වූ අයහපත් ප්‍රතිඵල හතරක් සඳහන් කරන්න. (ලකුණු 5x4 =20යි.)

**3.** **(i)** ප්‍රොතෙස්තන්ත්‍ර ප්‍රතිසංස්කරණය ඇති වීමට බලපෑ හේතු හතරක් සඳහන් කරන්න.

**(ii)** මාටින් ලූතර්තුමන්ගේ ඉගැන්වීම් හතරක් සඳහන් කරන්න.

**(iii)** ප්‍රොතෙස්තන්ත්‍ර ප්‍රතිසංස්කරණයේ ප්‍රතිඵලයක් ලෙස සභාව තුළ සිදුවූ වෙනස්කම් හතරක් සඳහන් කරන්න.

**(iv)** ත්‍රිදෙන්තියානු මන්ත්‍රණ සභාව මගින් ගත් තීරණ හතරක් සඳහන් කරන්න.

**(v)** ප්‍රොතෙස්තන්ත්‍ර ප්‍රතිසංස්කරණයෙන් පසුව කතෝලික සභාව තුළ බිහි වූ ඕනෑම පැවිදි පන්ති හතරක නම් ලියන්න. (ලකුණු 5x4 =20යි.)

## II කොටස

**4. (i)** ග්‍රීක-රෝම ශිෂ්ටාචාරයේ විශේෂ ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 10යි.)

**(ii)** බහු වාර්ගික සහ බහු ආගමික ජාතියක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ සමගිය ඇති කිරීමට ග්‍රීක රෝම ශිෂ්ටාචාරයෙන් උගත හැකි පාඩම් විස්තර කරන්න. (ලකුණු 10යි.)

**5. (i)** ''කන්ද'' උඩ දේශනය පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 10යි.)

**(ii)** සාධාරණ සමාජයක් ගොඩනැගීම සඳහා කන්ද උඩ දේශනය මඟින් ඉගැන්වූ වටිනාකම්වල ඇති ප්‍රයෝජනවත් බව පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 10යි.)

**6. (i)** ක්‍රිස්තියානි යුගයේ පළමු ශතවර්ෂය තුළ ක්‍රිස්තියානීන් මුහුණ පෑ අභියෝග නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

**(ii)** සුවිශේෂී වටිනාකම්වල සැබෑ සාක්ෂිකරුවන්වීමේ දී ක්‍රිස්තියානීන්ට මුහුණ පෑමට සිදුවන අභියෝග නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 10යි.)

**7. (i)** ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සඳහා දායක වූ කිතුනු නායකයන් දෙදෙනෙකු පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 10යි.)

**(ii)** ශ්‍රී ලංකාවේ ද්විතීය අධ්‍යාපනය වැඩි දියුණු කිරීමෙහි ලා සභාවට දායක විය හැකි ආකාරය පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 10යි.)

**8. (i)** ක්‍රිස්තියානි කලාවේ උන්නතිය සඳහා මයිකල් ආන්ජලෝ සහ ලියනාඩෝ ඩාවින්චි යන දෙදෙනාගෙන් සිදු වූ මූලික සේවාවන් පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

**(ii)** පාසල් වල ක්‍රිස්තියානි අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් නාට්‍ය, චිත්‍ර, සංගීතය, නූතන ජන මාධ්‍ය වැනි කලා මාධ්‍ය යොදා ගැනීමේ ඇති සඵලත්වය පිළිබඳ රචනයක් ලියන්න. (ලකුණු 10යි.)

* * *

ඇමුණුම **01**

**චක්‍රලේඛ අංක - 2016/13**

# අ.පො.ස.(උ.පෙළ) විෂය සංයෝජන හා විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා වූ විෂය සංයෝජන

අධ්‍යාපන අමාත්‍යාංශය
“ඉසුරුපාය”, බත්තරමුල්ල

චක්‍රලේඛ අංක : 2016/13

මගේ අංකය : ඊඩී/01/12/02/06/02-(I)
පාසල් කටයුතු ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය" බත්තරමුල්ල.
2016.04.26

පළාත් ප්‍රධාන ලේකම්වරු,
පළාත් අධ්‍යාපන ලේකම්වරු,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
රජයේ හා රජයේ අනුමත පෞද්ගලික පාසල් ප්‍රධානීන් වෙත.

## අ.පො.ස. (උසස් පෙළ) විෂය සංයෝජන හා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වූ විෂය සංයෝජන

අ.පො.ස. (උසස් පෙළ) විෂය සංයෝජන හා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වූ විෂය සංයෝජන සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර ඇති 2009.05.18 දිනැති අංක 2009/16 දරන චක්‍රලේඛය හා 2010.04.21 දිනැති අංක 2009/16 (I) චක්‍රලේඛ සංශෝධනය හා ඊට අදාළ ව නිකුත් කර ඇති 2013.06.11 දිනැති චක්‍රලේඛ ලිපියේ සියලු විධිවිධාන අභිබවා 2016 වර්ෂයේ හා ඉන්පසුව 12 වන ශ්‍රේණියට ඇතුළත්වන සිසුන් සඳහා මෙම චක්‍රලේඛ විධිවිධාන බල පැවැත්වේ.

**2.0** අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සමත්වන සිසුන් විසින් අ.පො.ස. (උසස් පෙළ) පන්තියේ දී හැදෑරීමට අපේක්ෂිත විෂය ධාරා තෝරා ගැනීමේ දී විෂයයන් හෝ විෂය සංයෝජන පිළිබඳ නිසි ආකාරව අවබෝධයක් නොමැති බැවින් ගැටළු සහගත තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වේ. තව ද විශ්වවිද්‍යාලවල දැනට ක්‍රියාත්මක වන ප්‍රථම උපාධි පාඨමාලා සඳහා අවශ්‍ය වන විෂය සංයෝජන පිළිබඳව ද සිසුන්ට නිසි අවබෝධයක් නොමැති බැවින් විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමේ දී නොයෙකුත් දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුව ඇත. මෙම ගැටළු නිරාකරණය කිරීම සඳහා ත් සිසුන්ට මග පෙන්වීම සඳහා ත් අදාළ වන පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ. එම නිසා මෙම චක්‍රලේඛයේ සඳහන් අ.පො.ස. (උසස් පෙළ) විෂය සංයෝජන හා විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා වන විෂය සංයෝජන පිළිබඳ 12 ශ්‍රේණියට ඇතුළත්වන සියලුම සිසුන් දැනුවත් කිරීමට විදුහල්පතිවරුන් වග බලා ගත යුතු ය.

**3.0** අ.පො.ස. (උසස් පෙළ) පංතිවල ප්‍රධාන විෂයයන් තුනක් ඉගැන්වෙන අතර, එක් විෂයක් සඳහා සතියකට කාලච්ඡේද 10ක් වෙන් කෙරේ. ඒ අනුව, එම නිර්දේශිත ප්‍රධාන විෂයයන් 03 සඳහා කාලච්ඡේද 30ක් වැය වේ. ඉතිරි කාලච්ඡේද 10න් 06ක් සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා වෙන් කළ යුතු අතර, සාමාන්‍ය තොරතුරු තාක්ෂණය (GIT) විෂය සඳහා 12 ශ්‍රේණියේ පමණක් කාලච්ඡේද 02ක් වෙන් කළ යුතු ය. 12 ශ්‍රේණියේ ඉතිරි කාලච්ඡේද 02 ද 13 වන ශ්‍රේණියේ ඉතිරි කාලච්ඡේද 04 ද පාසල් කළමනාකරණ කණ්ඩායමේ අභිමතය පරිදි සිසුන්ගේ අධ්‍යාපන දියුණුවට අදාළ වන ආකාරයෙන් යොදා ගත යුතු වේ.

**4.0** නියම කර ඇති මූලික අවශ්‍යතා සපුරා ඇති සිසුන් 13 වන ශ්‍රේණියේ අවසානයේ දී ප්‍රධාන විෂයයන් 03 සමග සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා විභාගයට පෙනී සිටිය යුතු ය. සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා ලබාගන්නා ලකුණු හෝ සාමර්ථ්‍යය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා උපයෝගී කර ගනු නොලැබේ. එහෙත් එම විෂය සඳහා ලබා ගන්නා ප්‍රතිඵලය අ.පො.ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල සහතිකයේ සටහන් කෙරේ.

## 5.0 අ.පො.ස. (උසස් පෙළ) විෂයධාරා සඳහා විෂය සංයෝජන

පාසල්වල දැනට අ.පො.ස.(උසස් පෙළ) පන්ති සඳහා අංශ තුනක් යටතේ (කලා/වාණිජ්‍යය, විද්‍යා, තාක්ෂණවේදය) විෂය ධාරා හයක් (6) ක්‍රියාත්මක කෙරේ.

### 5.1 කලා විෂය ධාරාව

ශිෂ්‍යයන් කලා විෂය ධාරාව යටතේ අධ්‍යාපනය ලැබීම සඳහා පහත දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව විෂය සංයෝජන තෝරා ගත යුතු ය.

5.1.1 පහත දැක්වෙන සමාජයීය විද්‍යාව/ව්‍යවහාරික සමාජ අධ්‍යයන විෂය කාණ්ඩයෙන් (5.1.6 හි අ) අවම වශයෙන් එක් විෂයයක් තෝරා ගත යුතු ය. (භාෂා විෂයයන් 2ක් හෝ ජාතික භාෂා තුනම හෝ තෝරා ගන්නා සිසුන්ට මෙය අදාළ නොවේ.) ශිෂ්‍යයාගේ මනාපය අනුව, මේ කාණ්ඩයෙන් විෂයයන් දෙකක් හෝ තුනම හෝ තෝරා ගත හැකි ය.

5.1.2 පහත දැක්වෙන ආගම් හා ශිෂ්ටාචාර විෂයයන් (5.1.6හි ආ) අතුරින් යම් ආගමක් තෝරා ගන්නේ නම්, ඊට අදාළ ශිෂ්ටාචාර විෂය තෝරා ගත නොහැකි ය.

5.1.3 පහත දැක්වෙන සෞන්දර්ය අධ්‍යයන විෂයයන් (5.1.6හි ඇ) අතුරින්, විෂයක් හෝ දෙකක් හෝ තෝරා ගත හැකි ය.

5.1.4 පහත දැක්වෙන භාෂා විෂයය කාණ්ඩයේ (5.1.6හි ඈ) දැක්වෙන භාෂා විෂයයන්ගෙන් ඕනෑම භාෂා විෂයක් හෝ විෂයයන් 2ක් හෝ තෝරාගත හැකි ය. එහෙත්, විෂයයන් තුනම භාෂා විෂයයන්ගෙන් තෝරා ගන්නේ නම්, පහත සඳහන් ආකාරයට ම පමණක් විය යුතු ය.

- 5.1.6 (ඈ) (1)හි සඳහන් විෂයයන් 3ම,
- 5.1.6 (ඈ) හි (1) හා (2) යන උපකාණ්ඩ දෙකෙන් පමණක් වන පරිදි විෂයයන් තුනක්.

5.1.5 භාෂා විෂයයන් දෙකක් තෝරාගන්නා ශිෂ්‍යයකුට සිය තුන්වන විෂයය වශයෙන් සමාජයීය විද්‍යා/ව්‍යවහාරික සමාජ අධ්‍යයන, ආගම් හා ශිෂ්ටාචාර, සෞන්දර්ය අධ්‍යයන යන විෂය කාණ්ඩවලින් කැමති විෂයක් තෝරා ගත හැකි ය.

**5.1.6 කලා විෂය ධාරාව සඳහා විෂයය කාණ්ඩ**

**(අ) සමාජයීය විද්‍යා/ව්‍යවහාරික සමාජ අධ්‍යයන විෂයයන්**

1. ආර්ථික විද්‍යාව
2. භූගෝල විද්‍යාව
3. ඉතිහාසය(ලංකා ඉතිහාසය සමග ඉන්දීය ඉතිහාසය හෝ යුරෝපා ඉතිහාසය හෝ නූතන ලෝක ඉතිහාසය)
4. ගෘහ ආර්ථික විද්‍යාව
5. දේශපාලන විද්‍යාව
6. තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය
7. ගිණුම්කරණය හෝ ව්‍යාපාර සංඛ්‍යානය
8. කෘෂි විද්‍යාව හෝ ගණිතය හෝ සංයුක්ත ගණිතය

9. තාක්ෂණවේදය විෂයයන්ගෙන් එක් විෂයක් (සිවිල් තාක්ෂණවේදය හෝ යාන්ත්‍රික තාක්ෂණවේදය හෝ විදුලිය ඉලෙක්ට්‍රොනික සහ තොරතුරු තාක්ෂණවේදය හෝ ආහාර හා තාක්ෂණවේදය හෝ කෘෂි තාක්ෂණවේදය හෝ ජෛව සම්පත් තාක්ෂණවේදය)
10. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
11. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

**(ආ) ආගම් හා ශිෂ්ටාචාර විෂයයන්**

1. බුද්ධ ධර්මය හෝ බෞද්ධ ශිෂ්ටාචාරය
2. ක්‍රිස්තියානි ධර්මය හෝ ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය
3. හින්දු ධර්මය හෝ හින්දු ශිෂ්ටාචාරය
4. ඉස්ලාම් හෝ ඉස්ලාම් ශිෂ්ටාචාරය
5. ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය

**(ඇ) සෞන්දර්ය අධ්‍යයන විෂයයන්**

1. චිත්‍ර කලාව
2. නර්තනය (දේශීය හෝ භරත)
3. සංගීතය (පෙරදිග හෝ කර්ණාටක හෝ බටහිර)
4. නාට්‍ය හා රංග කලාව (සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි)

**(ඈ) භාෂා විෂයයන්**

1. සිංහල, දෙමළ, ඉංග්‍රීසි
2. අරාබි, පාලි, සංස්කෘත
3. චීන, මැලේ, ප්‍රංශ, ජර්මන්, රුසියන්, හින්දි, ජපන්

**5.2. වාණිජ්‍යය විෂය ධාරාව**

මෙම විෂය ධාරාව හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් පහත සඳහන් විෂයයන් අතුරින් අවම වශයෙන් විෂයයන් දෙකක් තෝරා ගත යුතු ය.

1. ගිණුම්කරණය
2. ව්‍යාපාර අධ්‍යයනය
3. ආර්ථික විද්‍යාව

ඉතිරි විෂය පහත දැක්වෙන විෂයයන් අතුරින් තෝරා ගත යුතුය.

1. ව්‍යාපාර සංඛ්‍යානය
2. භූගෝල විද්‍යාව
3. දේශපාලන විද්‍යාව
4. ඉතිහාසය (ලංකා ඉතිහාසය සමග ඉන්දීය ඉතිහාසය හෝ යුරෝපා ඉතිහාසය හෝ නූතන ලෝක ඉතිහාසය)
5. තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය
6. ඉංග්‍රීසි
7. ජර්මන්
8. ප්‍රංශ
9. කෘෂි විද්‍යාව
10. සංයුක්ත ගණිතය හෝ ගණිතය
11. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

5.3. ජෛවීය විද්‍යා විෂය ධාරාව

මෙම විෂය ධාරාව හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් ජීව විද්‍යාව සමඟ පහත සඳහන් විෂයයන් අතුරින් විෂයයන් 2ක් තෝරා ගත යුතු ය.

1. රසායන විද්‍යාව
2. භෞතික විද්‍යාව
3. කෘෂි විද්‍යාව
4. ගණිතය

5.4. භෞතීය විද්‍යා විෂයධාරාව

මෙම විෂය ධාරාව හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් පහත සඳහන් විෂයයන් අතුරින් විෂයයන් තුනක් තෝරා ගත යුතුය.

1. සංයුක්ත ගණිතය
2. රසායන විද්‍යාව
3. භෞතික විද්‍යාව
4. උසස් ගණිතය

5.5. ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයධාරාව

මෙම විෂය ධාරාව හදාරනු ලබන සිසුන් පහත සඳහන් විෂයයන් අනිවාර්යයෙන් තෝරා ගත යුතු ය.

1. ජෛව පද්ධති තාක්ෂණවේදය
2. තාක්ෂණවේදය සඳහා විද්‍යාව

තුන් වන විෂය පහත දැක්වෙන විෂයයන් අතුරින් තෝරා ගත යුතු ය.

1. ආර්ථික විද්‍යාව
2. භූගෝල විද්‍යාව
3. ගෘහ ආර්ථික විද්‍යාව
4. ඉංග්‍රීසි
5. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
6. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
7. චිත්‍ර කලාව
8. ව්‍යාපාර අධ්‍යයනය
9. කෘෂි විද්‍යාව
10. ශිල්පකර්මකරණය
11. ගණිතය

5.6 ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාව

මෙම විෂය ධාරාව හදාරනු ලබන සිසුන් පහත සඳහන් විෂයයන් අනිවාර්යයෙන් තෝරා ගත යුතු ය.

1. ඉංජිනේරු තාක්ෂණවේදය
2. තාක්ෂණවේදය සඳහා විද්‍යාව

තුන් වන විෂය පහත දැක්වෙන විෂයයන් අතුරින් තෝරා ගත යුතු ය.

1. ආර්ථික විද්‍යාව
2. භූගෝල විද්‍යාව
3. ගෘහ ආර්ථික විද්‍යාව
4. ඉංග්‍රීසි
5. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
6. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
7. චිත්‍ර කලාව
8. ව්‍යාපාර අධ්‍යයනය
9. කෘෂි විද්‍යාව
10. ඉංජිනේරු / ගිණුම්කරණය
11. ගණිතය

**6.0** ඉහත සඳහන් පරිදි විෂය ධාරාවන් යටතේ අදාළ විෂය සංයෝජන තෝරා ගත යුතු ය. එහෙත් අදාළ පාසලේ ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටී නම් හා කාලසටහන ලබාදීමටත්, පහසුකම් සැපයීමටත් හැකියාව ඇති විෂයයන් සඳහා පමණක් තමන්ට කැමති විෂයයන් සහිත විෂය සංයෝජනයක් තෝරා ගැනීමේ ඉඩකඩ සිසුනට ලබා දිය හැකි ය. එසේ වුව ද විෂයයන් අතුරින් "හෝ" යනුවෙන් සඳහන් කර ඇත්නම් ඉන් එක් විෂයයක් පමණක් තෝරාගත යුතු ය. මෙසේ විෂයයන් තෝරා ගන්නා සිසුන් විශ්වවිද්‍යාල ප්‍රවේශයේ දී තෝරා ගත යුතු පාඨමාලා පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දිය යුතු ය.

**7.0** සම්මත විෂය ධාරාවලට අනුගත නොවන වෙනත්, විෂය සංකලනයන් තෝරා ගත් අවස්ථාවක දී අයදුම්කරුවන් "**නිශ්චිත විෂය ධාරාවකට අයත් නොවන**" යනුවෙන් හඳුන්වා දෙන අතර, විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ දී "දිවයින තරාව" (Island Rank) හා "දිස්ත්‍රික් තරාව"(District Rank) නිකුත් කරනු නොලැබේ.

**8.0** අ.පො.ස (උසස් පෙළ) සඳහා වන සියලුම විෂයයන් සිංහල හා දෙමළ යන මාධ්‍යයන් වලින් ඉගැන්වෙන අතර පහත සඳහන් විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද ඉගැන්විය හැකි ය.

1. ජීව විද්‍යාව
2. භෞතික විද්‍යාව
3. රසායන විද්‍යාව
4. සංයුක්ත ගණිතය
5. කෘෂි විද්‍යාව
6. ගිණුම්කරණය
7. ව්‍යාපාර අධ්‍යයනය
8. ආර්ථික විද්‍යාව
9. දේශපාලන විද්‍යාව
10. භූගෝල විද්‍යාව

මීට අමතරව ඉංග්‍රීසි මාධ්‍යයෙන් වෙනත් විෂයයන් ඉගැන්වීමට අවශ්‍ය වේ නම් හා ඊට අදාළ සම්පත් ඇත්නම්, අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ඉගැන්විය හැකි ය.

## 9.0 විශ්වවිද්‍යාල උපාධි පාඨමාලා සඳහා විෂය සංයෝජන

**9.1** විශ්වවිද්‍යාල මගින් පවත්වනු ලබන ප්‍රථම උපාධි පාඨමාලාවන්ට ඇතුළත් වීම සඳහා ශිෂ්‍යයන් විසින් අ.පො.ස. (උසස් පෙළ) දී හදාරා තිබිය යුතු විෂය සංයෝජන පහත දැක්වේ. විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා මූලික සුදුසුකම් වශයෙන් අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් අදාළ ප්‍රධාන විෂයයන් තුනෙන් ම සමත් වී තිබිය යුතු අතර, සාමාන්‍ය පොදු පරීක්ෂණයේ දී අවශ්‍යවන ලකුණු ප්‍රමාණය ලබා තිබීම අත්‍යවශ්‍ය වේ. එහෙත් විශ්වවිද්‍යාලයට බඳවා ගන්නා පදනම හා ඇතුළත් කර ගත හැකි සංඛ්‍යාව අනුව මූලික සුදුසුකම් ලබාගත් අය අතුරින් තෝරා ගැනීමේ කටයුතු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදු කරනු ඇත.

**9.2** පහත සඳහන් කරනුයේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නියම කර ඇති අ.පො.ස. (උසස් පෙළ) විෂය සංයෝජන පමණි. ඊට අදාළ වැඩි විස්තර අවශ්‍යවන්නේ නම්, ඒ ඒ අධ්‍යයන වර්ෂ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ප්‍රකාශයට පත් කරන "**ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය**" නම් අත් පොත පරිශීලනය කළ යුතු ය.

(1) කලා (ARTS)

කලා විෂය ධාරාව යටතේ දී ඇති කොන්දේසිවලට අනුව තෝරා ගත් විෂයයන් 03ක්

(2) කලා (ශ්‍රීපාලි මණ්ඩපය) - (ARTS - SRIPALI CAMPUS)

පහත සඳහන් කොන්දේසිවලට අනුව කලා විෂය ධාරාව යටතේ ලබා දී ඇති විෂයයන් 03ක්

- භාෂා විෂයයන් දෙකකට වඩා පෙනී නොසිටිය යුතු ය.
- ආගම් හා ශිෂ්ටාචාර විෂය කාණ්ඩයෙන් එක් විෂයයකට වඩා පෙනී නොසිටිය යුතු ය.
- තාක්ෂණවේදය විෂයයන් එකකට වඩා පෙනී නොසිටිය යුතු ය.
- පහත සඳහන් විෂයයන්ගෙන් එකකට වඩා පෙනී නොසිටිය යුතු ය.

(i) ගිණුම්කරණය
(ii) ව්‍යාපාර සංඛ්‍යානය
(iii) ආර්ථික විද්‍යාව

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක් තිබිය යුතු අතර, යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(3) කලා (සබරගමුව) - (ARTS - SABARAGAMUWA)

කලා, වාණිජ්‍යය යන කුමන හෝ විෂයධාරාවක් යටතේ තෝරා ගත් විෂයයන් 03ක්

(4) සන්නිවේදන අධ්‍යයනය (COMMUNICATION STUDIES)

සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් සහිත ව ඕනෑම විෂයයන් 03ක්

අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් තිබිය යුතු ය.

(5) සාමය හා ගැටුම් නිරාකරණය (PEACE & CONFLICT RESOLUTION)

ඕනෑම විෂයයන් තුනක්

(6) ඉස්ලාම් අධ්‍යයනය (ISLAMIC STUDIES)

අවම වශයෙන් ඉස්ලාම් හෝ ඉස්ලාම් ශිෂ්ටාචාරය විෂයය සමග වෙනත් ඕනෑම විෂයයන් දෙකක්

(7) අරාබි භාෂාව (ARABIC LANGUAGE)

අරාබි භාෂාව සමග වෙනත් ඕනෑම විෂයයන් දෙකක්

(8) සංගීතය/නර්තනය /චිත්‍ර හා නිර්මාණ/නාට්‍ය හා රංග කලාව/දෘශ්‍ය හා තාක්ෂණික කලා/දෘශ්‍ය කලා
(MUSIC/DANCING/ART & DESIGN/DRAMA & THEATRE/VISUAL & TECHNOLOGICAL ARTS/VISUAL ARTS)

හැදෑරීමට අපේක්ෂිත පාඨමාලාවට අදාළ විෂය (සංගීතය/නර්තනය/චිත්‍ර/නාට්‍ය හා රංග කලාව) සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් සහ අනිකුත් ඕනෑම විෂයයන් දෙකක්

මෙයට අමතරව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(9) **කළමනාකරණය/කළමනාකරණය (රාජ්‍ය) විශේෂ/දේපල කළමනාකරණය සහ තක්සේරුකරණය/වාණිජ්‍යය**
(MANAGEMENT/MANAGEMENT (PUBLIC)SPECIAL/ESTATE MANAGEMENT & VALUATION/COMMERCE)

ඉහත පාඨමාලා සඳහා පහත සඳහන් විෂය සංයෝජන අතුරින් එක් විෂය සංයෝජනයක්

(i) ව්‍යාපාර අධ්‍යයනය, ආර්ථික විද්‍යාව හා ගිණුම්කරණය

හෝ

(ii) අවම වශයෙන් ඉහත (i) හි සඳහන් විෂයයන් දෙකක් සහ පහත සඳහන් විෂයයන් අතුරින් තෝරාගත් එක් විෂයයක්

| | | |
|---|---|---|
| කෘෂි විද්‍යාව | භූගෝල විද්‍යාව | ඉංග්‍රීසි |
| සංයුක්ත ගණිතය හෝ ගණිතය | භෞතික විද්‍යාව | ඉතිහාසය |
| තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය | ව්‍යාපාර සංඛ්‍යානය | ජර්මන් |
| තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | දේශපාලන විද්‍යාව | ප්‍රංශ |

(10) **කළමනාකරණ අධ්‍යයන (ත්‍රිකුණාමලය සහ වව්නියාව)** -
(MANAGEMENT STUDIES TRINCOMALEE & VAVUNIA)

ඕනෑම විෂය ධාරාවක් යටතේ, ඕනෑම විෂයයන් තුනක්

(11) **ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ)** (BUSINESS INFORMATION SYSTEMS) (SPECIAL)

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | ව්‍යාපාර අධ්‍යයනය | ආර්ථික විද්‍යාව |

ඉහත සඳහන් විෂයයන් අතුරින් අවම වශයෙන් විෂයයන් දෙකක් සමග පහත සඳහන් විෂයයන්ගෙන් එකක්

| | |
|---|---|
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය |
| සංයුක්ත ගණිතය හෝ ගණිතය | ව්‍යාපාර සංඛ්‍යානය |
| භෞතික විද්‍යාව | |

(12) වෛද්‍ය විද්‍යාව/දන්ත ශල්‍ය විද්‍යාව/පශු වෛද්‍ය විද්‍යාව
(MEDICINE/DENTAL SURGERY/VETERINARY SCIENCE)

පහත සඳහන් විෂයයන් තුනම

ජීව විද්‍යාව　　රසායන විද්‍යාව　　භෞතික විද්‍යාව

(13) **කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය**
**(AGRICULTURAL TECHNOLOGY & MANAGEMENT)**
පහත සඳහන් විෂය සංයෝජන අතුරින් එක් විෂය සංයෝජනයක්

(i) රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව
(ii) රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හෝ ගණිතය, ජීව විද්‍යාව හෝ කෘෂි විද්‍යාව
(iii) රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව හෝ ගණිතය

(14) **කෘෂිකර්මය** (AGRICULTURE)
ඉහත සඳහන් කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය පාඨමාලාවට අදාළ විෂය සංයෝජන (අංක 13 බලන්න)

(15) **ආහාර විද්‍යාව හා පෝෂණය** (FOOD SCIENCE & NUTRITION)

ඉහත සඳහන් කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය පාඨමාලාවට අදාළ විෂය සංයෝජන (අංක 13 බලන්න)

(16) **ආහාර විද්‍යාව හා තාක්ෂණය** (FOOD SCIENCE & TECHNOLOGY)

රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනම

(17) **ආයුර්වේද/යුනානි/සිද්ධ වෛද්‍ය** (AYURVEDA/UNANI/SIDDHA)

ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව යන විෂයයන් තුනම

(18) **ජෛවීය විද්‍යාව** (BIOLOGICAL SCIENCE)

ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ පහත දැක්වෙන විෂයයන් අතුරින් එක් විෂයක්

කෘෂි විද්‍යාව　　ගණිතය හෝ සංයුක්ත ගණිතය
උසස් ගණිතය　　භෞතික විද්‍යාව

(19) **ව්‍යවහාරික විද්‍යා (ජෛවීය විද්‍යා)** (APPLIED SCIENCE - BIOLOGICAL SCIENCE)

ඉහත සඳහන් ජෛවීය විද්‍යා පාඨමාලාව සඳහා දක්වා ඇති විෂය සංයෝජන (අංක 18 බලන්න

(20) **සෞඛ්‍ය ප්‍රවර්ධන** (HEALTH PROMOTION)

ඉහත සඳහන් ජෛවීය විද්‍යාව පාඨමාලාව සඳහා දක්වා ඇති විෂය සංයෝජන (අංක 18 බලන්න

(21) හෙද (NURSING)

ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව යන විෂයයන් තුනම
අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක්

(22) ඖෂධ විද්‍යාව (PHARMACY)

රසායන විද්‍යාව සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් සහිතව භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනම
අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක්

(23) වෛද්‍ය රසායනාගාර විද්‍යා (MEDICAL LABORATORY SCIENCES)

භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනම

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක්

(24) විකිරණ ශිල්පය (RADIOGRAPHY)

භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනම

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක්

(25) භෞත චිකිත්ස (PHYSIOTHERAPY)

භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව සමග පහත සඳහන් විෂයයන්ගෙන් එක් විෂයයක්

ජීව විද්‍යාව　　සංයුක්ත ගණිතය　　උසස් ගණිතය　　ගණිතය

අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක්

(26) අණුක ජීව විද්‍යාව සහ ජීව රසායන විද්‍යාව
(MOLECULAR BIOLOGY & BIOCHEMISTRY)

භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනම

(27) ධීවර සහ සාගර විද්‍යාව (FISHERIES & MARINE SCIENCES)

අණුක ජීව විද්‍යාව සහ ජීව රසායන විද්‍යාව පාඨමාලාව සඳහා වූ විෂය සංයෝජනය (අංක 26 බලන්න.)

(28) පරිසර සංරක්ෂණය හා කළමණාකරණය (ENVIRONMENTAL CONSERVATION & MANAGEMENT)

ජීව විද්‍යාව හා රසායන විද්‍යාව සමග පහත සඳහන් විෂයයන්ගෙන් එක් විෂයක්
භෞතික විද්‍යාව　සංයුක්ත ගණිතය
කෘෂි විද්‍යාව　　ගණිතය

(29) සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව (ANIMAL SCIENCE & FISHERIES)

පහත සඳහන් විෂය සංයෝජන අතුරින් එක් විෂය සංයෝජනයක්

i. රසායන විද්‍යාව, ජීව විද්‍යාව සහ භෞතික විද්‍යාව
ii. රසායන විද්‍යාව, ජීව විද්‍යාව සහ කෘෂි විද්‍යාව

**(30) ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණය** (FOOD PRODUCTION & TECHNOLOGY MANAGEMENT)

කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය පාඨමාලාවට අදාළ විෂය සංයෝජන (අංක 13 බලන්න.)

**(31) ඉංජිනේරු විද්‍යාව** (ENGINEERING)

පහත දැක්වෙන විෂයයන් තුනම

රසායන විද්‍යාව　　සංයුක්ත ගණිතය　　භෞතික විද්‍යාව

**(32) ඉංජිනේරු විද්‍යාව (EM) - භූ සම්පත් ඉංජිනේරු විද්‍යාව**
(ENGINEERING) (EM)- (EARTH RESOURCES ENGINEERING)

ඉංජිනේරු විද්‍යාව පාඨමාලාවට අදාළ වූ විෂය සංයෝජනය (අංක 31 බලන්න)

**(33) ඉංජිනේරු විද්‍යාව (TM) - පේෂකර්ම හා රෙදිපිළි තාක්ෂණය**
(ENGINEERING) (TM) - (TEXTILE & CLOTHING TECHNOLOGY)

ඉංජිනේරු විද්‍යාව පාඨමාලාවට අදාළ වූ විෂය සංයෝජනය (අංක 31 බලන්න)

**(34) භෞතීය විද්‍යාව** (PHYSICAL SCIENCE)

සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය සහ රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව ඇතුළුව පහත සඳහන් විෂයයන්ගෙන් විෂයයන් තුනක්

කෘෂි විද්‍යාව　　සංයුක්ත ගණිතය　　ජීව විද්‍යාව
උසස් ගණිතය　　රසායන විද්‍යාව　　භෞතික විද්‍යාව

**(35) පරිගණක විද්‍යාව** (COMPUTER SCIENCE)

සංයුක්ත ගණිතය හෝ භෞතික විද්‍යාව හෝ උසස් ගණිතය යන විෂයයන්ගෙන් එකකට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් සහිතව පහත සඳහන් විෂයයන් අතුරින් තුනක්

සංයුක්ත ගණිතය හෝ ගණිතය　　උසස් ගණිතය　　රසායන විද්‍යාව
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය　　භෞතික විද්‍යාව

(36) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය
(INFORMATION & COMMUNICATION TECHNOLOGY)

පහත සඳහන් විෂයයන්ගෙන් එකකට සම්මාන (C) සාමර්ථ්‍යයක් සමග ඕනෑම විෂයයන් තුනක්

| | |
|---|---|
| උසස් ගණිතය | ජීව විද්‍යාව |
| ගණිතය හෝ සංයුක්ත ගණිතය | භෞතික විද්‍යාව |
| ගිණුම්කරණය | රසායන විද්‍යාව |
| ව්‍යාපාර සංඛ්‍යානය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |
| ව්‍යාපාර අධ්‍යයනය | සිවිල් තාක්ෂණවේදය |
| භූගෝල විද්‍යාව | යාන්ත්‍රික තාක්ෂණවේදය |
| ආර්ථික විද්‍යාව | විදුලිය ඉලෙක්ට්‍රෝනික සහ තොරතුරු තාක්ෂණවේදය |
| තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය | සංගීතය (පෙරදිග හෝ කර්ණාටක හෝ බටහිර) |
| | සංස්කෘත |

අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය හා ඉංග්‍රීසි විෂයයන් සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක්

මෙයට අමතර ව, විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(37) ව්‍යවහාරික විද්‍යා (භෞතීය විද්‍යා)
(APPLIED SCIENCES/PHYSICAL SCIENCE)

සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය සහ රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව ඇතුළුව පහත සඳහන් විෂයයන්ගෙන් එක් විෂයක්

| | | |
|---|---|---|
| කෘෂි විද්‍යාව | සංයුක්ත ගණිතය | උසස් ගණිතය |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | ජීව විද්‍යාව | භෞතික විද්‍යාව |
| රසායන විද්‍යාව | | |

(38) ප්‍රවාහන හා සැපයුම් කළමනාකරණය
(TRANSPORT & LOGISTIC MANAGEMENT)

භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා සංයුක්ත ගණිතය යන විෂයයන් තුනම

(39) කර්මාන්ත සංඛ්‍යානය හා ගණිතමය මූල්‍ය
(INDUSTRIAL STATISTICS & MATHEMATICAL FINANCE)

සංයුක්ත ගණිතය සමග පහත සඳහන් විෂයයන් අතුරින් විෂයයන් දෙකක්

උසස් ගණිතය භෞතික විද්‍යාව රසායන විද්‍යාව

(40) සංඛ්‍යානය සහ සංකාර්ය පර්යේෂණ
(STATISTICS & OPERATIONS RESEARCH)

සංයුක්ත ගණිතය සමග පහත දැක්වෙන විෂයයන්ගෙන් ඕනෑම විෂයයන් දෙකක්

| | | |
|---|---|---|
| ජීව විද්‍යාව | භෞතික විද්‍යාව | උසස් ගණිතය |
| රසායන විද්‍යාව | කෘෂි විද්‍යාව | ගණිතය |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | | |

(41) ආගනණය සහ තොරතුරු පද්ධති (COMPUTING & INFORMATION SYSTEMS)

සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, උසස් ගණිතය යන විෂයයන්ගෙන් එකක් සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් සහ පහත සඳහන් විෂයයන් අතුරින් විෂයයන් දෙකක්

| | |
|---|---|
| සංයුක්ත ගණිතය | උසස් ගණිතය |
| භෞතික විද්‍යාව | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |
| රසායන විද්‍යාව | |

අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක්

(42) තොරතුරු තාක්ෂණය (INFORMATION TECHNOLOGY- IT)

පහත සඳහන් විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයක් සඳහා සම්මාන (C) සාමර්ථ්‍යයක් සහිතව අනිකුත් ඕනෑම විෂයයන් දෙකක්

| | | | |
|---|---|---|---|
| උසස් ගණිතය | ගණිතය | සංයුක්ත ගණිතය | භෞතික විද්‍යාව |

(43) කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය (MANAGEMENT & INFORMATION TECHNOLOGY - MIT)

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී උසස් ගණිතය, සංයුක්ත ගණිතය, ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන (C) සාමර්ථ්‍යයක් සහිතව

(i) ජෛවීය විද්‍යා විෂය ධාරාවෙන් හෝ භෞතීය විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් තුනකින් සමත් වීම

හෝ

(ii) ජෛවීය විද්‍යා විෂය ධාරාවෙන් හෝ භෞතීය විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් දෙකක් සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂය සමත් වීම

මෙයට අමතරව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(44) ප්‍රමාණ සමීක්ෂණය (QUANTITY SURVEYING)

සංයුක්ත ගණිතය, උසස් ගණිතය යන විෂයයන් අතුරෙන් අවම වශයෙන් එක් විෂයයක්

සහ

පහත දැක්වෙන විෂයයන් අතුරෙන් එක් විෂයයක් හෝ විෂයයන් දෙකක්

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | ආර්ථික විද්‍යාව | භෞතික විද්‍යාව |
| ව්‍යාපාර සංඛ්‍යානය | ව්‍යාපාර අධ්‍යයනය | රසායන විද්‍යාව |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | | |

මෙයට අමතරව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී, ගණිතය හා ඉංග්‍රීසි විෂයයන්ට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක්ද විද්‍යාව විෂයයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක් ද ලබා තිබිය යුතු ය.

(45) මැනුම් විද්‍යාව (SURVEYING SCIENCE)

භෞතික විද්‍යාව, සංයුත්ක ගණිතය සමග වෙනත් ඕනෑම විෂයක්

(46) නගර හා ග්‍රාම නිර්මාණය (TOWN & COUNTRY PLANNING)

(i) පහත සඳහන් විෂයයන් අතුරින් අවම වශයෙන් විෂයයන් දෙකක්

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | රසායන විද්‍යාව | උසස් ගණිතය |
| කෘෂි විද්‍යාව | සංයුක්ත ගණිතය | තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය |
| ජීව විද්‍යාව | ආර්ථික විද්‍යාව | දේශපාලන විද්‍යාව |
| ව්‍යාපාර අධ්‍යයනය | ගණිතය | භෞතික විද්‍යාව |
| ව්‍යාපාර සංඛ්‍යානය | භූගෝල විද්‍යාව | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |

(ii) තෙවන විෂය පහත සඳහන් විෂයයන්ගෙන් එක් විෂයයක්

| | | |
|---|---|---|
| අරාබි | ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | මැලේ |
| බුද්ධ ධර්මය | ගෘහ ආර්ථික විද්‍යාව | පාලි |
| බෞද්ධ ශිෂ්ටාචාරය | හින්දි | රුසියන් |
| ක්‍රිස්තු ධර්මය | හින්දු ධර්මය | සංස්කෘත |
| චීන | හින්දු ශිෂ්ටාචාරය | සිංහල |
| ඉංග්‍රීසි | ඉතිහාසය | දෙමළ |
| ප්‍රංශ | ඉස්ලාම් | ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය |
| ජර්මන් | ඉස්ලාම් ශිෂ්ටාචාරය | ජපන් |
| චිත්‍ර කලාව | | |

මෙයට අමතරව, අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි හා ගණිතය යන විෂයයන්ට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක්

මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් ලැබීම පිණිස 2017/2018 අධ්‍යයන වර්ෂයේ සිට අයදුම්කරුවන් විසින් ඉහත (i) කාණ්ඩය යටතේ ඇති විෂයයන්ගෙන් විෂයයන් තුනක් සමත් විය යුතුය.

එසේම 2017/2018 අධ්‍යයන වර්ෂයේ සිට අයදුම්කරුවන් විසින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් (B) සාමර්ථ්‍යයක් හා ගණිතය විෂයට සම්මාන (C) සාමර්ථ්‍යයක් ලබා තිබිය යුතු ය.

(47) වාස්තු විද්‍යාව (ARCHITECTURE)

(i) පහත දැක්වෙන විෂයයන් අතුරින් අවම වශයෙන් එක් විෂයයක්

| | | |
|---|---|---|
| චිත්‍ර කලාව | භූගෝල විද්‍යාව | ජීව විද්‍යාව |
| උසස් ගණිතය | රසායන විද්‍යාව | භෞතික විද්‍යාව |
| සංයුක්ත ගණිතය | | |

සහ

(ii) පහත දැක්වෙන විෂයයන් අතුරින් තවත් එක් විෂයයක් හෝ විෂයයන් දෙකක්

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | හින්දි | අරාබි |
| හින්දු ශිෂ්ටාචාරය | බෞද්ධ ශිෂ්ටාචාරය | ඉතිහාසය |
| ව්‍යාපාර සංඛ්‍යානය | ගෘහ ආර්ථික විද්‍යාව | ව්‍යාපාර අධ්‍යයනය |
| ඉස්ලාම් ශිෂ්ටාචාරය | චීන | ජපන් |

| | | |
|---|---|---|
| ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය | ආර්ථික විද්‍යාව |
| දේශපාලන විද්‍යාව | ගණිතය | පාලි |
| ඉංග්‍රීසි | සංස්කෘත | ප්‍රංශ |
| සිංහල | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | ජර්මන් |
| ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | කෘෂි විද්‍යාව | දෙමළ |
| සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | | |

මෙයට අමතරව පහත සඳහන් අවශ්‍යතාවයන් ද සපුරාලිය යුතු ය.

(අ) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක්

(ආ) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් හෝ අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ දී ගණිතය විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක්

මෙයට අමතරව, විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

### (48) නිර්මාණවේදය (DESIGN)

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනක්.
මෙයට අමතරව පහත සඳහන් අවශ්‍යතාවයන් ද සපුරාලිය යුතු ය.

(අ) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක්
(ආ) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ගණිතය විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක් ලබා තිබිය යුතු ය.

තව ද , 2017/2018 අධ්‍යයන වර්ෂයේ සිට මෙම පාඨමාලාවට සුදුසුකම් ලැබීම පිණිස අයදුම්කරුවන් විසින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ඉංග්‍රීසි විෂයයට සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක් හා ගණිතය හා විද්‍යාව විෂයයන් සඳහා සම්මාන (C) සාමර්ථ්‍යක් ලබා තිබිය යුතු ය.

මෙයට අමතරව, විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතුයි.

### (49) විලාසිතා නිර්මාණ සහ නිපැයුම් ප්‍රවර්ධනය (FASHION DESIGN & PRODUCT DEVELOPMENT)

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනක්.

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය, ඉංග්‍රීසි, විද්‍යාව යන විෂයයන්ට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් ලබා තිබිය යුතුය.

මෙයට අමතර ව, විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(50) නීතිය (LAW)

(i) පහත දැක්වෙන විෂයයන්ගෙන් තෝරා ගත් විෂයයන් තුනක්

| | | |
|---|---|---|
| භූගෝල විද්‍යාව | දේශපාලන විද්‍යාව | කෘෂි විද්‍යාව |
| ව්‍යාපාර සංඛ්‍යානය | ජීව විද්‍යාව | උසස් ගණිතය |
| සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | ඉතිහාසය | ව්‍යාපාර අධ්‍යයනය |
| තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය | රසායන විද්‍යාව | ආර්ථික විද්‍යාව |
| ගණිතය හෝ සංයුක්ත ගණිතය | භෞතික විද්‍යාව | ගිණුම්කරණය |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | | |

හෝ

ඉහත සඳහන් විෂයයන්ගෙන් එකක් හෝ දෙකක් හෝ සමග පහත දැක්වෙන විෂයයන්ගෙන් ඉතිරි විෂයය හෝ විෂයයන්

| | |
|---|---|
| බුද්ධ ධර්මය හෝ බෞද්ධ ශිෂ්ටාචාරය | හින්දු ධර්මය හෝ හින්දු ශිෂ්ටාචාරය |
| ක්‍රිස්තියානි ධර්මය හෝ ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | ඉස්ලාම් හෝ ඉස්ලාම් ශිෂ්ටාචාරය |
| ජපන් | චීන |
| පාලි | ඉංග්‍රීසි |
| සංස්කෘත | ප්‍රංශ |
| සිංහල | ජර්මන් |
| දෙමළ | අරාබි |
| ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | |

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂය සඳහා සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක්

(51) පහසුකම් කළමනාකරණය (FACILITIES MANAGEMENT)

සංයුක්ත ගණිතය හෝ ගිණුම්කරණය සමග පහත සඳහන් විෂයයන්ගෙන් ඕනෑම විෂයයන් දෙකක්

| | | |
|---|---|---|
| ව්‍යාපාර සංඛ්‍යානය | භෞතික විද්‍යාව | ව්‍යාපාර අධ්‍යයනය |
| උසස් ගණිතය | රසායන විද්‍යාව | ආර්ථික විද්‍යාව |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | | |

මෙයට අමතරව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී, ඉංග්‍රීසි හා ගණිතය විෂයයන්ට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් හා විද්‍යාව විෂයයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක්

(52) පරිගණනය සහ කළමනාකරණය (COMPUTATION & MANAGEMENT)

ආර්ථික විද්‍යාව හෝ සංයුක්ත ගණිතය ඇතුළුව ඕනෑම විෂයයන් තුනක්

මෙයට අමතරව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක්

(53) කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය (අග්නිදිග විශ්වවිද්‍යාලය) - MANAGEMENT & INFORMATION TECHNOLOGY (SOUTH EASTERN UNIVERSITY)

ඕනෑම විෂයයන් තුනක්

(54) විද්‍යාව හා තාක්ෂණය (SCIENCE & TECHNOLOGY)

ජෛවීය විද්‍යා සහ භෞතීය විද්‍යා පාඨමාලා සඳහා අවශ්‍ය සුදුසුකම් අදාළ වේ. (අංක 18 සහ 34 බලන්න)

(55) පරිගණක විද්‍යාව හා තාක්ෂණය (COMPUTER SCIENCE & TECHNOLOGY)

මෙම පාඨමාලාව සඳහා ද ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා සහ ව්‍යවහාරික විද්‍යා (භෞතීය විද්‍යා) පාඨමාලා සඳහා අවශ්‍ය විෂයයන් තුනක් (අංක 18, 34 සහ 37 බලන්න)

මෙයට අමතර ව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(56) ව්‍යවසායකත්වය සහ කළමනාකරණය (ENTREPRENEURSHIP & MANAGEMENT)

ඕනෑම විෂයයන් තුනක්

මෙයට අමතරව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(57) සත්ත්ව පාලන විද්‍යාව (ANIMAL SCIENCE)

ජෛවීය විද්‍යා පාඨමාලාව සඳහා අවශ්‍ය සුදුසුකම් අදාළ වේ. (අංක 18 බලන්න.)

(58) අපනයන කෘෂිකර්මය (EXPORT AGRICULTURE)

ජෛවීය විද්‍යා පාඨමාලාව සඳහා අවශ්‍ය සුදුසුකම් අදාළ වේ. (අංක 18 බලන්න)

(59) තේ තාක්ෂණය සහ අගය එකතු කිරීම (TEA TECHNOLOGY & VALUE ADDITION)

පහත සඳහන් විෂය සංයෝජනයකින් එක් විෂය සංයෝජනයක්

(i) ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හෝ කෘෂි විද්‍යාව
(ii) සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව

(60) කාර්මික තොරතුරු තාක්ෂණය (INDUSTRIAL INFORMATION TECHNOLOGY)

ඕනෑම විෂයයන් තුනක්

මෙයට අමතර ව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(61) ඛණිජ සම්පත් සහ තාක්ෂණය (MINERAL RESOURCES & TECHNOLOGY)

පහත සඳහන් එක් විෂය සංයෝජනයක්

(i) ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව
(ii) සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව

(62) ජලජ සම්පත් තාක්ෂණය (AQUATIC RESOURCES TECHNOLOGY)

ජෛවීය විද්‍යා පාඨමාලාවට අදාළ වන විෂයය සංයෝජනය අදාළ වේ. (අංක 18 බලන්න)

(63) තාල සහ ක්ෂීර තාක්ෂණය හා අගය වැඩි කිරීම (PALM & LATEX TECHNOLOGY & VALUE ADDITION)

පහත සඳහන් එක් විෂය සංයෝජනයකින් විෂයයන් තුනක්

(i) ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හෝ කෘෂි විද්‍යාව
(ii) සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව

(64) ආගන්තුක සත්කාර සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය (HOSPITALITY TOURISUM & EVENTS MANAGEMENT)

ඕනෑම විෂයයන් තුනක්

මෙයට අමතර ව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(65) ශාරීරික අධ්‍යාපනය (PHYSICAL EDUCATION)

ඕනෑම විෂයයන් තුනක්

මෙයට අමතර ව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(66) ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය (SPORTS SCIENCE & MANAGEMENT)

ඕනෑම විෂයයන් තුනක්

මෙයට අමතර ව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(67) කථන හා ශ්‍රවණ චිකිත්සාව (SPEECH & HEARING THERAPHY)

ජෛවීය විද්‍යාව හෝ භෞතීය විද්‍යාව හෝ කලා විෂය ධාරාවන් යටතේ ඕනෑම විෂයයන් තුනක්

(68) කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය (AGRICULTURAL RESOURCE MANAGEMENT & TECHNOLOGY)

කෘෂි තාක්ෂණය හා කළමනාකරණය පාඨමාලාවට අදාළ විෂය සංයෝජන (අංක 13 බලන්න)

(69) කෘෂි ව්‍යාපාර කළමනාකරණය (AGRI BUSINESS MANAGEMENT)

ජීව විද්‍යාව, රසායන විද්‍යාව සමග පහත සඳහන් විෂයයන්ගෙන් එක් විෂයයක්

භෞතික විද්‍යාව          කෘෂි විද්‍යාව
ආහාර හා තාක්ෂණවේදය හෝ ජෛව සම්පත් තාක්ෂණවේදය හෝ කෘෂි තාක්ෂණවේදය

(70) හරිත තාක්ෂණය (GREEN TECHNOLOGY)

ජීව විද්‍යාව, රසායන විද්‍යාව සමග පහත සඳහන් විෂයයන්ගෙන් එක් විෂයයක්

භෞතික විද්‍යාව කෘෂි විද්‍යාව
ආහාර හා තාක්ෂණවේදය හෝ ජෛව සම්පත් තාක්ෂණවේදය හෝ කෘෂි තාක්ෂණවේදය

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයයට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් ලබා තිබිය යුතු ය.

(71) භූමි නිර්මාණවේදය (LANDSCAPE ARCHITECTURE)

(i) පහත සඳහන් විෂයයන් අතුරින් අවම වශයෙන් එක් විෂයක්.

| | | |
|---|---|---|
| චිත්‍ර කලාව | භූගෝල විද්‍යාව | ජීව විද්‍යාව |
| උසස් ගණිතය | රසායන විද්‍යාව | භෞතික විද්‍යාව |
| සංයුක්ත ගණිතය | කෘෂි විද්‍යාව | |

(ii) පහත සඳහන් විෂයයන් අතුරින් තවත් එක් විෂයයක් හෝ විෂයයන් දෙකක්

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | හින්දි | අරාබි |
| බෞද්ධ ශිෂ්ටාචාරය | ඉතිහාසය | ඉංග්‍රීසි |
| ව්‍යාපාර සංඛ්‍යානය | ගෘහ ආර්ථික විද්‍යාව | ජපන් |
| ඉස්ලාම් ශිෂ්ටාචාරය | ආර්ථික විද්‍යාව | චීන |
| ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය | පාලි |
| දේශපාලන විද්‍යාව | ගණිතය | ප්‍රංශ |
| හින්දු ශිෂ්ටාචාරය | සංස්කෘත | දෙමළ |
| සිංහල | ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | ජර්මන් |
| සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | ව්‍යාපාර අධ්‍යයනය | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | | |

(අ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක්
(ආ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ගණිතය විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක්

මෙයට අමතර ව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(72) තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය (INFORMATION TECHNOLOGY & MANAGEMENT)

පහත සඳහන් විෂයයන්ගෙන් අවම වශයෙන් එකකට සම්මාන (C) සාමර්ථ්‍යයක් සහිත ව ඕනෑම විෂයයන් තුනක්

| | | |
|---|---|---|
| උසස් ගණිතය | ගණිතය | ආර්ථික විද්‍යාව |
| සංයුක්ත ගණිතය | ගිණුම්කරණය | භූගෝල විද්‍යාව |
| භෞතික විද්‍යාව | ව්‍යාපාර සංඛ්‍යානය | තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය |

අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයයට හා ගණිතය විෂයයට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් ලබා තිබිය යුතු ය.

(73) සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය (TOURISM & HOSPITALITY MANAGEMENT)

පහත සඳහන් විෂය සංයෝජන අතුරින් එක් විෂයය සංයෝජනයක්

(i) වාණිජ්‍යය, ජෛවීය විද්‍යාව සහ භෞතීය විද්‍යා විෂයය ධාරා යටතේ අනුමත විෂයයන් තුනක්

(ii) පහත දැක්වෙන විෂයයන් අතුරින් අවම වශයෙන් එක් විෂයක්
ආර්ථික විද්‍යාව, භූගෝල විද්‍යාව, ව්‍යාපාර සංඛ්‍යානය

සහ

කලා විෂය ධාරාව යටතේ ඇති අනිකුත් විෂයයන් දෙකක්

(74) තොරතුරු පද්ධති (INFORMATION SYSTEMS)

පහත සඳහන් විෂයයන්ගෙන් අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන (C) සාමාර්ථයක් සහිතව ඕනෑම විෂයයන් තුනක්

උසස් ගණිතය
භෞතික විද්‍යාව
ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ජීව විද්‍යාව
තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය
සිවිල් තාක්ෂණවේදය
විදුලිය ඉලෙක්ට්‍රොනික සහ තොරතුරු තාක්ෂණවේදය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
ගණිතය හෝ සංයුක්ත ගණිතය
රසායන විද්‍යාව
ව්‍යාපාර සංඛ්‍යානය
ව්‍යාපාර අධ්‍යයනය
දේශපාලන විද්‍යාව
භූගෝල විද්‍යාව
යාන්ත්‍රික තාක්ෂණවේදය

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයට හා ගණිතය විෂයයට සම්මාන (C) සාමර්ථයක් මෙයට අමතර ව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(75) මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව (SOFTWARE ENGINEERING)

සංයුක්ත ගණිතය , භෞතික විද්‍යාව යන විෂයයන් සමග පහත දක්වා ඇති විෂයයන්ගෙන් එකක්

රසායන විද්‍යාව    උසස් ගණිතය    තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

(76) පරිවර්තන අධ්‍යයන (TRANSLATION STUDIES)

ඕනෑම විෂයයන් තුනක්
මෙයට අමතර ව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(77) සිනමා හා රූපවාහිනී අධ්‍යයන (CINEMA & TELEVISION STUDIES)

ඕනෑම විෂයයන් තුනක්

මෙයට අමතර ව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(78) ව්‍යාපෘති කළමනාකරණය (PROJECT MANAGEMENT)

ඕනෑම විෂයයන් තුනක්

(79) ඉංජිනේරු තාක්ෂණවේදය (ENGINEERING TECHNOLOGY)

ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව, යන විෂයයන් දෙක සමග පහත සඳහන් විෂයයන්ගෙන් එක් විෂයක්

ආර්ථික විද්‍යාව
ගෘහ ආර්ථික විද්‍යාව
සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
චිත්‍ර කලාව
කෘෂි විද්‍යාව
ගණිතය
භූගෝල විද්‍යාව
ඉංග්‍රීසි
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
ව්‍යාපාර අධ්‍යයනය
ගිණුම්කරණය

(80) ජෛව පද්ධති තාක්ෂණවේදය (BIOSYSTEMS TECHNOLOGY)

ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව, යන විෂයයන් සමග පහත සඳහන් විෂයයන්ගෙන් එක් විෂයක්

ආර්ථික විද්‍යාව
ගෘහ ආර්ථික විද්‍යාව
සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
චිත්‍ර කලාව
කෘෂි විද්‍යාව
ගණිතය
භූගෝල විද්‍යාව
ඉංග්‍රීසි
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
ව්‍යාපාර අධ්‍යයනය
ගිණුම්කරණය

(81) තොරතුරු සන්නිවේදන තාක්ෂණය (INFORMATION COMMUNICATION TECHNOLOGY)

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සමග තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ ඉංජිනේරු තාක්ෂණවේදය හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය යන විෂයයන්

(82) ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම අධ්‍යයන පාඨමාලාව (TEACHING ENGLISH AS A SECOND LANGUAGE) (TESL)

ඉංග්‍රීසි විෂයය ඇතුළුව වෙනත් ඕනෑම විෂයයන් දෙකක්

(83) ආහාර ව්‍යාපාර කළමනාකරණය (FOOD BUSINESS MANAGEMENT)

පහත සඳහන් විෂයයන් අතුරින් විෂයයන් තුනක්

| | |
|---|---|
| රසායන විද්‍යාව | ජීව විද්‍යාව |
| භෞතික විද්‍යාව | සංයුක්ත ගණිතය |
| කෘෂි විද්‍යාව | ව්‍යාපාර අධ්‍යයනය |
| ආර්ථික විද්‍යාව | ගණකාධිකරණය |

මෙයට අමතරව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී විද්‍යාව, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන්ට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් ලබා තිබිය යුතු ය.

(84) **සාගර සහ මිරිදිය විද්‍යාව** (MARINE AND FRESHWATER SCIENCE)

පහත විෂය සංයෝජන අතුරින් එක් විෂය සංයෝජනයක්

(i) රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව
(ii) රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය

(85) **භෞතීය විද්‍යා - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය** (PHYSICAL SCIENCE - ICT)
සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය යන විෂයයන්

**10.0** මෙම චක්‍රලේඛයේ නියමයන්ට අනුව, කටයුතු සිදු කළ යුතු අතර සිසුන් දැනුවත් කිරීමට ද පියවරගනු ඇතැයි අපේක්ෂා කරමි. විශ්වවිද්‍යාල පාඨමාලා සඳහා වන විෂයය සංයෝජනයන්ට අමතර ව පාඨමාලා මාධ්‍යය හා විශ්වවිද්‍යාලය තෝරා ගැනීමේ දී අවශ්‍ය වෙනත් සුදුසුකම් හා අනෙකුත් තොරතුරු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වාර්ෂිකව නිකුත් කරනු ලබන "**ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය**" නම් ග්‍රන්ථය පරිශීලනය කළ යුතු ය.

ඉදිරියේ දී යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුව මෙම චක්‍රලේඛයේ වගන්ති ද සංශෝධනය විය හැකිය.

ඩබ්ලිව්. එම්. බන්දුසේන,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

පිටපත් :-

1. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති
2. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති
4. විගණකාධිපති
5. විභාග කොමසාරිස් ජනරාල්
6. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
7. අධ්‍යාපන අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන්
8. රජයේ හා රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ප්‍රධානීන්

## ඇමුණුම 02


දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

| | | |
|---|---|---|
| අමාත්‍යතුමා<br>அமைச்சர்<br>Minister | } | 2784832<br>2784807<br>2785617 |
| ලේකම්<br>செயலாளர்<br>Secretary | | 2784812 |
| කාර්යාලය<br>அலுவலகம்<br>Office | } | 2785141-50<br>**Fax**: 2784846 |

ඊ මේල්/ஈ–மெயில்/E-mail : isurupaya@moe.gov.lk

எமது இல.

ඔබේ අංකය<br>உமது இல.<br>Your No. } ..............................

අධ්‍යාපන අමාත්‍යාංශය

**கல்விஅமைச்சு**

**Ministry of Education**

'ඉසුරුපාය' ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ,
බත්තරමුල්ල.
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுரகோட்டை
பத்தரமுல்ல
"Isurupaya", SriJayawardhanapuraKotte
Battaramulla.
පාසල් කටයුතු ශාඛාව


මගේ අංකය<br>My No. } ED/01/12/12/05/08

දිනය<br>திகதி<br>Date } 2017.06.01

**චක්‍රලේඛ අංක - 23/2017**

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
විදුහල්පතිවරුන්, පරිවේණාධිපතිවරුන් සහ රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ප්‍රධානීන් වෙත,

### <u>පාසල පදනම් කර ගත් තක්සේරුකරණය 6 – 13 ශ්‍රේණි සඳහා වර්ෂ 2017 සහ ඉන් ඉදිරියට ක්‍රියාත්මක කිරීම</u>

අධ්‍යාපනයේ නවීකරණ සහ කාලීන ප්‍රවණතා පාදක කර ගනිමින් වඩාත් ඵලදායී ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය බලගැන්වීම අරමුණු කොට පාසල පදනම් කර ගත් තක්සේරුකරණය වර්ෂ 2017 සිට නව මුහුණුවරකින් පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. මෙම වැඩපිළිවෙළ සැලසුම් කිරීම, සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම පාසල් මඟින් සිදු කරන අතර මෙහෙයවීම හා අධීක්ෂණය අධ්‍යාපන අමාත්‍යාංශයේ මූලිකත්වය ඇති ව ජාතික අධ්‍යාපන ආයතනය, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු විසින් ඉටු කෙරෙනු ඇත.

2.0 ඒ අනුව, 6-13 ශ්‍රේණිවල පාසල පදනම් කරගත් තක්සේරුකරණ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම සම්බන්ධව, අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය සහ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් වරින් වර මේ දක්වා නිකුත් කර ඇති සියලු ම චක්‍රලේඛ අභිබවා 2017.06.01 දින සිට පාසල පදනම් කර ගත් තක්සේරුකරණ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව මෙම චක්‍රලේඛයේ විධිවිධාන බලපැවැත් වේ. ඒ අනුව 2017 වසරේ පැවැත්වෙන අ.පො.ස. (උ.පෙළ) විභාගයේ සහ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ සිටම මෙම නව චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුව කටයුතු කළ යුතු ය.

3.0 පාසල පදනම් කරගත් තක්සේරුකරණය සම්බන්ධව මේ සමඟ නිකුත් කරන මූලික උපදෙස් සංග්‍රහයට අමතරව වැඩිදුරටත් 6-9 ශ්‍රේණිවලට අදාළ උපදෙස් ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද, 10-13 ශ්‍රේණිවලට අදාළ උපදෙස් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් ද, ඉදිරියේ දී නිකුත් කරනු ඇත. තව ද මෙම වැඩපිළිවෙලට අදාළ පුහුණු කටයුතු සිදුකිරීමට හා නියාමනය කිරීමට අදාළ

සියලු කටයුතු අධ්‍යාපන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු ඒකාබද්ධව සිදු කරනු ඇත.

## 4.0 ක්‍රියාත්මක කිරීම

6 ශ්‍රේණියේ සිට 13 වන ශ්‍රේණිය දක්වා සියලු ම ශ්‍රේණිවල උගන්වනු ලබන සියලු ම විෂයයන් සඳහා මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කළ යුතු ය.

6 සිට 13 දක්වා ශ්‍රේණිවල දී සිසුන් ඉගෙනුම ලබන සෑම විෂයයක් සඳහා ම පාසල් වාරයකට එක් තක්සේරුකරණ අවස්ථාවක් බැගින් ක්‍රියාත්මක කිරීම අනිවාර්ය වේ. මෙම තක්සේරුකරණ වැඩපිළිවෙළ සිසුන්ගේ පවතින ඉගෙනුම් හැකියා මට්ටම් හඳුනාගෙන ඔවුන්ට අපේක්ෂිත නිපුණතා මට්ටම් අත්පත් කරගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දීම පෙරදැරිව ක්‍රියාත්මක කරනු ලබන බැවින් ගුරුවරයාගේ අභිමතය අනුව ඊට වඩා වැඩි තක්සේරුකරණ අවස්ථා ගණනක් වුව ද ක්‍රියාත්මක කළ හැකි ය.

## 5.0 සහතිකකරණය සඳහා අදාළ කර ගන්නා තක්සේරුකරණ අවස්ථා සංඛ්‍යාව:

### 5.1. පාසල පදනම් කරගත් තක්සේරුකරණ වැඩපිළිවෙළ 6-9 තෙක් ශ්‍රේණි
(වසර අවසාන ප්‍රගති වාර්තාවේ සඳහන් කිරීම සඳහා)

| විෂයය | නිපුණතා මට්ටම තීරණය කිරීම සඳහා **එක් වාරයක් තුළ** අදාළ කර ගන්නා තක්සේරුකරණ අවස්ථා සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | 6 ශ්‍රේණිය | 7 ශ්‍රේණිය | 8 ශ්‍රේණිය | 9 ශ්‍රේණිය |
| ආගම (බුද්ධ ධර්මය/ශෛවනරි/කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය/ ඉස්ලාම්) | 1 | 1 | 1 | 1 |
| සිංහල භාෂාව / දෙමළ භාෂාව | 1 | 1 | 1 | 1 |
| ඉංග්‍රීසි | 1 | 1 | 1 | 1 |
| ගණිතය | 1 | 1 | 1 | 1 |
| විද්‍යාව | 1 | 1 | 1 | 1 |
| ඉතිහාසය | 1 | 1 | 1 | 1 |
| භූගෝල විද්‍යාව | 1 | 1 | 1 | 1 |
| ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය | 1 | 1 | 1 | 1 |
| සෞන්දර්ය විෂයයන් | 1 | 1 | 1 | 1 |
| ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා | 1 | 1 | 1 | 1 |
| සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | 1 | 1 | 1 | 1 |
| දෙවන භාෂාව ලෙස සිංහල/ දෙමළ | 1 | 1 | 1 | 1 |

### 5.2 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ සහතිකකරණය සඳහා

10 වන ශ්‍රේණියේ පළමුවන වාරය, දෙවන වාරය සහ තුන්වන වාරයත් 11 වන ශ්‍රේණියේ පළමුවන සහ දෙවන වාරයත් යන වාර 5ක තක්සේරුකරණ ලකුණු, නිපුණතා මට්ටම් තීරණය කිරීම සඳහා යොදා ගනු ලැබේ.

එක් එක් විෂය සඳහා එක් වාරයක් තුළ කළ යුතු තක්සේරුකරණ අවස්ථා සංඛ්‍යාව සහ අ.පො.ස. (සා.පෙළ) නිපුණතා මට්ටම තීරණය කිරීම සඳහා 10 සහ 11 ශ්‍රේණිවලින් ලබා ගන්නා තක්සේරුකරණ අවස්ථා සංඛ්‍යාව පහත වගුවේ දැක් වේ.

| විෂයය | අ.පො.ස.(සා.පෙළ) නිපුණතා මට්ටම තීරණය කිරීම සඳහා **එක් වාරයක්** තුළ අදාළ කර ගන්නා තක්සේරුකරණ අවස්ථා සංඛ්‍යාව | අ.පො.ස.(සා.පෙළ) නිපුණතා මට්ටම තීරණය කිරීම සඳහා **10 හා 11 ශ්‍රේණිවලින්** ලබා ගන්නා **මුළු** තක්සේරුකරණ අවස්ථා සංඛ්‍යාව |
|---|---|---|
| ආගම | 1 | 5 |
| පළමුවන භාෂාව සහ | 1 | 5 |
| ඉංග්‍රීසි භාෂාව | 1 | 5 |
| ගණිතය | 1 | 5 |
| විද්‍යාව | 1 | 5 |
| ඉතිහාසය | 1 | 5 |
| කාණ්ඩ විෂයය 1 | 1 | 5 |
| කාණ්ඩ විෂයය 2 | 1 | 5 |
| කාණ්ඩ විෂයය 3 | 1 | 5 |

**5.3 අ.පො.ස. (උ.පෙළ) විභාගයේ සහතිකකරණය සඳහා**

12 වන ශ්‍රේණියේ පළමුවන වාරය, දෙවන වාරය සහ තුන්වන වාරයත් 13 වන ශ්‍රේණියේ පළමුවන සහ දෙවන වාරයත් යන වාර 5ක තක්සේරුකරණ ලකුණු හා කණ්ඩායම් ව්‍යාපෘති ලකුණු, නිපුණතා මට්ටම තීරණය කිරීම සඳහා යොදා ගනු ලැබේ.

එක් එක් විෂය සඳහා එක් වාරයක් තුළ සිදු කළ යුතු තක්සේරුකරණ අවස්ථා සංඛ්‍යාව සහ අ.පො.ස. (උ.පෙළ) නිපුණතා මට්ටම තීරණය කිරීම සඳහා 12 සහ 13 ශ්‍රේණිවලින් ලබා ගන්නා තක්සේරුකරණ අවස්ථා සංඛ්‍යාව පහත වගුවේ දැක් වේ.

| විෂයය | අ.පො.ස. (උ.පෙළ) නිපුණතා මට්ටම තීරණය කිරීම සඳහා **එක් වාරයක්** තුළ එක් එක් විෂය සඳහා අදාළ කර ගන්නා තක්සේරුකරණ අවස්ථා සංඛ්‍යාව | අ.පො.ස. (උ.පෙළ) නිපුණතා මට්ටම තීරණය කිරීම සඳහා **12 හා 13 ශ්‍රේණිවලින්** ලබා ගන්නා **මුළු** තක්සේරුකරණ අවස්ථා සංඛ්‍යාව |
|---|---|---|
| සියලු ම විෂයයන් | 1 | 5 |
| කණ්ඩායම් ව්‍යාපෘති | - | 1 |

මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව වැඩිදුර උපදෙස් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේ දී නිකුත් කරනු ලබන අතර එම උපදෙස් අනුව මෙම වැඩපිළිවෙළ සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියලු පියවර ඔබ විසින් ගත යුතු ය.

**6.0 අ.පො.ස. (උ.පෙළ) පන්තිවලට ඇතුළත් වීම සඳහා සාමාන්‍ය සුදුසුකම් යටතේ පාසල පදනම් කර ගත් තක්සේරුකරණ නිපුණතා මට්ටම් යොදා ගැනීම.**

2008/17 දරණ චක්‍රලේඛයෙහි 2.1 උපඡේදය හා 2.3 උපඡේදය යටතෙහි දැක්වෙන පරිදි අ.පො.ස. (උ.පෙළ) පන්තිවලට ඇතුළත්වීම සඳහා අවශ්‍ය වන සාමාන්‍ය සුදුසුකම් අවශ්‍යතාව සපුරාලීම සඳහා අ.පො.ස. (සා.පෙළ) ලිඛිත පරීක්ෂණයේ දී විෂයයන් 03 කට අවශ්‍ය සම්මාන සාමාර්ථ තුනෙන් එකක් ලබා නොමැති අවස්ථාවක දී පමණක් අ.පො.ස. (සා.පෙළ) ලිඛිත පරීක්ෂණයෙන් අදාළ විෂයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා ඇත්නම් සහ

එම විෂයටම පාසල පදනම්කර ගත් තක්සේරුකරණ වැඩපිළිවෙළ යටතේ සම්මාන හෝ ඊට ඉහළ නිපුණතා මට්ටමක් ලබා ඇත්නම්, එය එක් සම්මාන සාමාර්ථයක් ලෙස සලකනු ලැබේ. එහෙත් මෙය මාධ්‍ය භාෂාව හා ගණිතය විෂයයන් සඳහා අදාළ කරගත නොහැක. අ.පො.ස.(සා.පෙළ) විභාගයට දෙවන වරට පෙනී සිට සම්මානයක අවශ්‍යතාව සපුරා ගැනීමට නොහැකි වූ අයදුම්කරුවකුට එයට පෙර වතාවේ පාසල පදනම් කරගත් තක්සේරුකරණය යටතේ වන නිපුණතා මට්ටම් අදාළ පරිදි යොදා ගත හැකි ය.

## 7.0 නියාමනය :

මෙම වැඩපිළිවෙල නියාමනය කිරීම අභ්‍යන්තර හා බාහිර යන ක්‍රම දෙකටම සිදු කළ යුතු ය.

### 7.1. අභ්‍යන්තර නියාමනය

7.1.1 පාසල් මට්ටමේ නියාමනය :

විදුහල්පති , නියෝජ්‍ය විදුහල්පති (අධ්‍යාපන සංවර්ධන) සහ අංශ ප්‍රධානීන්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් මඟින් සිදු කෙරේ.

### 7.2. බාහිර නියාමනය

7.2.1. කලාප/කොට්ඨාස මට්ටමේ නියාමනය

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප විෂය භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ සහ ගුරු උපදේශකවරුන්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් මඟින් සිදු කෙරේ.

7.2.2. පළාත් මට්ටමේ නියාමනය

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විෂය භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ සහ ගුරු උපදේශකවරුන්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් මඟින් සිදු කෙරේ.

7.2.3. ජාතික මට්ටමේ නියාමනය

අධ්‍යාපන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හා ජාතික අධ්‍යාපන ආයතනය මඟින් සිදු කෙරේ.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් -:

1. සභාපති-ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
2. සියලුම අතිරේක ලේකම්වරුන්- අධ්‍යාපන අමාත්‍යාංශය
3. විභාග කොමසාරිස් ජනරාල් - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
4. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය
5. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
6. ප්‍රධාන කොමසාරිස් - ගුරු අධ්‍යාපන පරිපාලන හා විද්‍යාපීඨ ශාඛාව

ඇමුණුම **03**


දුරකථන අං./தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832 / 2784807 / **2785617**

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50 / **Fax: 2784846**

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

**අධ්‍යාපන අමාත්‍යාංශය**
**கல்வி அமைச்சு**
**Ministry of Education**
**'ඉසුරුපාය' ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ,**
බත්තරමුල්ල
'இசுருபாய' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.
පාසල් කටයුතු ශාඛාව


ඔබේ අංකය / உமது இல. / Your No } ..............................

මගේ අංකය / எமது இல. / My No. } ED/01/12/12/05/08/i

දිනය / திகதி / Date } 2017.10. 31

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
.............................. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
..........................................................................

**<u>අ.පො.ස(උ.පෙළ) විභාගයට ප්‍රථම වතාව සඳහා බාහිර අපේක්ෂකයෙකු ලෙස පෙනී සිටීමට බලාපොරොත්තු වන වයස අවුරුදු 21ට අඩු අයදුම්කරුවන් ව්‍යාපෘති හා ඇගයීම් සඳහා ලියාපදිංචි වීම</u>**

අ.පො.ස(උ.පෙළ) විභාගයට ප්‍රථම වතාව සඳහා බාහිර අපේක්ෂකයෙකු ලෙස පෙනී සිටීමට බලාපොරොත්තු වන වයස අවුරුදු 21ට අඩු අයදුම්කරුවන් ව්‍යාපෘති හා ඇගයීම් සඳහා ලියාපදිංචි වීමේ වැඩසටහන 2016 වර්ෂය දක්වා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු හරහා ක්‍රියාත්මක කර ඇත.

පාසල පදනම් කරගත් නව තක්සේරුකරණ වැඩපිළිවෙළ යටතේ එම බාහිර අයදුම්කරුවන් ලියාපදිංචි කිරීමේ වැඩසටහන තවදුරටත් ක්‍රියාත්මක නොවන බව කාරුණිකව දන්වමි.

ඒ අනුව උක්ත කාරණය පිළිබඳව අදාළ පාර්ශවයන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ද වැඩිදුරටත් දන්වමි.

එස්.යූ. විජේරත්න,
අතිරේක ලේකම් (ප්‍රතිපත්ති සැලසුම් හා කාර්යසාධන සමාලෝචන),
වැ.බ. අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන),
අධ්‍යාපන ලේකම් වෙනුවට.